ඉහළ විශ්වාසනීයත්වයක් උදෙසා

SLAASMB

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන
ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

# 2023
# වාර්ෂික
# වාර්තාව

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත මගින් සංස්ථාපනය කරන ලදී.

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ඉදිරිපත් කිරීමේදී හා විගණනය කිරීමේදී, ශ්‍රී ලංකා ගිණුම් හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට එකඟව ක්‍රියාකරන බවට අධීක්ෂණය කිරීම මණ්ඩලයේ කාර්යභාරය වේ. (58 පිටුව බලන්න)

# පටුන


මණ්ඩලයේ සාමාජිකයන්.....01
මණ්ඩලයේ සාමාජිකයන් 2023 දෙසැම්බර් 31 දිනට.....02
මණ්ඩලයේ නිරීක්ෂකයින් / ආරාධිතයන් 2023 දෙසැම්බර් 31 දිනට.....06
2023 වර්ෂය තුල මණ්ඩලය මගින් පත් කළ අනු කමිටු.....07
2023 වර්ෂය තුළදී මණ්ඩලයේ කාර්ය මණ්ඩලය.....08
මණ්ඩලයේ තාක්ෂණික කාර්ය මණ්ඩලය - 2023 දෙසැම්බර් 31 දිනට.....09
ක්‍රියාකාරකම් වාර්තාව - 2023.....10
2023 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම්.....19
2023 වර්ෂය තුළදී ලබා ගත් එකඟතා සහ නෛතික උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කරන ලද කරුණු.....21
2023 වර්ෂයේ විගණන පරීක්ෂණ වල සොයා ගැනීම්.....22
ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයෙහි කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා අනුගමනය කළ යුතු කෙටි කාලීන සහ මධ්‍ය කාලීන පියවර.....26
කාර්යසාධන ලකුණු පත.....28
2023 වර්ෂයේ දී සමාලෝචනය කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් (SBE) ලැයිස්තුව.....30
2023 වර්ෂයේ දී සමාලෝචනය කරන ලද, ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිරීක්ෂණ ලිපි නිකුත් කල නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් (SBE) ලැයිස්තුව.....33
2023 දෙසැම්බර් 31 දිනට විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ ලැයිස්තුගත සමාගම් සහ රාජ්‍ය අංශයේ ආයතන.....34
2023 වර්ෂය තුළදී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් සිදු කරන ලද ප්‍රමිති සකස් කිරීම හා බැදුණු ක්‍රියාකාරකම්.....35
විගණකාධිපති වාර්තාව.....36
2023 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවේ සඳහන් කර ඇති නිරීක්ෂණ පිළිබඳ වත්මන් තත්ත්වය......40
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය.....44
මූල්‍ය කාර්යසාධනය සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය.....45
ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය.....46
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.....47
මූල්‍ය ප්‍රකාශන වලට සටහන්.....48
කාර්යසාධනයේ දස වසරක සාරාංශය.....55
නිශ්චිත ව්‍යාපාරික ව්‍යයවසායන්.....57

# වාර්ෂික වාර්තාව - 2023

## මණ්ඩලයේ සාමාජිකයන්

| | | |
|---|---|---|
| **කේ එම් ඒ එන් දවුලගල මිය** *FCMA (UK), MBA (USJP) MSc in Financial and Business Economics (Essex)*<br>නියෝජ්‍ය අධිපතිනිය - ශ්‍රී ලංකා මහ බැංකුව | සභාපතිනිය | |
| **එස් දිසානායක** *LLM*, නීතිඥ<br>සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් | නිල බලයෙන් සාමාජික | |
| **ඩී ආර් එස් හපුආරච්චි**<br>දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්<br>*Masters in Taxation Policy and Management (Keio)*<br>*B.Com Sp. (Col.), Dip.in Prof.Diplomacy and World Affairs (SL)* | නිල බලයෙන් සාමාජික<br>(2023 අගෝස්තු 26 දින දක්වා) | |
| **සී මෙන්ඩිස් නීතිඥ**<br>අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව | නිල බලයෙන් සාමාජික | |
| **ඩබ් ඩබ් ජේ සී පෙරේරා**<br>*FCA, FCMA,B'Sc B.Admin (USJP),CFE*<br>හවුල්කරු - කේපීඑම්ජී | පත් කළ සාමාජික | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය |
| **එච් එම් ඒ ජයසිංහ** *FCA,FCMA,CIPFA*<br>හිටපු සභාපති - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය,<br>දේශීය කළමනාකරණ හවුල්කරු<br>ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගම | පත් කළ සාමාජික | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය |
| **එස් එම් එස් එස් බණ්ඩාර** *FCA,MBA (Col.), B.Sc (Acc. and Fin. Management& (USJP)*<br>ආසන්නතම හිටපු සභාපති<br>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය, හවුල්කරු<br>බී ආර් ද සිල්වා ඇන්ඩ් කම්පැණි | පත් කළ සාමාජික | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය |
| **පී ආර් ඒ අයි ගුණරත්න** *ACMA (UK), CGMA, ACCA Affiliate, Dip. in Banking and Fin., B.Sc. Eng. (Hons), MBA (UK)*<br>අධ්‍යක්ෂ, ආයතනික මූල්‍ය - සිනමන් හොටේල්ස් සහ රිසෝර්ට්ස්<br>අධ්‍යක්ෂ - වේක් අප් සෝන් (පෞද්) සමාගම | පත් කළ සාමාජික | එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ශ්‍රී ලංකා අංශය |
| **ආර් වී අමරසූරිය** *LLB (Hons.) (Col.), FCMA (UK), FCMA (SL), CGMA, AFGG Raisina Fellow, Attorney-at-Law*<br>ආසන්නතම හිටපු ලේකම් - ශ්‍රී ලංකා නීතිඥ සංගමය,<br>ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ හිටපු කොමිෂන් සභා සාමාජික, *LAWASIA* හි විධායක කමිටු සාමාජික | පත් කළ සාමාජික | ශ්‍රී ලංකා නීතිඥ සංගමය |
| **එම් පී අබේසේකර මිය** *FCMA (UK), CGMA, FCA, B.Sc (Hons.) (Col.), MBA (Col.), GSLID*<br>ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ -<br>කප්රුක හෝල්ඩිංග්ස් පීඑල්සී | පත් කළ සාමාජික | ලංකා වාණිජ මණ්ඩලය |
| **කේ කේ එස් ගුණවර්ධන** *BA (Hons.) Econ. Sp., Dip. in Hypermedia Eng. (Col.), Dip. in Multimedia Technology (Col.), PG Dip in Busi. and Fin. - ICA (SL)*<br>කළමනාකාර අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී -<br>ග්‍රැෆික් සිස්ටම්ස් (පෞද්) සමාගම | පත් කළ සාමාජික | ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය |
| **ඩබ් පී ආර් එච් ෆොන්සේකා** *FCA, SFIBs (SL), B.Sc Busi. Admin (Hons.) (USJP), PG Dip in Mgmt. (PIM), MBA (Ausi.)*<br>සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී -<br>ලංකා බැංකුව | පත් කළ සාමාජික | ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමය |
| **මහාචාර්ය ඒ ජයමහ** *FCA, PhD (USQ-Aus.), M.Com (UoK), B.Com (UoK)*<br>පීඨාධිපති - පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය | පත් කළ සාමාජික | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |
| **එම් ඩී ජී එල් පෙරේරා මිය** *FCA, MBA (Col.)* | මණ්ඩල ලේකම් | |

# මණ්ඩලයේ සාමාජිකයන්
2023 දෙසැම්බර් 31 දිනට



**කේ එම් ඒ එන් දවුලාගල මිය**
*FCMA (UK), MBA (USJP), MSc in Financial and Business Economics University of Essex UK*

මණ්ඩලයේ සභාපතිනිය වශයෙන් කටයුතු කරන දවුලාගල මහත්මිය ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිනියකි. ඇය ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය, විගණන, සංචිත කළමනාකරණ, නියාමන සහ අධීක්ෂණ, සාර්ව විචක්ෂණශීලිතා අධ්‍යයන, මානව සම්පත් කළමනාකරණ සහ අවදානම් කළමනාකරණ යන ක්ෂේත්‍රවලට අයත් විවිධ තනතුරුවල වසර 32 කට අධික සේවා කාලයක් සම්පූර්ණ කර ඇත.



**එස් දිසානායක**
*LLM, නීතිඥ*

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වන දිසානායක මහතා ශ්‍රී ලංකාවේ නීතිපති දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරන නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයෙකු වන අතර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ලෙස රාජකාරි භාර ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (PSC) විසින් වර්තමානයේ ඔහුව නිදහස් කර ඇත.

දිසානායක මහතා නීතිපති දෙපාර්තමේන්තුවේ අපරාධ සහ සිවිල් යන අංශ දෙකෙහිම පළපුරුද්ද ලබාගෙන ඇති අතර 2010-2011 කාලපරිච්ඡේදය තුළ දූෂණයට එරෙහි ටීජී ස්වාධීන කොමිෂන් සභාවේ අභිචෝදකවරයෙකු ලෙස සේවය කර ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සාමාජිකයෙකු ලෙස ද, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (SEC) කොමසාරිස්වරයෙකු ලෙස ද සේවය කරයි.



**ඩී ආර් එස් හපුආරච්චි**
*Masters in Taxation Policy and Management (Keio) B.Com (Sp) (Col), Dip. in Professional Diplomacy and World Affairs (SL)*

ලියාපදිංචිය, තක්සේරු කිරීම සහ එකතු කිරීම, බදු ප්‍රතිපත්තිය සහ ජාත්‍යන්තර කටයුතු, අර්ථ නිරූපණ සහ පැහැදිලි කිරීම් ඇතුළු බදු අනුකූලතා ක්‍රියාවලියට අදාළ ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය ලබා ඇති හපුආරච්චි මහතා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) සේවය කර වසර 36කට අධික පළපුරුද්දක් ලබාගෙන ඇත.

ඔහු 2002 - 2005 කාලපරිච්ඡේදය තුළ විදේශීය විශ්වවිද්‍යාල සඳහා බදුකරණය පිළිබඳ පර්යේෂණ පත්‍රිකා රාශියක් ප්‍රකාශයට පත් කර ඇත. බොහෝ සම්මාන ද ලබා ඇති හපුආරච්චි මහතා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලදී ලබා ගත් ඉහළ පෙළේ ජයග්‍රහණ වෙනුවෙන් ගෞරව පිරිනැමීම් ද ලබාගෙන ඇත.



**සී මෙන්ඩිස්**
*නීතිඥ*

මෙන්ඩිස් මහතා ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (SEC) අධ්‍යක්ෂ ජනරාල්වරයා වේ.

# මණ්ඩලයේ සාමාජිකයන්

2023 දෙසැම්බර් 31 දිනට



**ඩබ්ලිව් ඩබ්ලිව් ජේ සී පෙරේරා**

*FCA, FCMA, B.Sc. Business Administration (USJP), CFE*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) හිටපු සභාපතිවරයකු වන පෙරේරා මහතා ශ්‍රී ලංකාවේ කේපීඑම්ජී ආයතනයේ හවුල්කරුවකු වේ. ඔහු කේපීඑම්ජී ආයතනයේ අවදානම් උපදේශන සහ ව්‍යවහාරික සේවා අංශයේ ප්‍රධානියා ද වන අතර ඇමරිකා එක්සත් ජනපදයේ සහතිකලත් වංචා විමර්ශකයින්ගේ සංගමය මගින් පිළිගත් සහතිකලත් වංචා විමර්ශකයකු ද වේ.



**එච් එම් ඒ ජයසිංහ**

*FCA, FCMA, CIPFA*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හිටපු සභාපතිවරයා වන ජයසිංහ මහතා ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගමේ දේශීය කළමනාකරණ හවුල්කරුවකු වේ. ඔහු අර්නස්ට් ඇන්ඩ් යංග් සමාගමේ බැංකුකරණ සහ මූල්‍ය සේවා පරිච භාර සහතික කිරීමේ ප්‍රධානියා ද වේ.

ගිණුම්කරණය සහ විගණනය පිළිබඳ වසර 41ක පෘථුල පළපුරුද්දක් ලබා ඇති ජයසිංහ මහතා, දකුණු ආසියානු ගණකාධිකාරිවරුන්ගේ සම්මේලනයේ (SAFA) ගිණුම්කරණ ප්‍රමිත කමිටුවේ සභාපතිවරයා ලෙස ද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිත කමිටුවේ සභාපතිවරයා ලෙස ද කටයුතු කරයි. ඔහු වෙනත් ව්‍යවස්ථාපිත ආයතන, වෘත්තීය සංගම් සහ අධ්‍යාපන ආයතන බොහොමයක සාමාජිකයෙකු වශයෙන් ද සේවය කරයි. ජයසිංහ මහතා ලැයිස්තුගත සමාගම් කිහිපයක විගණන කමිටුවල උපදේශකවරයකු වශයෙන් ද කටයුතු කරයි.



**එස් එම් එස් එස් බණ්ඩාර**

*FCA, MBA (Colombo), B.Sc Accountancy and Financial Management (USJP)*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ වර්ෂය තුළ සභාපතිවරයාව සිටි බණ්ඩාර මහතා වරලත් ගණකාධිකාරීන් වන බී ආර් ද සිල්වා සහ සමාගමේ හවුල්කරුවකු වන අතර සහතික කිරීමේ සේවා සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ විශේෂඥයකු වශයෙන් කටයුතු කරමින් වසර 25කට අධික ප්‍රායෝගික පළපුරුද්දක් ද ලබාගෙන ඇත.

ඔහු ආසියා ශාන්තිකර ගණකාධිකාරී සම්මේලනයේ (CAPA) සහ දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) මණ්ඩල සාමාජිකයකු වශයෙන් ද කටයුතු කරයි. තවද, ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු ද වේ.



**පී ආර් ඒ අයි ගුණරත්න**

*ACMA (UK,) CGMA, ACCA Affiliate, Diploma in Banking and Finance, B.Sc. Engineering (Hons), MBA (UK)*

සිනමන් හොටෙල්ස් සහ රිසෝට්ස් ආයතනික මූල්‍ය අධ්‍යක්ෂක සහ ජෝන් කීල්ස් හෝල්ඩිංස් (පෞද්) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන ගුණරත්න මහතා ගිණුම්කරණ සහ මූල්‍ය ක්ෂේත්‍රවල වසර 12 කට අධික පළපුරුද්දක් ලබාගෙන ඇත. මීට පෙර ඔහු රීසස් එනර්ජි පොදු සමාගම, බ්‍රැන්ඩික්ස් සමාගම් සමූහයේ සහ කේපීඑම්ජී ආයතනයේ මූල්‍ය ප්‍රධානියා ලෙස සේවය කර ඇත. ඔහු ජාත්‍යන්තර සහතිකලත් වෘත්තීය ගණකාධිකාරීන්ගේ සංගමයේ මැදපෙරදිග, දකුණු ආසියානු සහ උතුරු අප්‍රිකානු කලාපීය උපදේශක මණ්ඩලවල සාමාජිකයෙකු වන අතර සීඅයිඑම්ඒ ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු වශයෙන් ද කටයුතු කරයි. ගුණරත්න මහතා ශ්‍රී ලංකාව, මියන්මාරය, වියට්නාමය, නයිජීරියාව සහ ආසියා ශාන්තිකර කලාපය ඇතුළු විවිධ භූගෝලීය කලාපවල සීඅයිඑම්ඒ ආයතනයේ දේශන පවත්වා ඇත.

# මණ්ඩලයේ සාමාජිකයන්

2023 දෙසැම්බර් 31 දිනට



**ආර් ටී අමරසූරිය**

*LL.B (Hons.) (Col), FCMA (UK), FCMA (SL), CGMA, AFGG Raisina Fellow, Attorney-at-Law*

අමරසූරිය මහතා අභියාචන නීතියේ මෙන්ම ව්‍යවස්ථාපිත සහ පොදු නීතියේ සියලු අංශවල විශේෂඥයකු වශයෙන් කටයුතු කරමින්, ශ්‍රී ලංකාවේ අභියාචන අධිකරණවල නිත්‍ය වෘත්තිකයෙකු වශයෙන් කටයුතු කරන අතර සිවිල්, ගිවිසුම්, වාණිජ, දේපළ, බදුකරණය, බැංකුකරණය, කම්කරු යන විවිධාංගිකරණය වූ ක්ෂේත්‍ර සහ විෂයයන්වල සහ නීතියේ අනෙකුත් ක්ෂේත්‍රවල විවිධ පරිචයන් ලබා ඇත.

අමරසූරිය මහතා 2013 වසරේ දී වයස අවුරුදු 40 ට අඩු ශ්‍රී ලංකාවේ වඩාත් කැපීපෙනෙන සීඅයිඑම්ඒ සාමාජිකයා වශයෙන් එක්සත් රාජධානියේ කළමණාකරන ගණකාධිකාරීන්ගේ වරළත් ආයතනයේ ශ්‍රී ලංකා අංශය (CIMA) මගින් පිරිනමන ලද සීඅයිඑම්ඒ කීර්තිමත් තරු රන් සම්මානයෙන් පිදුම් ලැබූ අතර 2021 වර්ෂයේ දී ද, LMD - CIMA පුරෝගාමියකු ලෙස ද නම් කරන ලදී.

අමරසූරිය මහතා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ ආසන්නතම හිටපු ලේකම් වශයෙන් කටයුතු කළ අතර කොළඹ විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමයේ සභාපති ලෙසද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නීති අධ්‍යයනය පිළිබඳ ස්ථාවර කමිටු සාමාජිකයකු වශයෙන් ද, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ නීති පීඨයේ උපදේශක මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් සහ ශ්‍රී ලංකා ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩල සාමාජිකයකු වශයෙන් ද කටයුතු කරයි. ඔහු ආසියා සහ ශාන්තිකර නීති සංගමයේ (LAWASIA) විධායක කමිටු සාමාජිකයකු ද වේ.

ඔහු ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (SEC) හිටපු කොමිෂන් සභා සාමාජිකයෙකු වන අතර ශ්‍රී ලංකා නීති අධ්‍යාපනය පිළිබඳ සංස්ථාපිත කවුන්සිලයේ හිටපු සාමාජිකයකු ද වේ.



**මනෝහාරි අබේසේකර**

*FCMA (UK), CGMA, FCA, B.Sc (Hons.) (Col), MBA (Col), GSLID*

කජ්රුක හෝල්ඩිංග්ස් පීඑල්සීහි ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරියක වන අබේසේකර මහත්මිය මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 21කට අධික පළපුරුද්දක් ලබාගෙන ඇත. මීට පෙර, ඇය ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සහ හේලීස් සමූහයේ ඇතැම් අනුබද්ධිත ආයතනවල අධ්‍යක්ෂවරියක් ලෙස සේවය කළාය. ඇය හේලීස් පීඑල්සී හි උපායමාර්ගික ව්‍යාපාර සංවර්ධන ප්‍රධානියා ද විය.

අබේසේකර මහත්මිය දකුණු ආසියාව නියෝජනය කරමින් CIMA UK Global Council හි සාමාජිකාවක් ලෙස කටයුතු කරන අතර ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ කවුන්සිල සාමාජිකාවක් ද වේ. අබේසේකර මහත්මිය 2019 වර්ෂයේ දී Fortune US රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ගෝලීය කාන්තා උපදේශන වැඩසටහන සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කළ අතර 2014 වර්ෂයේ දී ඇමරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් කීර්තිමත් ජාත්‍යන්තර අමුත්තන්ගේ නායකත්ව වැඩසටහන (IVLP) සඳහා ද ඇයව තෝරා ගන්නා ලදී.

අබේසේකර මහත්මිය 2015 වර්ෂයේ දී ආයතනික කළමනාකරණය හැදෑරීම සඳහා ජපානයේ විදේශීය තාක්ෂණික සහයෝගීතාව සහ තිරසාර හවුල්කාරිත්වයන් සඳහා වූ සංගමය (AOTS) වෙතින් ශිෂ්‍යත්වයක් ලබා තිබේ. ඇය කාන්තා නායකත්වය පිළිබඳ සම්මාන ද ලබා ඇති අතර කොළඹ විශ්වවිද්‍යාලයේ MBA වැඩසටහනට සහභාගී වී කණ්ඩායමේ විශිෂ්ටතමයා ලෙස ඉහළම සාමාර්ථයක් අත්පත් කරගෙන තිබේ.



**කේ කේ එස් ගුණවර්ධන**

*BA (Hons.) Economics Sp., Dip.in Hypermedia Engineering (Col), Dip.in Multimedia Technology (Col), PGDip in Business and Finance - ICA (SL)*

ග්‍රැපික් සිස්ටම්ස් (පෞද්) සමාගමේ සහ ග්‍රැපික් සිස්ටම්ස් ඉන්ටර්නැෂනල් (පෞද්) සමාගමේ සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ වන ගුණවර්ධන මහතා මුද්‍රණ කර්මාන්තය, තොරතුරු තාක්ෂණය, ගිණුම්කරණය සහ මූල්‍ය යන ක්ෂේත්‍රවල වසර 38කට අධික පළපුරුද්දක් ලබාගෙන ඇත.

වර්තමානයේ ගුණවර්ධන මහතා ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනයේ සභාපතිවරයා වන අතර ඔහු අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙළඳ තොරතුරු සහ ප්‍රවර්ධන උපදේශක කමිටුවේ සභාපතිවරයා ද වේ. එසේම ඔහු තවත් බොහෝ සමාගම් සහ සංගම්වල ද සේවය කරයි. ගුණවර්ධන මහතා 1999 සහ 2001 වර්ෂවල දී ශ්‍රී ලංකා ව්‍යවසායකයා යන සම්මානය ඇතුළුව සම්මාන රැසකින් පිදුම් ලබා තිබේ.

# මණ්ඩලයේ සාමාජිකයන්
2023 දෙසැම්බර් 31 දිනට



**ඩබ්ලිව් පී ආර් පී එච් ෆොන්සේකා**
*FCA, SFIBs(SL), B.Sc Business Administration (Hons.) (USJP), PGDip in Management (PIM), MBA (Ausi.)*

ෆොන්සේකා මහතා 2012 වසරේ සිට ලංකා බැංකුවේ ආයතනික කළමනාකාරීත්වයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරන අතර වර්තමානයේ බැංකුවේ සාමාන්‍යාධිකාරීවරයා ලෙස කටයුතු කරයි. ඔහු බැංකුකරණය පිළිබඳව දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් වසර 33කට අධික පළපුරුද්දක් ලබාගෙන ඇති අතර සිල්ලර ණය දීම, ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය, ජාත්‍යන්තර මෙහෙයුම් සහ භාණ්ඩාගාර සහ ආයෝජන යන ක්ෂේත්‍රවල විශේෂඥ දැනුමක් ලබාගෙන ඇති අතර මූල්‍ය කළමනාකරණය, මූල්‍ය වාර්තාකරණය සහ බැංකුකරණ ක්ෂේත්‍රයේ උපායමාර්ගික සැලසුම් පිළිබඳ විශේෂඥයෙකු ද වේ.

ෆොන්සේකා මහතා පෞද්ගලික අංශයේ මෙන්ම රාජ්‍ය අංශයේ බොහෝ ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලවල අධ්‍යක්ෂවරයකු ලෙස ද කටයුතු කරයි. එමෙන්ම ඔහු ඇතැම් සමාගම්වල විගණන කමිටු සභාපතිවරයා ලෙස වගකීම් දරයි.

ෆොන්සේකා මහතා ශ්‍රී ලංකා ගිණුම්කරණ කාර්මික ශිල්පීන්ගේ සංගමයේ (AAT Sri Lanka) පාලක මණ්ඩලයේ ආසන්නතම හිටපු සභාපතිවරයා ද වේ.



**මහාචාර්ය ඒ ජයමහ**
*FCA,PhD (USQ-Aus), M.Com (UoK), B.Com (UoK),*

කැලණිය විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණ අධ්‍යනාංශයේ ගණකාධිකරණය පිළිබඳ මහාචාර්යවරයා වන මහාචාර්ය ජයමහ කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයා ද වේ. ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ වසර 41කට අධික කාලයක් සේවය කර ඇති අතර එම විශ්වවිද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණ අධ්‍යනාංශයේ සහ ගණකාධිකරණ අධ්‍යනාංශයේ ප්‍රධානියා වශයෙන් ද සේවය කර ඇත. එමෙන්ම, මහාචාර්ය ජයමහ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති වැඩසටහනේ සම්බන්ධීකාරක ලෙස ද කටයුතු කර ඇත.

මහාචාර්ය ජයමහ මහතා 2010 වර්ෂයේ දී දර්ශනශූරි උපාධියෙන් ද පිදුම් ලැබීය. ඔහු ජයමහ පුෂ්පකුමාර සහ සමාගමේ වෘත්තිකයකු සහ පූර්වගාමී හවුල්කරුවෙකු ද වන අතර ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන පිළිබඳ ආයතනික සමාලෝචනයේ සමාලෝචකයකු ලෙස ද සිය සේවය ඉටු කරයි. ඔහු 2020 වර්ෂයේ සිට එච්ඩීඑෆ්සී බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද කටයුතු කරයි.

# මණ්ඩලයේ නිරීක්ෂකයින් / ආරාධිතයින්

2023 දෙසැම්බර් 31 දිනට

**සභාපති,**
**ව්‍යවස්ථාපිත විගණන ප්‍රමිත කමිටුව**



**ටී ජේ එස් රාජකාරිය**
*FCA, FCCA, FCMA, CGMA*

රාජකාරිය මහතා කේපීඑම්ජී ශ්‍රී ලංකා හි හවුල්කරුවෙකු වන අතර පොදු ගිණුම්කරණ පරිචයේ වසර 37කට අධික කාලයක් සේවයේ නිරතව සිටියි. ඔහු වර්තමානයේ කේපීඑම්ජී ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා වශයෙන් කටයුතු කරන අතර කේපීඑම්ජී ආයතනයේ මැද පෙරදිග සහ දකුණු ආසියානු කලාපයේ මූල්‍ය සේවා ප්‍රධානියා ලෙස ද කටයුතු කරයි. ශ්‍රී ලංකාව සඳහා විගණන පරිචයේ ප්‍රධානියා ලෙස ද අඛණ්ඩව කටයුතු කරන රාජකාරිය මහතා ඕමානය, ඩුබායි, මාලදිවයින සහ ලන්ඩනය ආදී විදේශ රටවල සේවය කර පළපුරුද්ද ලබාගෙන ඇත. ඔහු 2018 - 2020 කාලපරිච්ඡේදය තුළ ACCA ශ්‍රී ලංකා හි සභාපතිවරයා ලෙස ද කටයුතු කර ඇත.

රාජකාරිය මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යවස්ථාපිත විගණන ප්‍රමිත කමිටුවේ සභාපතිවරයා ලෙස කටයුතු කරන අතර ව්‍යවස්ථාපිත ගිණුම්කරණ ප්‍රමිත කමිටුවේ සාමාජිකයකු ද වේ. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ තවත් කමිටු සහ අංශ කිහිපයක සේවය කරමින් ප්‍රතිපත්ති සැකසීමේ දී සහ මඟපෙන්වීම් ලබා දීමේ දී ක්‍රියාකාරීව දායක වී ඇත.

**මණ්ඩලයේ නිරීක්ෂක,**
**භාණ්ඩාගාර නියෝජිත**



**කේ වී සී දිල්රුක්ෂි**
*B.Sc. (Accountancy and Financial Management), MBA, MBS*

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂධුරය දරන දිල්රුක්ෂි මහත්මියට රාජ්‍ය අංශයේ වසර 21කට වැඩි පළපුරුද්දක් ඇත. ඇය ජාතික සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කරයි.

**අධ්‍යක්ෂ ජනරාල්**



**ඒ අයි මොහොට්ටි**
*FCA, FCMA (UK), CGMA, MBA (Leicester), BBA (Hons.)(Col),*

ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ (ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.) අධ්‍යක්ෂ ජනරාල්වරිය වන මොහොට්ටි මහත්මිය මූල්‍ය හා ව්‍යාපාර කළමනාකරණය සහ විගණනය පිළිබඳව වසර 35කට අධික පළපුරුද්දක් ලබාගෙන ඇත. ඇය එම කාලයෙන් වසර 23කට අධික කාලයක් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන්නන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම නියාමනය කිරීමේ කටයුතු සහ එහි විගණකවරු විගණන ප්‍රමිතීන්ට අනුකූලව විගණනය කිරීම නියාමනය කිරීමේ කටයුතුවල නිරත වී ඇත. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම යේ නියාමන කණ්ඩායමේ සාමාජිකාවක වීමට පෙර, ඇය කාසන්ස් සමූහ සමාගමේ සහ අර්න්ස් සහ යං සමාගමේ සේවය කර ඇත.

# 2023 වර්ෂය තුළදී මණ්ඩලය මගින් පත් කළ අනු කමිටු

### විගණන කමිටුව

එස් එම් එස් එස් බණ්ඩාර මයා - සභාපති
මහාචාර්ය ඒ ජයමහ - සාමාජික
ඩබ්ලිව් එච් ඒ විමලජීව මිය - සාමාජික (2023 පෙබරවාරි 27 දක්වා)
කේ වී සී දිල්රුක්ෂි මිය - සාමාජික (2023 මාර්තු 21 සිට ක්‍රියාත්මක වන පරිදි)
එල් ඩී ආර් එල් ලියනගේ මිය - විගණකාධිපතිවරයාගේ නියෝජිත - නිරීක්ෂක
සාමාජික නොවන ලේකම් - එච් බී රසාක් මිය (නියෝජ්‍ය අධ්‍යක්‍ෂක ජනරාල්)

### පාරිශ්‍රමික කමිටුව

කේ එම් ඒ එන් දවුලාගල මිය - සභාපතිනි
එම් පී අබේසේකර මිය - සාමාජික
ආර් ටී අමරසූරිය මයා - සාමාජික
පී ආර් ඒ අයි ගුණරත්න මයා - සාමාජික
ඩබ්ලිව් පී ආර් පී එච් ෆොන්සේකා මයා - සාමාජික
මනිල් ජයසිංහ මයා - සභාපතිනියගේ ආරාධනයෙන් සහභාගි විය
එස් දිසානායක මයා - සභාපතිනියගේ ආරාධනයෙන් සහභාගී විය
එස් එම් එස් එස් බණ්ඩාර මයා - සභාපතිනියගේ ආරාධනයෙන් සහභාගී විය
ඩබ්ලිව් එච් ඒ විමලජීව මිය - සාමාජික (2023 පෙබරවාරි 27 දක්වා)
කේ වී සී දිල්රුක්ෂි මිය - සාමාජික (2023 මාර්තු 21 සිට ක්‍රියාත්මක වන පරිදි)
සාමාජික නොවන ලේකම් - ඒ අයි මොහොට්ටි මිය (අධ්‍යක්ෂ ජනරාල්)

### තාක්ෂණ අනු කමිටුව

එම් පී අබේසේකර මිය - සභාපතිනි
ඩබ් පී ආර් පී එච් ෆොන්සේකා මයා - සාමාජික
එච් එම් ඒ ජයසිංහ මයා - සාමාජික
මහාචාර්ය ඒ ජයමහ - සාමාජික
සී මෙන්ඩිස් මයා - සාමාජික
සාමාජික නොවන ලේකම් - එම් එල් හේවගේ මිය, අධ්‍යක්ෂ තාක්ෂණ (2023 ජූනි 27 දක්වා)
සාමාජික නොවන ලේකම් - එච් බී රසාක් මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (2023 ජූනි 28 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

### තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව

පී ආර් ඒ අයි ගුණරත්න මයා - සභාපති
ඩබ්ලිව් ඩබ්ලිව් ජේ සී පෙරේරා මයා - සාමාජික
එස් දිසානායක මයා - සාමාජික
කේ කේ එස් ගුණවර්ධන මයා - සාමාජික
ඒ අයි මොහොට්ටි මිය (අධ්‍යක්ෂ ජනරාල්) - සාමාජික
සාමාජික නොවන ලේකම් - අයි ඊ ඉද්දමල්ගොඩ මිය, අධ්‍යක්ෂ අධීක්ෂණ (2023 නොවැම්බර් 01 දක්වා)
සාමාජික නොවන ලේකම් - ඩී එම් මෙන්මෙන්ද්‍රආරච්චි මිය (2023 නොවැම්බර් 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

### ගැටුම් විසඳීමේ කමිටුව


සී මෙන්ඩිස් මයා - සභාපති
එස් දිසානායක මයා - සාමාජික
ආර් ටී අමරසූරිය මයා - සාමාජික
ඩී ආර් එස් හපුආරච්චි මයා - සාමාජික (2023 අගෝස්තු 26 දක්වා)
ඩබ්ලිව් පී ආර් පී එච් ෆොන්සේකා මයා - සාමාජික
සාමාජික නොවන ලේකම් - ඒ අහමත් මිය (නියෝජ්‍ය අධ්‍යක්‍ෂක ජනරාල්)

### පනත් සංශෝධන කමිටුව

ආර් ටී අමරසූරිය මයා - සාමාජික
එස් දිසානායක මයා - සාමාජික
එච් එම් ඒ ජයසිංහ මයා - සාමාජික
එස් එම් එස් එස් බණ්ඩාර මයා - සාමාජික
සාමාජික නොවන ලේකම් - එච් බී රසාක් මිය (නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්)

# 2023 වර්ෂය තුළදී මණ්ඩලයේ කාර්ය මණ්ඩලය






1. කේ සිවකුමාර්
   (2023 ජූලි 21 දක්වා)
2. ආශා අහමත් මිය
3. අනුෂා අයි මොහොට්ටි මිය
4. හෆ්සා බී රසාක් මිය
5. එම් ලක්මාලි හේවගේ මිය
   (2023 ජූනි 27 දක්වා)
6. හිරන්ති ජයවීර මිය
7. ඉමල්කා ඉද්දමල්ගොඩ මිය
   (2023 නොවැම්බර් 01 දක්වා)
8. කේ. රසික එස් බණ්ඩාර
9. දුමින්දා කේ ගුරුවත්ත මිය
10. එච් එස් යූ පී ජයවර්ධන
   (2023 මැයි 19 දක්වා)
11. ඩී එම් නිලන්ති පී දන්දෙණි මිය
   (2023 සැප්තැම්බර් 01 දක්වා)
12. කලණි හෙට්ටිආරච්චි මිය
13. එෆ් ශිරෝමි අබේකෝන් මිය
14. දිලිනිකා එම්. මෙන්මෙන්දආරච්චි මිය
15. එල් වත්සලා මල්ලවාරච්චි මිය
   (2023 ජූනි 27 දක්වා)

## මණ්ඩලයේ තාක්ෂණික කාර්ය මණ්ඩලය - 2023 දෙසැම්බර් 31 දිනට

**අනූෂා අයි මොහොට්ටි මිය**
*FCA, FCMA (UK), CGMA, MBA (Leicester), BBA (Hons.)(Col),*
*අධ්‍යක්ෂ ජනරාල්*

**ආශා අහමත් මිය**
*FCA, MBA (Col)*
*නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්*

**හර්ෂා බී රසාක් මිය**
*FCA, ACMA (UK), CGMA, MBA (USJP)*
*නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්*

**දිලිනිකා එම් මෙන්මෙන්දආරච්චි මිය**
*FCA, ACCA, B.Sc Accounting Sp (Hons.) (USJP)*
*අධ්‍යක්ෂ අධීක්ෂණ*

**එච් ඒ කලණි එස් හෙට්ටිආරච්චි මිය**
*FCA, B.Sc Accounting Sp (Hons.) (USJP)*
*අධ්‍යක්ෂ අධීක්ෂණ*

# ක්‍රියාකාරකම් වාර්තාව - 2023

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (ශ්‍රී ල.ගි.වි.ප්‍ර.ස.ම.) 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනත යටතේ නියාමන ආයතනයක් වශයෙන් ස්ථාපනය කරන ලද අතර එහි ක්‍රියාකාරී මෙහෙයුම් 2000 වර්ෂයේ දී ආරම්භ විය. පනත මගින් ඇතැම් ආයතන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් (SBE) ලෙස නිර්වචනය කරනු ලබන අතර (නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගේ නිර්වචනය සඳහා 57 පිටුව බලන්න) එවැනි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය සිය මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLASs) අනුකූල විය යුතුය. මෙම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායවල විගණන කටයුතු සිදු කරන විට, ඔවුන්ගේ විගණකවරුන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAUs) අනුකූලව කටයුතු කළ යුතුය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූල වීම පිළිබඳව අධීක්ෂණය කිරීමට ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයට හැකි වන පරිදි එකී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය විසින් විගණනය කරන ලද ඔවුන්ගේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ල.ගි.වි.ප්‍ර.ස.ම. වෙත ඉදිරිපත් කළ යුතු බවට පනත මගින් නියම කර ඇත.

ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් ලැබුණු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි විගණන කටයුතු පිළිබඳව පරීක්ෂා කිරීම, ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු නොකිරීම පිළිබඳ විමර්ශන පැවැත්වීම සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ ඔවුන්ගේ විගණකවරුන් විසින් ප්‍රමිතීන්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් යෝග්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම මගින් සිය කාර්යයන් ඉටු කරනු ලබයි. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනත යටතේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාශයට පත් කිරීම හෝ සම්මත කිරීම සිදු කරනු ලැබේ. එවැනි ප්‍රමිතීන් සම්මත කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට නිර්දේශ ඉදිරිපත් කිරීම සහ සහාය වීම සඳහා පනත යටතේ ගිණුම්කරණ ප්‍රමිති කමිටුවක් සහ විගණන ප්‍රමිති කමිටුවක් ස්ථාපනය කර ඇත. ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය (IASB) මගින් ප්‍රකාශයට පත් කරන ලද ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති (IASs) සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRSs) මත පදනම්ව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ගිණුම්කරණ ප්‍රමිති සකස් කරනු ලබයි. එසේම සකස් කරන ලද විගණන ප්‍රමිතීන් ජාත්‍යන්තර විගණන සහ තහවුරු කිරීමේ ප්‍රමිති මණ්ඩලය (IAASB) විසින් සකස් කරන ලද ජාත්‍යන්තර විගණන ප්‍රමිති (ISAs) මත පදනම් වේ. වර්තමානයේ වරලත් ගණකාධිකාරී ආයතනය විසින් එකී ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් සහ ඔවුන්ගේ විගණකවරුන් විසින් අනුගමනය කළ යුතු ගිණුම්කරණ ප්‍රමිති 41ක් සහ විගණන ප්‍රමිති 38ක් සම්මත කර ඇත.

## 2. මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය

### 2.1. සමාලෝචන සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන බවට වග බලා ගැනීම සඳහා ශ්‍රී ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරයි. ඒ අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල හඳුනාගැනීම් සහ ඇගයීමේ අවශ්‍යතා මෙන්ම ඉදිරිපත් කිරීමේ සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරයි. ප්‍රමිතීන්ට අනුකූල නොවීම් සම්බන්ධයෙන් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. ට අනාවරණය වූ අවස්ථාවල අනුකූල නොවීමෙහි පවතින ප්‍රමාණවත් බව මත පදනම්ව කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව, ප්‍රමිතීන්ට ප්‍රමාණාත්මකව අනුකූල නොවීම සම්බන්ධව අවධානය යොමු කිරීමට තරම් හේතුවක් නිරීක්ෂණය නොවූ අවස්ථාවල, එම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල ලෙස සලකනු ලැබේ. මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක වන නමුත්, ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන භාවිතා කිරීමට තරම් අවශ්‍ය නොවන ගැටලු හඳුනාගෙන ඇති අවස්ථාවල, එම මූල්‍ය ප්‍රකාශන නිරීක්ෂණවලට අනුකූල යැයි සලකනු ලබන අතර අනාගතයේ දී අනුකූලතාව වැඩිදියුණු කිරීම සඳහා මෙම සොයා ගැනීම් ආධාර ලිපියක් ආකාරයෙන් අදාළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය වෙත දැනුම් දෙනු ලැබේ.

ප්‍රමිතීන්ගෙන් බැහැරවීම් මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය ප්‍රමාණාත්මකව වෙනස් කරන අවස්ථා වලදී, නිකුත් කිරීමට නියමිත ඊළඟ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. එවැනි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය වෙතින් වගකීමක් අපේක්ෂා කරයි. මෙම ක්‍රියාවලියේදී, අපේක්ෂා කළ හැකි වැඩිදියුණු කිරීම් නොමැතිව අනුකූල නොවීම නැවත නැවත සිදුවන ස්වභාවයක් ඇති අවස්ථාවල දී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් එවැනි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය වෙත අනුකූල නොවීම පිළිබඳ අනතුරු ඇඟවීමක් (Warning) සහ අනාගතයේදී ඔවුන්ගේ මූල්‍ය වාර්තාකරණය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය දන්වා ලිපියක් නිකුත් කරයි.

බැහැරවීම් ව්‍යවස්ථාවේ විධිවිධානවලට පටහැනි වන නමුත්, එම උල්ලංඝනය කිරීම බරපතල ස්වභාවයේ නොමැති අවස්ථාවල දී, මණ්ඩලය විසින් නිවැරදි කිරීම් කරවීමට නියෝගයක් නිකුත් කරනු ලබයි. කෙසේ වුවද, එවැනි බැහැරවීම් මගින් මූල්‍ය ප්‍රකාශනවල නොමඟ යවන සුළු තත්ත්වයක් ඇති වන අවස්ථාවල, ව්‍යවස්ථාව මත පදනම්ව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

### 2.2. මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේ විශේෂ අවස්ථා

1995 අංක 15 පනත යටතේ නිරීක්ෂණය කළ යුතු, පනත මගින් දක්වා ඇති නිර්ණායක සපුරා ඇති නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ලෙස හඳුන්වනු ලබන ආයතන 1707ක් 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. මගින් හඳුනාගෙන ඇත. ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විසින් පෙර වර්ෂවලට අදාළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම හේතුවෙන් මෙම වර්ෂය තුළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 1,566ක් මගින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 1,732ක් ඉදිරිපත් කර තිබුණි. ඉකුත් වර්ෂය තුළ, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් 1,564ක් විසින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 1,738ක් ශ්‍රී ල.ගි.වි.ප්‍ර.ස.ම. වෙත ඉදිරිපත් කර තිබුණි.

සංශෝධිත සැලැස්මට අනුව, වසර තුළ සමාලෝචනය කිරීමට සැලසුම් කර ඇති මූල්‍ය ප්‍රකාශන කට්ටල 252 හා සසඳන විට, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 261කට අදාළ මූල්‍ය ප්‍රකාශන කට්ටල 261ක සමාලෝචන සම්පූර්ණ කරන ලදී. සංසන්දනාත්මකව සලකා බැලීමේ දී, ශ්‍රී ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් 2022 වර්ෂය තුළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 534කට අදාළ මූල්‍ය ප්‍රකාශන කට්ටල 541ක් සමාලෝචනය කර තිබුණි. ඉල්ලා අස්වීම හා උසස් කිරීමක් හේතුවෙන් වසර අවසානයේ පරීක්ෂණ කාර්ය මණ්ඩලය 83%කින් අඩුවීම සහ වැටුප් සීමාවන් හේතුවෙන් වෘත්තීය කාර්ය මණ්ඩලය ආකර්ෂණය කර ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් පරීක්ෂණ කාර්ය මණ්ඩල සංඛ්‍යාව අඩු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද සමාලෝචන සංඛ්‍යාවෙහි කැපී පෙනෙන අඩුවීමක් සිදු විය.

# ක්‍රියාකාරකම් වාර්තාව - 2023

මූල්‍ය ප්‍රකාශන සමාලෝචන වඩාත් ඵලදායි ලෙස ආවරණය කිරීමට පහසුකම් සැලසීම සඳහා මෙන්ම ගෝලීය මනා භාවිතයන් සමඟ පෙළගැස්වීම සඳහා විදේශ උපදේශකයෙකු විසින් අතීතයේ දී කරන ලද නිර්දේශ මත පදනම්ව, ශ්‍රී ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් ප්‍රවර්තන වර්ෂය තුළ ද, සමාලෝචනය සඳහා මූල්‍ය ප්‍රකාශන තෝරා ගැනීමේ මිශ්‍ර ආකෘතියක් අනුගමනය කරමින් සමාලෝචන පවත්වන ලදී. එහි දී අවදානම් පාදක ප්‍රවේශයක්, අහඹු සහ මාරුවෙන් මාරුවට යොදාගන්නා ප්‍රවේශයන් ඒකාබද්ධ කරමින් එම ක්‍රියාවලිය සිදු කරන ලදි. ඉහත සඳහන් වාර්තා තෝරාගැනීමේ දී, අධි අවදානම් සහිත ආයතන තෝරා ගැනීමට තීරණය කරන අවස්ථාවේදී, ආයතනවල මහජන වගවීම පිළිබඳව ද සලකා බලන ලදි. එමඟින්, කලින් සඳහන් කළ පරිදි, සම්පූර්ණ කරන ලද සමාලෝචනවලින් 71% ක්, නියාමනය කරන ලද ආයතනවල සමාලෝචනවලින් සමන්විත වූ අතර ඉතිරිය ආර්ථික වශයෙන් වැදගත් පෞද්ගලික ආයතන නියෝජනය විය. සමාලෝචනය කරන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායවල මෙම සංයුතිය මගින් සැලසුම් කර ඇති පරිදි අවුරුදු 3-5 චක්‍රය තුළ ආවරණය කළ යුතු පුද්ගලික ආයතනවල මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයට බඳුන් කිරීමට අපේක්ෂා කෙරේ.

අවදානම් මත පදනම් වූ ප්‍රවේශය යටතේ වූ සමාලෝචන කර්මාන්තය කේන්ද්‍ර කර ගත් අවදානම් නිර්ණායක මත පදනම්ව කලින් තීරණය කරන ලද තේමා මත සිදු කරන ලදී. ඉහත සඳහන් තේමා කේන්ද්‍රීය සමාලෝචන ප්‍රවේශය මඟින් කාර්ය මණ්ඩලයට උසස් තත්ත්වයේ ආයතනික වාර්තාකරණයක් සඳහා වැදගත් වන අංශ හඳුනා ගැනීමට මග පෑදූ ප්‍රමිතිවල නිශ්චිත අංශ පිළිබඳ වඩාත් ගැඹුරින් අවධානය යොමු කිරීමට හැකි විය.

වසර තුළ ශ්‍රී ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් අවධානය යොමු කරන ලද ප්‍රධාන තේමාවන් අතරට දේපළ, පිරියත සහ උපකරණවල හානිකරණය සම්බන්ධයෙන් හඳුනා ගැනීම, මැනීම සහ අනාවරණය කිරීම්, සාධාරණ වටිනාකම් මැනීම සහ නිශ්චල දේපළ අංශයේ නියුතු සමාගම් විසින් අදාළ හෙළිදරව් කිරීම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීම සහ ද්‍රවශීලතා හෙළිදරව් කිරීම්, බදු හෙළිදරව් කිරීම් සහ පරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සම්බන්ධයෙන් මිනුම් සහ හෙළිදරව් කිරීම් ඇතුළත් විය.

# ක්‍රියාකාරකම් වාර්තාව - 2023


## 2.3. මණ්ඩලයේ කාර්යසාධන සංඛ්‍යාලේඛන

| | | 2022 | 2023 |
|---|---|---|---|
| 1. | **හඳුනාගන්නා ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව (කාලච්ඡේදයේ අවසාන දිනට)** | 1,671 | 1,707 |
| 2. | **ලැබුණු මූල්‍ය ප්‍රකාශන** | | |
| | මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව (වර්ෂ කිහිපයක් සඳහා ලද මූල්‍ය ප්‍රකාශන ඇතුළුව) | 1,738 | 1,732 |
| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව | 1.564 | 1.566 |
| 3. | **සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශන (සම්පූර්ණ කරන ලද)** | | |
| | සමාලෝචන සංඛ්‍යාව | 541 | 261 |
| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව | 534 | 261 |
| 4. | **සමාලෝචනවලින් සොයාගත් දෑ** | | |
| | **4.1 අනුකූලවීම්** | | |
| | මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 344 | 192 |
| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව* | 342 | 192 |
| | **4.2 නිරීක්ෂණ සහිතව අනුකූල වීම්** | | |
| | මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 194 | 66 |
| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව* | 192 | 66 |
| | **4.3 අනුකූල නොවීම්** | | |
| | (එකඟතා, විධාන, අනතුරු ඇඟවීම්) | | |
| | මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 3 | 3 |
| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව* | 3 | 3 |
| 5. | **සමාලෝචනය කළ මූල්‍ය ප්‍රකාශනවල % ලෙස මූල්‍ය ප්‍රකාශන වලින් සොයා ගැනීම්** | | |
| | අනුකූලවීම් | 63% | 74% |
| | නිරීක්ෂණ සහිතව අනුකූල වීම් | 36% | 25% |
| | | 99% | 99% |
| | අනුකූල නොවීම් (එකඟතා, විධාන, අනතුරු ඇඟවීම්) | 1% | 1% |
| 6. | **විගණන පරීක්ෂණ (සම්පූර්ණ කරන ලද)** | 10 | 9 |
| | පරීක්ෂණ සංඛ්‍යාව | 33 | 16 |
| | විගණන සමාගම් සංඛ්‍යාව | 9 | 6 |
| 7. | **විගණන පරීක්ෂණවල සොයාගැනීම්** | | |
| | **7.1 අනුකූලවීම්** | | |
| | පරීක්ෂණ සංඛ්‍යාව | 23 | 13 |
| | විගණන සමාගම් සංඛ්‍යාව | 7 | 5 |
| | **7.2 නිරීක්ෂණවලට අනුකූලවීම්** | | |
| | පරීක්ෂණ සංඛ්‍යාව | 9 | 3 |
| | විගණන සමාගම් සංඛ්‍යාව | 5 | 3 |
| | **7.3 අනුකූල නොවීම්** | | |
| | (අනතුරු ඇඟවීම් සහ නීතිපති වෙත යොමු කිරීම) | | |
| | පරීක්ෂණ සංඛ්‍යාව | 1 | - |
| | විගණන සමාගම් සංඛ්‍යාව | 1 | - |
| **8.** | **සමාලෝචන වල නිරත වූ අධීක්ෂණ කාර්යමණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව (වර්ෂය අවසානයේ දී)** | 7 | 2 |

* සමාලෝචනය කරන ලද වර්ෂ කිහිපය හැර

# ක්‍රියාකාරකම් වාර්තාව - 2023

*සමාලෝචන නිමකරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් නියෝජනය වන අංශ*




සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් 1%ක් අනුකූල නොවන බව 2023 වර්ෂයේ සමාලෝචන සොයාගැනීම් මගින් අනාවරණය විය. සමාලෝචන තුළදී අවධානය යොමු කරන ලද ක්ෂේත්‍ර මත පදනම්ව, සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් 74%ක් අනුකූල වූ බවත්, මූල්‍ය ප්‍රකාශනවලින් 25%ක් ආධාර ලිපි මගින් සන්නිවේදනය කරන ලද නිරීක්ෂණවලට අනුකූල වූ බවත් පෙන්වා දෙන ලදී.

මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යසාධනය සැලකිය යුතු මට්ටමින් වෙනස් කළ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල අදාළ නියමයන්වලින් ප්‍රමාණාත්මක බැහැරවීම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් දෙකක මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණි. ඒ අනුව, ඊළඟ කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා එවැනි නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙතින් ඒකඟතාවන් ආකාරයෙන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ලබා ගන්නා ලදී. තවද, මූල්‍යකරණ කටයුතුවල නියැලී සිටින සමාගමක් 1995 අංක 15 දරන පනතේ අවශ්‍යතාවයට අනුව තම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට අපොහොසත් වී ඇති අතර ඔවුන්ගේ විගණකවරයා විසින් මතය ව්‍යවනය කර ඇත. ඉහත කී උල්ලංඝනය කිරීම සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපදෙස් ලබා ගැනීම සඳහා නීතිපතිවරයා වෙත යොමු කරන ලදී.

ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන භාවිත කරමින් ක්‍රියා පටිපාටි භාවිතා කිරීම අවශ්‍ය වන මට්ටමට ප්‍රමාණාත්මක භාවයෙන් වැදගත් නොවන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලින් බැහැරවීම් අනාවරණය වූ අතර ඒ සම්බන්ධයෙන් පුළුල් ලෙස පරීක්ෂණ සිදු නොකර, ලිපි මගින් නිරීක්ෂණ ලෙස නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්වලට දැනුම් දෙනු ලැබූ අතර එමගින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්වලට අවශ්‍ය අවස්ථාවලදී එම ව්‍යවසායයන් මගින්ම අනුකූලතාවය වැඩිදියුණු කළ හැකි වනු ඇත. වර්ෂය තුළ දී, මූල්‍ය ප්‍රකාශන කට්ටල 66ක් සම්බන්ධයෙන් නිරීක්ෂණ ලිපි නිකුත් කරන ලදී.

(2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම් සම්බන්ධ විස්තර සඳහා 19 හා 20 පිටු ද, 2023 වර්ෂය තුළ ලබාගත් ඒකඟතාවක් හා නෛතික උපදෙස් සඳහා යොමු කර ඇති කරනු සඳහා පිටු අංක 21 ද බලන්න.)

## 3. විගණන පරීක්ෂාව

ඉකුත් වර්ෂය තුළදී පරීක්ෂා කරන ලද විගණන ආයතන 9ක් විසින් සිදු කරන ලද විගණන 33 සමඟ සැසඳීමේ දී, විගණන ආයතන 6ක් මගින් සිදු කරන ලද විගණන 16ක් පරීක්ෂාවට ලක් කරන ලදී. පහත 7.1 කොටසෙන් විස්තර කර ඇති පරිදි, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. හි පවතින පරීක්ෂණ කාර්ය මණ්ඩලය අඩුවීම පරීක්ෂණ සංඛ්‍යාවේ අඩුවීමට හේතු වී ඇත.

වර්ෂය තුළ පරීක්ෂණ සිදු කරන ලද විගණන ලිපිගොනු අවදානම මත පදනම් වූ ප්‍රවේශයක් මත තෝරා ගන්නා ලදී. පරීක්ෂණවල සොයාගැනීම් මත පදනම්ව, විගණන 13ක් පරීක්ෂණවලදී අවධානය යොමු කරන ලද ක්ෂේත්‍රවලට අදාළව SLAUs සමඟ අනුකූල වී තිබුණි. ඉතිරි විගණන පරීක්ෂණ 3 ක සොයාගැනීම් සඳහා ව්‍යවස්ථාව යටතේ වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය නොවන අතර එම සොයාගැනීම් නිරීක්ෂණ ලිපි මගින් අදාළ විගණකවරුන් වෙත දන්වන ලදී. මෙම සොයාගැනීම් විගණන සැලසුම් කිරීම, විගණන සාක්ෂි එකතු කිරීම, ගිණුම් ඇස්තමේන්තු විගණනය කිරීම, පාලනයට සම්බන්ධ පාර්ශ්ව (TCWG) සමඟ සන්නිවේදනය කිරීම සහ අඛණ්ඩ පැවැත්ම යන ක්ෂේත්‍රවල විගණන අඩුපාඩුවලට සම්බන්ධ විය.

2022 වර්ෂයේදී විගණන ආයතන 5ක් විසින් සිදු කරන ලද විගණන 9 හා සැසඳීමේ දී, විගණන ආයතන 3ක් මගින් විගණන 9 ක අඩුපාඩු සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ සන්නිවේදනය කර තිබුණි.

(2023 වර්ෂය තුළ විගණන පරීක්ෂා කිරීම්වල සොයාගැනීම් සඳහා පිටු අංක 22 සිට 25 දක්වා පිටුව බලන්න.)

## 4. පරීක්ෂණ සහ නීතිපති වෙත යොමු කරන ලද කරුණු

### 4.1 ඇඩම් කැපිටල් පීඑල්සී

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් 2016 මාර්තු 31

# ක්‍රියාකාරකම් වාර්තාව - 2023

දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නැවත විගණනය කරන ලෙස ඉල්ලමින් නියෝගයක් නිකුත් කිරීමෙන් අනතුරුව, ඇඩම් කැපිටල් පීඑල්සී විසින් නිසි ගිණුම් පොත් සහ අදාළ වාර්තා පවත්වාගෙන යාමට අපොහොසත් වුවද වත්මන් විගණකවරයා විසින් සමාගම වෙත තත්ත්වාගණනය නොකළ මතයක් නිකුත් කිරීම හේතුවෙන් එම නැවත විගණනය සිදු කිරීම සඳහා දැරිය යුතු අමතර පිරිවැය දැරීමට සමාගම කැමැත්තක් නොදැක්විය.

අනතුරුව, එකී විගණකවරයා විසින් විගණන ප්‍රමිතීන් අඛණ්ඩව උල්ලංඝනය කර ඇති බවත්, එම විගණකවරයා විසින් ඊළඟ වසරේ මූල්‍ය ප්‍රකාශන විගණනයේ දී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් සන්නිවේදනය කරන ලද කරුණු විසඳීමට කටයුතු කර නොමැති බවත් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් නිරීක්ෂණය කරන ලද අතර ඒ සම්බන්ධයෙන් එම විගණකවරයාට සහ සමාගමට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇත. එමෙන්ම, මෙම කරුණ නීතිපතිවරයා වෙත යොමු කර ඇත.

## 4.2. බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී

1995 අංක 15 දරන පනතේ 6 (1) වගන්තියේ දක්වා ඇති අවශ්‍යතාවයට අනුව 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී අපොහොසත් වී ඇති අතර එකී මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ඔවුන්ගේ විගණකවරයා විසින් මතය ව්‍යවනය කිරීමක් ප්‍රකාශ කර තිබුණි. මීට අමතරව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් සමාගම එම මූල්‍ය ප්‍රකාශනවල අසම්පූර්ණ සහ වැරදි තොරතුරු පළ කර ඇති බව නිරීක්ෂණය කරන ලදී.

ඉහත කරුණු අනුව, ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. නීතිපතිවරයාගෙන් උපදෙස් ඉල්ලා ඇත.

## 5. ප්‍රමිති සකස් කරන ආයතනයට සහාය දැක්වීම

1995 අංක 15 දරන පනත යටතේ ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ගිණුම්කරණ ප්‍රමිති කමිටුව සහ විගණන ප්‍රමිති කමිටුව ශ්‍රී ලංකාව තුළ ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් සම්මත (නීතිගත) කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාවට නිර්දේශ නිකුත් කරන අතර ඒ සඳහා සහාය ද ලබා දෙයි.

වර්ෂය තුළ, ඉහත කමිටු විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වලට පහත සඳහන් දෑ ඇතුළත් විය.

- ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය (IASB) විසින් නිකුත් කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKASs) බන්ධිත වෙළුම 2023 ප්‍රකාශයට පත් කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය සමාගම් සඳහා සංශෝධනය කොට නිකුත් කරන ලද ආයතනික පාලන නියෝග මත පදනම් ව, මූල්‍ය සමාගම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන ලද ආයතනික පාලන නියෝග යන්ට අනුකූලවීම පිළිබඳව වාර්තා කිරීම සඳහා වන ශ්‍රී ලංකා ආශ්‍රිත සේවා ප්‍රායෝගික ප්‍රකාශය (SLRSPS - 4752), සංශෝධනය කර ප්‍රකාශනය කිරීම.
- රජයේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන සඳහා සහාය ලබා දීම.
- නිතර අසනු ලබන ප්‍රශ්න කිහිපයක් නිකුත් කිරීම (FAQs);
  - o අවිනිශ්චිත ආර්ථික තත්ත්වයන් යටතේ වට්ටම් අනුපාතිකය භාවිතා කිරීම පිළිබඳ සාකච්ඡා,
  - o ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLAS) 12, ආදායම් බදු, බදු අනුපාත වෙනස්වීම් සඳහා ගිණුම්කරණ පිළියම් සම්බන්ධයෙන්,
  - o රජයේ ගෘහස්ථ ණය ප්‍රශස්ත කිරීමේ (DDO) වැඩසටහන යටතේ නිකුත් කරන ලද මූල්‍ය උපකරණ සඳහා ගිණුම්කරණ පිළියම් සම්බන්ධයෙන්,
  - o රජයේ ගෘහස්ථ ණය ප්‍රශස්ත කිරීමේ (DDO) වැඩසටහනේ ප්‍රතිඵලයක් වශයෙන්, විශ්‍රාම අරමුදල් සඳහා ගිණුම්කරණ පිළියම් සම්බන්ධයෙන්,
- දැනට පවතින SLFRS/LKASs සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීම ඇතුළුව එම ප්‍රකාශන සංශෝධනය කිරීම සහ ගැසට් කිරීම,
- නිරාවරණ කෙටුම්පත්වලට ප්‍රතිචාර දැක්වීම සහ IFRS/ISA සහ ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය සහ ජාත්‍යන්තර විගණන සහ සහතික කිරීමේ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද සංශෝධන පිළිබඳව සාකච්ඡා කිරීම සහ,
- නව හෝ සංශෝධිත ප්‍රමිතීන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන්/සැසිවාර සහ වෙබිනාර් පැවැත්වීම.

ප්‍රමිත සැකසීමේ කටයුතු සඳහා සහාය දැක්වීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය වෙත වාර්ෂික ප්‍රදානයක් ලබාදීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය සමඟ පැවති අතීත වැඩපිළිවෙළ අඛණ්ඩව පවත්වාගෙන යාමේ දී, කමිටු දෙකෙහි පිරිවැය කොටසක් මූල්‍යකරණය කිරීම සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් සම්මත කිරීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් වර්ෂය තුළ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය වෙත රු. මිලියන 2ක් ගෙවන ලදී. කෙසේ වුවද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් මුහුණ දෙන ලද අයවැය බාධාවන් හේතුවෙන්, 2023 සඳහා ලබා දුන් වාර්ෂික ප්‍රදානය පසුගිය වර්ෂ තුළ ලබා දුන් ප්‍රදානවලින් 50% දක්වා අඩු විය.

(2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රමිත සැකසීමට අදාළ ක්‍රියාකාරකම් සඳහා පිටු අංක 35 බලන්න).

## 6. ජාත්‍යන්තර සබඳතා

මූල්‍ය වාර්තාකරණය, විගණනය සහ අනුකූලතා අධීක්ෂණය සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් ලොව පුරා සිදුවන වර්ධනයන්ට අනුගතව කටයුතු කිරීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. බොහෝ ජාත්‍යන්තර සංවිධානවල සාමාජිකත්ව ලබාගෙන ඇත. අනෙකුත් ගෝලීය නියාමකයින්ගෙන් තොරතුරු සහ සහාය ලබා ගැනීමේ අවස්ථාව සහ බොහෝ නියාමකයින්ට ප්‍රයෝජනවත් වන ක්‍රියාකාරකම් හවුල් ක්‍රියාකාරකම් ලෙස සිදු කිරීමට මෙම අනුබද්ධතාවය මගින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.ට අවස්ථාව විවර වී තිබේ.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් පහත සඳහන් ජාත්‍යන්තර සංවිධානවල සාමාජිකත්වය පවත්වාගෙන යයි.

අ) ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදය (IFIAR) - 2007 වර්ෂයේ පැවති එහි පළමු පූර්ණ (Plenary) රැස්වීමේ සිට සාමාජිකත්වය ලබාගෙන ඇත.

ආ) ජාත්‍යන්තර විගණන සහ තහවුරු කිරීමේ ප්‍රමිති මණ්ඩලයේ (IAASB) උපදේශක කණ්ඩායම - 2007 වර්ෂයේ දී සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

ඇ) ගණකාධිකාරීවරුන් සඳහා වන ජාත්‍යන්තර ආචාර ධර්ම ප්‍රමිති මණ්ඩලයේ (IESBA) උපදේශක කණ්ඩායම - 2009 වර්ෂයේ දී සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

මීට අමතරව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.යේ කාර්ය මණ්ඩලය එක්සත් ජාතීන්ගේ සංවිධානය

# ක්‍රියාකාරකම් වාර්තාව - 2023

විසින් වාර්ෂිකව පවත්වනු ලබන ජාත්‍යන්තර ගිණුම්කරණය සහ වාර්තාකරණය (ISAR) පිළිබඳ අන්තර් රාජ්‍ය විශේෂඥයින්ගේ සැසිවාරවලදී ශ්‍රී ලංකාව නියෝජනය කරයි. තවද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් 2018 වර්ෂයේ සිට නිරීක්ෂකයෙකු වශයෙන් ASEAN විගණන නියාමක කණ්ඩායම (AARG) නියෝජනය කරයි.

රට තුළ පවතින අභියෝගාත්මක ආර්ථික තත්ත්වය හේතුවෙන් රජය විසින් බලාත්මක කරන ලද දැඩි අයවැය පාලනයන් හේතුවෙන්, ඉහත ජාත්‍යන්තර සංවිධාන විසින් පවත්වනු ලබන කිසිදු භෞතික සැසිවාරයකට සහභාගී වීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.ට නොහැකි විය.

කෙසේ වුවද, වසර තුළ අතථ්‍ය ආකාරයෙන් සමහර සැසි පැවැත්වීම හේතුවෙන්, IFIAR විසින් පවත්වනු ලබන වෙබිනාර් සඳහා, එනම් සාමාන්‍ය තත්වයන් යටතේ IFIAR හි පූර්ණ රැස්වීමේ න්‍යාය පත්‍ර අයිතම වූ ගෝලීය මහජන ප්‍රතිපත්ති කමිටුවේ සාමාජිකයින් වන විගණන ආයතන සමඟ සැසිවලට සහභාගී වීමට කාර්ය මණ්ඩලයට හැකි විය.

ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදය (IFIAR) විසින් පවත්වනු ලබන සැසි සඳහා ලොව පුරා ස්වාධීන විගණන නියාමකයින් සහභාගී වන හෙයින්, මෙම රැස්වීම් සහ සම්මන්ත්‍රණ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. සඳහා තොරතුරු හුවමාරු කිරීමේ වේදිකාවක් නිර්මාණය කරයි. කෙසේ වුවද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.යේ කාර්ය මණ්ඩලයට දැනට භෞතිකව පවත්වනු ලබන සැසිවලට සහභාගී වීමට නොහැකි වීම හේතුවෙන් සැසිවාරවල ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී ඇත. එක් කාර්ය මණ්ඩල සාමාජිකයෙක් අතථ්‍ය සැසි ලෙස පවත්වන ලද උපදේශක කණ්ඩායම් දෙකේ රැස්වීම්වලට සහභාගී විය.

මෙම ගෝලීය සැසිවාර සඳහා සහභාගී වීම ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.යේ ධාරිතා ගොඩනැගීමට අතීතයේ දී මෙන්ම වැදගත් වී ඇති අතර මෙහි දී රැස්වීම්, පරීක්ෂණ වැඩමුළු සහ විගණන නියාමනයට අදාළ සම්මන්ත්‍රණවලට සහභාගී වීමට මෙන්ම ලොව පුරා සිටින සෙසු විගණන නියාමකයින් සමග සාකච්ඡා කිරීමට සහ ජාලගත වීමට හැකියාව ලබාදී ඇත. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් රට තුළ නියාමන පරිසරය ශක්තිමත් කිරීම සඳහා එහි නියාමන යාන්ත්‍රණය නවීකරණය කිරීමට අතීත ගෝලීය මනා භාවිතයන් පිළිබඳ අධ්‍යයන ඉවහල් වී ඇත. එමෙන්ම, මෙම ජාලගත යාන්ත්‍රණ හරහා, වසර තුළ අනුගමනය කරන ලද නියාමන ක්‍රමවේද වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණ නියාමනය සහ විගණන නියාමනය කිරීමේ ක්ෂේත්‍රවල ප්‍රවණතා හඳුනා ගැනීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. ට හැකි විය.

## 7. මානව සම්පත්

### 7.1. කාර්ය මණ්ඩලය

2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.යේ සේවක මණ්ඩල තනතුරු 33 අතරින් සම්පූර්ණ කාර්ය මණ්ඩලය දහ (10) දෙනෙකුගෙන් සමන්විත විය. වසර තුළ පුද්ගලයන් හත් (7) දෙනෙක් ඉල්ලා අස් වූ අතර පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. බොහෝ ප්‍රයත්න දරන ලද නමුත් එය සාර්ථක නොවූ අතර, වසරේ වැඩි කාලසීමාවක් තුළ උග්‍ර කාර්ය මණ්ඩල හිඟයක් සහිතව කටයුතු කිරීමට මණ්ඩලයට සිදු විය. වසර අවසානය වන විට, සමස්ත තාක්ෂණික කාර්ය මණ්ඩලය වරලත් ගණකාධිකාරිවරුන් පස් දෙනෙකුගෙ න් (5) සමන්විත වූ අතර, ඔවුන් සියල්ලන්ම ස්ථිර පදනමින් සේවයේ යොදවා තිබුණු අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරියන් දෙදෙනෙකු සහ අධ්‍යක්ෂවරියන් දෙදෙනෙකු (2) ගෙන් සමන්විත විය.

2019 සිට පුරප්පාඩු වූ තාක්ෂණික තනතුරු තුනක් (3) සහ 2021 සහ 2022 සිට තාක්ෂණික තනතුරු දෙකක් (2) අනුපිළිවෙලින් පුරප්පාඩු වීම හේතුවෙන් පුරප්පාඩු සහිත පරීක්ෂණ කාර්ය මණ්ඩලයක් සමඟ වසර ආරම්භ කිරීමට ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. යට සිදු විය. ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. යේ නියාමන කාර්යයන් වල වසර දහයකට වැඩි කාලයක් කටයුතු කළ අධ්‍යක්ෂ* (තාක්ෂණික) දෙදෙනෙකු සහ සහකාර අධ්‍යක්ෂ* (තාක්ෂණික) දෙදෙනෙකු ඉල්ලා අස්වීම හේතුවෙන් වසර තුළ පැවති පුරප්පාඩු සංඛ්‍යාව තවදුරටත් වැඩි විය. තවද, 2023 පෙබරවාරි මාසයේදී නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරට අභ්‍යන්තර උසස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුවත් සමඟ, වසර තුළ පරීක්ෂණ කාර්ය මණ්ඩල තනතුරු දොළහෙන් (12) පුරප්පාඩු දහයක් (10) පිරවිය යුතු විය. එකී පුරප්පාඩු වූ තනතුරු දහය (10) අධ්‍යක්ෂ අධීක්ෂණ තනතුරු හතරකින් (4) සහ සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ තනතුරු හයකින් (6) සමන්විත විය. අමාත්‍යාංශ චක්‍රලේඛවලට අනුව අදාළ වැටුප් පරිමාණයන් අනුව මනා පළපුරුද්දක් ඇති, තාක්‍ෂණික වශයෙන් දක්ෂ වරලත් ගණකාධිකාරිවරුන් ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. ට නොහැකි වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම පුරප්පාඩු පවතී. රජයේ වැටුප් තලය තුළ තිබිය යුතු වීම හේතුවෙන් මෙම ගැටලුව සඳහා සෑහීමකට පත්විය හැකි විසඳුමක් නොමැතිව දශකයකට වැඩි කාලයක් මුදල් අමාත්‍යාංශය සමඟ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. සාකච්ඡා කරන ලදී. වෘත්තීය කාර්ය මණ්ඩලය ආකර්ශනය කර ගැනීමට සහ රඳවා තබා ගැනීමට වැටුප් ගැටලුවට විසඳුමක් ලබා දීමේදී, මණ්ඩලය අමාත්‍යාංශය සමඟ පැවැත්වූ සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. වෙත වෘත්තීයමය වශයෙන් දක්ෂ වරලත් ගණකාධිකාරිවරුන් ආකර්ෂණය කර ගැනීම සඳහා වැටුප් ලබාදීමට 2021 ජුනි මාසයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. කෙසේ වුවද, සංශෝධිත බඳවා ගැනීමේ යෝජනා ක්‍රම සඳහා අමාත්‍යාංශයේ එකඟතාවය ලැබීමේ දීර්ඝ ප්‍රමාදය හේතුවෙන්, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. යේ පුරප්පාඩු පිරවීමට හෝ දැනට සිටින පුහුණු කාර්ය මණ්ඩලය රඳවා ගැනීමට ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. සමත් නොවීය.

කෙසේ වුවද, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. යේ නියාමන වගකීම්වල කාර්යසාධනය කෙරෙහි කාර්ය මණ්ඩල හිඟය ඇති කරන සැලකිය යුතු බලපෑම සැලකිල්ලට ගනිමින්, වෘත්තීය කාර්ය මණ්ඩලයේ දිගුකාලීන වැටුප් ගැටළුව විසඳීමට පහසුකම් සැලසීම සඳහා ගරු මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින් 2023 අගෝස්තු මාසයේදී විශේෂ අනුමැතියක් ලබා දෙන ලදී. කෙසේ වුවද, ඉහත සඳහන් කළ විශේෂ අනුමැතිය ලැබීමෙන් පසු එකී තනතුරු පිරවීමට මණ්ඩලය හතර වරක් ප්‍රයත්න දැරුවද, 2023 වසර අවසන් වන විට ද පුරප්පාඩු වූ තනතුරුවලින් බහුතරයක් පුරප්පාඩු පැවතින.

වර්ෂය තුළ ඉල්ලා අස්වීම හේතුවෙන්, මූල්‍ය හා පරිපාලන අංශය ක්‍රියාත්මක වූයේ අංශ ප්‍රධානියෙකු, තොරතුරු තාක්ෂණ පරිපාලකයෙකු සහ සංචිත වාහන රියදුරෙකු නොමැතිවය. තාක්ෂණික පුරප්පාඩුවලට සමානව, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. බොහෝ ප්‍රයත්න දැරුවද, කළමනාකරණ සහකාරවරයකු බඳවා ගැනීම හැර වසර අවසානය දක්වා එකී පුරප්පාඩු පිරවීමට ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. සමත් නොවීය.

සමාලෝචන කාර්යයන්හි නිරත වූ කුසලතා සහිත තාක්ෂණික කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ හිඟය අපේක්ෂිත මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සහ විගණන පරීක්ෂණ සංඛ්‍යාව පැවැත්වීම සීමා කිරීමට හේතු විය. පුරප්පාඩු වී ඇති ප්‍රධාන මූල්‍ය සහ පරිපාලන කාර්යභාරයන් අධීක්‍ෂණය කිරීමට ඉතිරි තාක්ෂණික කාර්ය මණ්ඩලයට සිදුවීම මෙම තත්ත්වය තවදුරටත් තීව්‍ර කරයි.

*අධ්‍යක්ෂක / සහකාර අධ්‍යක්ෂ තාක්ෂණික යන නාමයන් 2023 වර්ෂයේදී අධ්‍යක්ෂක / සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ ලෙස නැවත නම් කරන ලදී.

# ක්‍රියාකාරකම් වාර්තාව - 2023

මෙම පසුබිම තුළ, සමාලෝචන ආවරණය වැඩි දියුණු කිරීමේ පියවරක් ලෙස, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනවල මූලික සමාලෝචන කාර්යයේ වසර ගණනාවක් පුරා නියුක්තව සිටි බාහිර සමාලෝචක මණ්ඩලයේ සේවා අඛණ්ඩව ලබා ගන්නා ලදී. කෙසේ වුවද, දැනට සිටින තාක්ෂණික කාර්ය මණ්ඩලය විසින් සම්පූර්ණයෙන් සිදු කරන ලද සමාලෝචනවලට අමතරව, බාහිර සමාලෝචක මණ්ඩලය විසින් මූලික සමාලෝචන සිදු කරන ලද සමාලෝචන අවසන් කිරීමේ කාර්යයන් ද දැනට සිටින තාක්ෂණික කාර්ය මණ්ඩලය විසින් සිදු කළ යුතු බැවින් සමාලෝචන ආවරණය සීමා කිරීමට සිදු විය.

## 7.2. බාහිර සමාලෝචක මණ්ඩලය

2012 වසරේ කෝප් කමිටුවේ නිර්දේශවලට අනුකූලව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වැඩි කිරීමට දරන ලද ප්‍රයත්නයේ දී බාහිර සමාලෝචකයින්ගේ සේවය සමාලෝචිත වර්ෂය තුළ ද අඛණ්ඩව ලබා ගැනීමට ශ්‍රී..ල.ගි.වි.ප්‍ර.ස.ම. මගින් කටයුතු කරන ලදී. ඒ අනුව, 2022 වසරේ සේවය ලබා ගන්නා ලද සමාලෝචකයින් දහතුන් (13) දෙනා සමඟ සැසඳීමේ දී, වසර අවසානයේ දී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. සතුව බාහිර සමාලෝචකයෝ 12 දෙනෙක් සිටියහ.

බාහිර සමාලෝචකයින් විසින් පවත්වනු ලබන සමාලෝචනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින්, බාහිර සමාලෝචකයින් විසින් සිදු කරන ලද සමාලෝචනවල ගුණාත්මකභාවය පිළිබඳ ඇගයීමක් වරින් වර පවත්වනු ලැබේ. සමාලෝචකයන්ගේ ඇගයීමේ ප්‍රතිඵල මත පදනම්ව, සමාලෝචකයන්ගේ සේවා අඛණ්ඩව පවත්වාගෙන යෑම හෝ අත්හිටුවීම සිදු කරනු ලැබේ. මෙමගින් සමාලෝචකයින්ගේ වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමට හැකි වන අතර, බාහිර සමාලෝචකයින් විසින් පවත්වනු ලබන සමාලෝචනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ද එමඟින් පහසුකම් සැලසේ.

වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද සමාලෝචන අතුරින්, බාහිර සමාලෝචකයින් විසින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 12 ක් සඳහා මූලික සමාලෝචන සිදු කරන ලද අතර ඔවුන්ගේ සේවාවන් ලබා ගැනීම සඳහා රු. මිලියන 0.19 ක් වැය කරන ලදී. මෙම බාහිර සමාලෝචක මණ්ඩලයේ සාමාජිකයන් විසින් සිදු කරන ලද මූලික සමාලෝචන අභ්‍යන්තර කාර්ය මණ්ඩලය විසින් සම්පූර්ණ කළ යුතු බැවින් සහ මෙම සමාලෝචනයේ (7.1) කොටසේ විස්තර කර ඇති පරීක්ෂණ කාර්ය මණ්ඩලයේ උග්‍ර හිඟයේ ප්‍රතිඵලයක් ලෙස බාහිර සමාලෝචක මණ්ඩලයට අඩු වාර්තා ප්‍රමාණයක් ලබා දෙන ලදී. එබැවින්, බාහිර සමාලෝචන මණ්ඩලය විසින් සිදු කරන ලද සමාලෝචන සංඛ්‍යාව අඩු විය.

බාහිර සමාලෝචකයන්ගේ සොයාගැනීම් මත පදනම්ව ඉහත කී මූල්‍ය ප්‍රකාශන කට්ටල 12 හි සමාලෝචන සම්පූර්ණ කිරීමේදී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.යේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට අමතර තොරතුරු ලබා ගැනීමට, නිවැරදි කිරීම් සඳහා එකඟතා ලබාගැනීමට සහ නිරීක්ෂණ ලිපි නිකුත් කිරීමට සහ ව්‍යවස්ථාව යටතේ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට සිදු විය. මීට අමතරව, වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචන අතරින්, මූල්‍ය ප්‍රකාශන කට්ටල 249 ක මූලික සමාලෝචනය ද මණ්ඩලයේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී.

## 8. ආයතනික පාලනය

ව්‍යවස්ථාවේ නියමයන්ට අනුව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. සාමාජික මණ්ඩලයක් මගින් පාලනය වේ. ඒ අනුව, නිල බලයෙන් පත්වන සාමාජිකයින් 3 දෙනෙකුගෙන් සහ හඳුනා ගත් ආයතනවලින් ලැබුණු නාමයෝජනා අතරින් මුදල් අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයින් 10 දෙනෙකුගෙන් මණ්ඩලය සමන්විත වේ. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් යන නිලධාරීන් නිල බලයෙන් පත්වන සාමාජිකයින් වේ. ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (සාමාජිකයින් 3), එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ශ්‍රී ලංකා ශාඛාව, ශ්‍රී ලංකා නීතීඥ සංගමය, ලංකා වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකා වාණිජ සහ කර්මාන්ත මණ්ඩල සම්මේලනය, ශ්‍රී ලංකා බැංකු සංගමය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කළ නිලධාරීන් පත් කළ සාමාජිකයින් වේ. පත්කරන ලද සාමාජිකයෙකුගේ ධූර කාලය වසර හතරකි.

වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිනිය වූ කේ.එම්.ඒ.එන්. දවුලගල මහත්මිය සභාපතිනිය වශයෙන් කටයුතු කළාය.

වර්ෂය තුළ ව්‍යවස්ථාව ප්‍රකාරව පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් වන එම්.පී. අබේසේකර මිය, ඩබ්.පී.ආර්.පී.එච්. ෆොන්සේකා, පී.ආර්.ඒ.අයි. ගුණරත්න, කේ.කේ.එස්. ගුණවර්ධන සහ මහාචාර්ය ඒ. ජයමහ යන මහත්ම මහත්මීහු වර්ෂය තුළ ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි අධ්‍යක්ෂවරුන් හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ලෙස සේවය කළහ. එසේම, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් වූ එස්.එම්.එස්.එස්. බණ්ඩාර, එච්.එම්.ඒ. ජයසිංහ සහ ඩබ්ලිව්.ඩබ්ලිව්.ජේ.සී. පෙරේරා යන මහත්වරු ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විගණනය කරනු ලබන වෘත්තීය ගණකාධිකාරී සමාගම්වල හවුල්කරුවන් ලෙස කටයුතු කළ අතර ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායවල අධ්‍යක්ෂවරුන් වශයෙන් හෝ විගණන කමිටුවල උපදේශකවරුන් වශයෙන් කටයුතු කළහ.

තවද, එම කාලසීමාව තුළ මණ්ඩලයේ ආරාධිතයෙකු වන ටි.ජේ.එස්. රාජාකාරිය මහතා ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් විගණනය කරන වෘත්තීය ගණකාධිකාරී සමාගමක හවුල්කරුවෙකු ලෙස කටයුතු  කළේය. තවද, එම කාලය තුළ මණ්ඩලයේ නිරීක්ෂකවරියක් ලෙස කටයුතු කරන භාණ්ඩාගාර නියෝජිතවරියක වන කේ.වී.සී. දිල්රුක්ෂි මහත්මිය ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායවල අධ්‍යක්ෂවරියක් ලෙස කටයුතු කළාය.

මණ්ඩලයේ ස්වාධීනත්වය සහතික කිරීම සඳහා, මණ්ඩලයේ සියලුම සාමාජිකයින්, ආරාධිතයින් මෙන්ම නිරීක්ෂකයින් විසින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. සමඟ මෙන්ම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය සහ විගණකවරුන් සමඟ ඔවුන්ගේ සම්බන්ධිත පාර්ශ්ව සබඳතා කාර්තුමය පදනමින් හෙළිදරව් කරයි. ඒ අනුව, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායක හෝ එහි විගණකවරයාට සම්බන්ධ කරුණුවලට අදාළ සියලුම ලේඛන අදාළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය හෝ එහි විගණකවරයා සමඟ සම්බන්ධයක් ඇති සාමාජිකයින් වෙත යවනු ලබන ලේඛනවලින් ඉවත් කර ඇති අතර එවැනි සාමාජිකයෝ එම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය හෝ විගණකවරුන් සම්බන්ධ විෂයයන් පිළිබඳ සාකච්ඡා සඳහා සහභාගී නොවෙති.

මණ්ඩලය විසින් නියමිත පරිදි රැස්වීම් කැඳවනු ලැබූ අතර වර්ෂය තුළ මණ්ඩලය මගින් රැස්වීම් 15ක් පවත්වන ලදී.

වර්ෂය තුළ මණ්ඩලයේ සාකච්ඡා මගින් සමස්ත මෙහෙයුම් දර්ශක අනුව කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායය සහ විගණකවරුන් සම්බන්ධ සැලකිය යුතු තාක්ෂණික ගැටළු විසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ආවරණය කරන ලදී. නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සහ විගණකවරුන් විසින් ප්‍රමිතීන්ට අනුකූල නොවීම සම්බන්ධ ගැටළු පිළිබඳව ද,

# ක්‍රියාකාරකම් වාර්තාව - 2023

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, වාර්ෂික අයවැය සහ මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීම සඳහා ද මණ්ඩලය සිය අවධානය යොමු කරන ලදී. තවද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් එහි ඵලදායී ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුතුවල ප්‍රගතිය සමාලෝචනය කිරීමේ කටයුතුවල සහ දැනට සංශෝධනය කරමින් පවතින ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. පනතේ සංශෝධන සමාලෝචනය කිරීමේ කටයුතුවල නිරත විය.

තවද, තාක්ෂණික කාර්යයන් ඉටු කිරීම සඳහා යෝග්‍ය වෘත්තීය කාර්ය මණ්ඩලයක් ආකර්ෂණය කර ගැනීමට නොහැකි වීම පිළිබඳව පවතින ගැටලුව විසඳීමට සහ 2021 වසරේ සිට නොවිසඳී ඉතිරිව පවතින සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටි සඳහා මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබා දීම කඩිනම් කිරීමට මණ්ඩලය දැඩි උත්සාහයක් ගන්නා ලදී. මෙම ක්‍රියාවලියේදී මණ්ඩලය මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ රැස්වීම් ගණනාවක් පවත්වා ඇති අතර ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් සහ ඒවා භාවිත කිරීම පිළිබඳ මනා දැනුමක් ඇති, දක්ෂ වරලත් ගණකාධිකාරීවරුන් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට කාර්ය මණ්ඩල වැටුප් සම්බන්ධ විකල්ප ක්‍රම සමාලෝචනය කර ඇත.

මණ්ඩලයේ කාර්ය ප්‍රතිපත්තියට අනුව, තොරතුරු එක්රැස් කිරීම, මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය, විගණන පරීක්ෂා කිරීම, විමර්ශන පැවැත්වීම සහ මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු සිදුකිරීම වැනි ප්‍රමිතීන්ට අනුකූලතාව අධීක්ෂණය කිරීමට අදාළ නිරන්තර මෙහෙයුම් වසර තුළ අධ්‍යක්ෂ ජනරාල් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරියන් දෙදෙනාගේ අධීක්ෂණය සහ මඟ පෙන්වීම යටතේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී.

### 9. මූල්‍ය කාර්යසාධනය

වසර තුළ, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.යේ ප්‍රධාන මූල්‍යකරණ මූලාශ්‍රය රජය විසින් සපයන ලද අරමුදල් විය. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. යේ ක්‍රියාකාරකම් රජයේ අරමුදල් හරහා මූල්‍යකරණය කරනු ලැබුවද, මණ්ඩලයේ වියදම් මූල්‍යකරණය කිරීමේ විකල්පයක් ලෙස, පනත යටතේ ගරු මුදල් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන, කොටස් හිමියන්ගේ හිමිකම් හෝ බදු පසු ලාභය යන දෙකෙන් වැඩි අගයේ ප්‍රතිශතයක් ලෙස ගණනය කළ සෙස් බද්දක් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙතින් අය කළ හැකි වේ. කෙසේ වුවද, මෙම විකල්පයට මුදල් අමාත්‍යාංශය කැමැත්ත පළ නොකළ අතර 2008 ජනවාරි 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන කාලසීමා සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ සෙස් බද්ද ගරු අමාත්‍යවරයා විසින් 2008 ඔක්තෝබර් 7 දින ඉවත් කර ගන්නා ලදී. මුදල් අමාත්‍යාංශය සමඟ පවත්වා ගත් අතීත වැඩපිළිවෙළ අඛණ්ඩව සිදු කරමින්, ප්‍රමිති සැකසීමේ ක්‍රියාකාරකම් සඳහා වියදමින් කොටසක් මූල්‍යකරණය කිරීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් රු. මිලියන 2ක් වාර්ෂික ප්‍රදාන වශයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට ලබා දෙන ලදී. අයවැය සීමාවන් හේතුවෙන්, මෙම වසරේ ප්‍රදානය පසුගිය වසරවල දී ලබා දුන් වාර්ෂික ප්‍රදානයෙන් 50% කින් අඩු කරන ලදී.

වසර තුළ සිදු වූ ඉහළ ඉල්ලා අස්වීම් සංඛ්‍යාවක් හේතුවෙන් වර්ෂය තුළ සේවයේ යෙදී සිටි කාර්ය මණ්ඩලය සැලකිය යුතු ලෙස අඩුවීම හේතුවෙන්, 2022 වර්ෂය සඳහා වූ මෙහෙයුම් වියදම වූ රු. 77,015,260/- කට වඩා අඩු මුදලක් වූ රු. 71,544,975/- ක් මෙම වසර තුළ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් මෙහෙයුම් කටයුතු සඳහා වැය කරන ලදී.

මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ මෙම සමාලෝචනයේ (7.2) කොටසේ විස්තර කර ඇති පරිදි බාහිර සමාලෝචකයින් වෙත වෘත්තීය ගාස්තු සඳහා වැය වූ පිරිවැය අඩු වීම රජයේ චක්‍රලේඛ මගින් පනවා ඇති සීමාවන් හේතුවෙන් කාර්ය මණ්ඩලයේ පුහුණුව හා සංවර්ධනය සඳහා වන ආයෝජනය සැලකිය යුතු ලෙස අඩුවීම සහ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් අනුගමනය කරනු ලබන ඇතැම් පිරිවැය-ඉතුරුම් ක්‍රම මෙන්ම අඩු කාර්ය මණ්ඩල සංඛ්‍යාව හේතුවෙන් ඇති වන අඩු භාවිතය හේතුවෙන් ලිපි ද්‍රව්‍ය පිරිවැය ද අඩු වීමය. තවද, 2022 දී මුද්‍රණ පිරිවැය සඳහා අධි ප්‍රතිපාදන සැලසීම සහ ඉහළ මුද්‍රණ පිරිවැය හේතුවෙන් වාර්තා මුද්‍රණය කිරීම සඳහා වියදම් අඩු කිරීම නිසා වසර තුළ වාර්ෂික වාර්තා මුද්‍රණය කිරීමේ පිරිවැය ද පෙර වසරට වඩා අඩු විය.

කෙසේ වුවද, ඉල්ලා අස්වීම මගින් ඇති වූ පුරප්පාඩු පිරවීමට ගත් ප්‍රයත්නවලදී, බඳවා ගැනීමේ පුවත්පත් දැන්වීම් හා වෙළඳ දැන්වීම් නිතර පළ කිරීම, ප්‍රධාන පරිපාලන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීමේ දුෂ්කරතා හේතුවෙන් බාහිරින් ලබාගන්නා සේවාවන් සඳහා ගෙවීම සහ ගෙවීම් කිරීමේ දී, ජපන් යෙන්වලට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් IFIAR වෙත වාර්ෂික සාමාජික ගාස්තු ගෙවීමේ දී ඉහළ රුපියල් වටිනාකමක් ගෙවීමට සිදු විම නිසා වසර තුළදී ඇතැම් මෙහෙයුම් වියදම්වල වැඩිවීමක් සිදු විය. එසේම, භාණ්ඩ හා සේවාවල පිරිවැය ඉහළ යෑම හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව විදුලිය සහ කාර්යාල වියදම්වලද වැඩිවීමක් දක්නට ලැබිණි.

තවද, කාර්ය මණ්ඩල වැටුප් සහ ඉහළ කාර්ය මණ්ඩල ඉල්ලා අස්වීම් සම්බන්ධ ගැටළු සාකච්ඡා කිරීම, පවතින පනත සංශෝධනය කිරීම පිළිබඳ සාකච්ඡා සහ MIS ව්‍යාපෘතියේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා 2023 වර්ෂය තුළ පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල සහ අනු කමිටු රැස්වීම් සංඛ්‍යාව වැඩි වීම නිසා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ දීමනා වැඩි විය.

මෙහෙයුම් වියදම් අතරින්, 2022 වර්ෂයේ කාර්ය මණ්ඩල පිරිවැය වූ රු. 39,456,582/- හා සැසඳීමේ දී, වර්ෂය තුළ කාර්ය මණ්ඩල පිරිවැය රු. 35,050,482/- ක් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 11% ක අඩුවීමකි. සේවක හිඟයට පිළියම් යෙදීම සඳහා මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ක්‍රියාමාර්ග තුළින් වෘත්තීය කාර්ය මණ්ඩලයේ වැටුප් සංශෝධනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පුරප්පාඩු වැඩි සංඛ්‍යාවක් පැවතියද. වැටුප් පිරිවැය ඉහළ ගියේය. තවද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. කාර්ය මණ්ඩල පිරිවැය 2023 වසරේ මෙහෙයුම් වියදම්වලින් 49% ක් නියෝජනය කළ අතර එය පෙර වසරට වඩා 2%ක් අඩු විය.

### 10. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.යේ කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සංවර්ධනය කිරීම

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.යේ මෙහෙයුම් සඳහා මධ්‍යගත කළමනාකරණ තොරතුරු පද්ධතියක් හඳුන්වා දීම මගින් අතින් පවත්වාගෙන යනු ලබන ලේඛන ප්‍රමාණය අවම කිරීම, තොරතුරු ගබඩා කිරීම වැඩිදියුණු කිරීම සහ අභ්‍යන්තර කාර්ය මණ්ඩලය අතර මෙන්ම ප්‍රධාන පාර්ශ්වකරුවන් අතර එනම්, අස්තිත්ව සහ ඔවුන්ගේ විගණකවරුන් අතර තොරතුරු කාර්යක්ෂමව හුවමාරු කර ගැනීමට අපේක්ෂා කෙරේ. මෙම ක්‍රියාවලිය මගින් වෘත්තීය කාර්ය මණ්ඩලය සාමාන්‍ය දත්ත සමුදා කළමනාකරණ ක්‍රියාකාරකම්වලින් නිදහස් කර ගැනීමටත්, නියාමන යාන්ත්‍රණය කෙරෙහි වෘත්තීය නිපුණතා උපයෝගී කර ගැනීම උපරිම කිරීම සඳහා ඔවුන්ට හැකියාව ලබා දීමටත් අපේක්ෂා කෙරේ.

2021 ඔක්තෝම්බර් මාසයේදී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා තෝරාගත් මෘදුකාංග සංවර්ධකයාට රු. මිලියන 38

# ක්‍රියාකාරකම් වාර්තාව - 2023

ක මුළු පිරිවැයකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී. රජයේ අවශ්‍යතාවලට අනුකූලව, කළමනාකරණ තොරතුරු පද්ධති (MIS) ව්‍යාපෘතිය සඳහා උපදේශකයා වශයෙන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) පත් කරන ලදී. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. හි තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවේ අධීක්ෂණය සහ මගපෙන්වීම මත MIS ව්‍යාපෘතිය 2022 වර්ෂයේ 1 වැනි කාර්තුව දක්වා වූ ව්‍යාපෘති කාලසීමාව තුළ ක්‍රමානුකූලව ප්‍රගතියක් ලබා ඇති අතර 2022 මැද භාගය වන විට MIS ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කරන ලදී. කෙසේ වුවද, ලංකා රාජ්‍ය පරිගණක ක්ලවුඩ් පද්ධතිය වෙත ප්‍රවේශය ලබා ගැනීමේ ධාරිතා ගැටළු සහ පසුව ICTA වෙතින් ලංකා රාජ්‍ය පරිගණක ජාලය (LGN) භාවිතයට ප්‍රවේශ වීම හේතුවෙන්, MIS පද්ධතිය සම්පූර්ණ කිරීම සැලැස්මෙන් ඔබ්බට දිගු විය. කෙසේ වුවද, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. හි MIS 2023 දෙසැම්බර් අවසානයේ දී සම්පූර්ණ කරන ලදී. ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු, 2023 වර්ෂයේ දී මෘදුකාංග සංවර්ධකයා වූ Inova IT Systems (Pvt) Ltd වෙත රු. මිලියන 13.56 ගෙවන ලදී.

### 11. පනත සඳහා සිදු කිරීමට නියමිත සංශෝධන

වසර තුළ, 1995 අංක 15 දරන පනත අවලංගු කරමින් නව පනතක් ලෙස සම්මත කිරීමට නියමිත පනත් කෙටුම්පත සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියේ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. ක්‍රියාකාරීව නිරත විය. දැනට නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කෙටුම්පතක් වශයෙන් පවතින නව පනත මගින් නිශ්චිත අස්තිත්ව සහ නිශ්චිත අස්තිත්වවල විගණකවරුන් විසින් දැනට අදාළ වන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් අමතරව, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා තිරසාර ප්‍රමිතීන් අනුගමනය කිරීම අධීක්ෂණය කිරීම සඳහා නියාමන විධානය පුළුල් කිරීමට අපේක්ෂිතය.

# 2023 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම්

## 1. දළ විශ්ලේෂණය

විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් (SBEs) විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (SLAASMB) අඛණ්ඩව අධීක්ෂණය කරයි. එකී කාර්යය ඉටු කිරීමේදී, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් (SBEs) විසින් රටේ මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය ඉහළ නැංවීමට කටයුතු කිරීමේ දී, අදාළ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීමට එම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් පෙළඹවීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් එම මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරයි.

## 2. ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.) විසින් මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණය කිරීම

වර්ෂය තුළ, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 261ක් නියෝජනය කළ මූල්‍ය ප්‍රකාශන කට්ටල 261ක සමාලෝචන කටයුතු සම්පූර්ණ කරන ලදී.

සම්පූර්ණ කරන ලද සමාලෝචනවලට අවදානම් පාදක වූ නිර්ණායක මත තෝරාගත් මූල්‍ය ප්‍රකාශන ද ප්‍රධාන වශයෙන් ඇතුළත් විය. ඒ අනුව, වසර තුළ සම්පූර්ණ කරන ලද සමාලෝචන අතරින් 71%ක් නියාමනය කරන ලද අස්තිත්වවල සමාලෝචන වේ.

පහත (3) කොටසේ විස්තර කර ඇති සමාලෝචන ප්‍රවේශයන් මගින්, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් සමාලෝචනය කරන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් මගින් පනතේ දක්වා ඇති සියලුම කාණ්ඩ නියෝජනය වන බව සහතික කිරීමට සෑම උත්සාහයක්ම ගනු ලැබූ අතර ප්‍රායෝගිකව හැකි තාක් දුරට පුද්ගලික ආයතන වන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය සම්බන්ධයෙන් චක්‍රීය ආවරණයක් සිදු කරන ලදී.

## 3. අධීක්ෂණය සඳහා මූල්‍ය ප්‍රකාශන තෝරා ගැනීම

2021 වර්ෂයේ දී ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් එවකට අනුගමනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමාලෝචන ක්‍රමවේදය සමාලෝචනය කිරීමට සහ ගෝලීය මනා භාවිතයන් සමඟ සමපාත වෙමින්, සමාලෝචන ආවරණය ඵලදායී ලෙස වැඩිදියුණු කිරීම සඳහා සිදු කළ යුතු වෙනස්කම් නිර්දේශ කිරීමට විදේශීය උපදේශකවරයෙකු සම්බන්ධ කර ගන්නා ලදී. උපදේශකවරයාගේ නිර්දේශ මත පදනම්ව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් සමාලෝචනය සඳහා මූල්‍ය ප්‍රකාශන තෝරා ගැනීම සඳහා අහඹු සහ චක්‍රීය ප්‍රවේශයන් සහිත අවදානම් පාදක ප්‍රවේශයක් ඒකාබද්ධ කරමින් මිශ්‍ර ආකෘතියක් අනුගමනය කරන ලදී. වර්ෂය තුළ අවදානම් මත පාදක වූ ප්‍රවේශය යටතේ, කර්මාන්තය කේන්ද්‍ර කරගත් අවදානම් නිර්ණායක මත පදනම්ව, කලින් තීරණය කරන ලද තේමා මත සමාලෝචන පවත්වන ලදී. තවද, ඉහත සඳහන් කර්මාන්ත කේන්ද්‍ර කරගත් අවදානම් නිර්ණායකවලට යටත් නොවන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් තෝරාගනු ලබන්නේ එම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායය සම්බන්ධයෙන් චක්‍රීය ආවරණයක් සිදු කරන ආකාරයට එම තෝරා ගැනීම අහඹු පදනමක් මත සිදු කරමිනි.

ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචන කාර්යයේ ප්‍රවේශයන් පහත පරිදි සිදුවේ;

- මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනය
- කර්මාන්තය කේන්ද්‍ර කරගත් අවදානම් නිර්ණායක මත පදනම් වූ තේමා කේන්ද්‍රීය සමාලෝචනය

## 4. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLAS) අනුකූල වීම නිරීක්ෂණය කිරීම පිළිබඳ ප්‍රතිඵල

වසර තුළදී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ගෙන් ප්‍රමාණාත්මක අපගමන අනාවරණය වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් දෙකකින් එකඟතා ලබා ගන්නා ලදී. ඒ අනුව, 2023 වර්ෂයේ සමාලෝචන සොයාගැනීම් මගින් සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් 1%ක් අනුකූල නොවන බවත්, සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් 74% ක් අනුකූල වන බවත්, මූල්‍ය ප්‍රකාශනවලින් 25% ක් ආධාර ලිපි මගින් සන්නිවේදනය කරන ලද නිරීක්ෂණවලට අනුකූල වූ බවත් අනාවරණය විය. ඔවුන්ගේ මූල්‍ය වාර්තාකරණය වැඩිදියුණු කිරීමේ අරමුණින්, මූල්‍ය ප්‍රකාශන කට්ටල 66 ක් සම්බන්ධයෙන් වසර තුළ කරන ලද නිරීක්ෂණ ආධාර ලිපි මගින් සන්නිවේදනය කර ඇත.

## 5. අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙතින් ලබාගත් එකඟතා සහ නිකුත් කරන ලද අනතුරු ඇඟවීම්

### 5.1 එකඟතාවන්

SLFRS/LKASs වෙතින් අපගමනය වීම පිළිබඳ සොයාගැනීම්වල ප්‍රමාණාත්මකභාවය මත පදනම්ව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් පසුකාලීන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා රාජ්‍ය සංස්ථාවක් වන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය එකකින් සහ කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කර ඇති තවත් ව්‍යාපාරික ව්‍යවසාය එකකින් එකඟතා ලබා ගන්නා ලදී.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (මුල් යෙදුම් සහිත SLFRS/LKAS) අදාළව එකඟතා ලබාගෙන ඇති අයිතම වර්ග සහ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනතේ අවශ්‍යතාවන්ට එම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය දෙක අනුකූල නොවූ ආකාර පහත පරිදි වේ;

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 9, මූල්‍ය වත්කම් හඳුනාගැනීම සහ මැනීමේ අවශ්‍යතා අදාළ කර ගැනීමට අපොහොසත් වීම සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 7, මූල්‍ය උපකරණ: හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවට අනුව හෙළිදරව් කිරීම් සිදු කර නොතිබීම. (9හි 7.11 ඡේදය සහ SLFRS 7හි 4 වන ඡේදය)
- නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන යාමට අපොහොසත් වීම සහ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සඳහා විගණකවරයාට අවශ්‍ය තොරතුරු සැපයීමට අපොහොසත් වීම. (යොමුව; 1995 අංක 15 දරන පනතේ 6 (1) වගන්තිය)

# 2023 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම්

**5.2 නිතිපතිවරයා වෙත යොමු කල කරණු**

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් 2021 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට අපොහොසත් වූ, අසම්පූර්ණ සහ වැරදි තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශයට පත් කරන ලද හා විගණකවරුන් විසින් ව්‍යවනය කරන ලද විගණන මතයක් ප්‍රකාශයට පත් කරන ලද, මූල්‍ය සේවා සැපයීමේ නිරතව සිටින ලැයිස්තුගත සමාගමක් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නීතිපතිවරයාගෙන් විමසා උපදෙස් අපේක්ෂා කරමින් සිටී.

**6. ප්‍රමිතීන්ට අනුකූලවීම වැඩි දියුණු කිරීම සඳහා කරන ලද පුළුල් සමාලෝචනවල සොයා ගැනීම් සන්නිවේදනය කරන ලද නිරීක්ෂණ**

සොයා ගන්නා ලද, ප්‍රමාණාත්මක වූ නමුත් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන භාවිත කරමින් ක්‍රියාපටිපාටි භාවිත කිරීම අවශ්‍ය නොවන SLFRSs/LKASs වලින් අපගමනය වීම් සම්බන්ධයෙන් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙත නිරීක්ෂණ ආකාරයෙන් ආධාර ලිපි මගින් දැනුම් දෙන ලදී. එමඟින්, එම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්වලටම අනාගතයේ දී ඒවායේ අනුකූලතාව වැඩි දියුණු කිරීමට කටයුතු කළ හැකිය.

ඉහත (3) වන කොටස මගින් පැහැදිලි කර ඇති පරිදි, එවැනි සමාලෝචන සිදු කිරීමේ ප්‍රවේශයන් දෙක මත පදනම්ව, මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය පිළිබඳ සොයාගැනීම් සම්බන්ධ විස්තර පහත දක්වා ඇත.

- SLFRS/LKAS වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ මූල්‍ය කාර්ය සාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ අදහසක් ඉදිරිපත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සහතික කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවට අනුකූල නොවීම (යොමුව: 1995 අංක 15 දරන පනතේ 6 (1) වගන්තිය).
- ආයතනය නිරාවරණය වන මූල්‍ය උපකරණවලින් පැන නගින අවදානම්වල ස්වභාවය සහ ප්‍රමාණය, සහ අපේක්ෂිත ණය අලාභවලින් පැන නගින ප්‍රමාණ පිළිබඳ ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු, වාර්තාකරණ කාල සීමාව අවසානයේ ප්‍රමාණවත් ලෙස අනාවරණය කර නොමැති වීම (යොමුව: SLFRS 7 හි ඡේද 31 සිට 42 දක්වා).
- මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් සම්බන්ධයෙන් හානිකරණය පිළිබඳ වෛෂයික සාක්ෂි පවතින විට, ක්‍රමක්ෂය කළ පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම්වල අපේක්ෂිත ණය පාඩු සඳහා අලාභ දීමනාව හඳුනා නොගැනීම (යොමුව: SLFRS 9 හි 5.5.1 ඡේදය).
- භාවිත කරන ලද තක්සේරු ශිල්පීය ක්‍රම, තක්සේරු ක්‍රම සඳහා යෙදවුම්, භාවිතා කරන ලද සැලකිය යුතු ලෙස නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් පිළිබඳ ප්‍රමාණාත්මක තොරතුරු, යෙදවුම් සඳහා සිදු කරන ලද ප්‍රමාණාත්මක ගැළපීම් සහ සාධාරණ වටිනාකමට මනිනු ලබන වත්කම් සහ වගකීම්වල එක් එක් පන්තිය සඳහා සාධාරණ වටිනාකම් ධුරාවලිය ප්‍රමාණවත් ලෙස අනාවරණය කර නොමැතිවීම. (යොමුව - SLFRS 13 හි 93 වන ඡේදය)
- සාමාන්‍ය පරිදි කාර්යසාධන බැඳීම් ඉටු වූ විට, වැදගත් ගෙවීම් නියමයන්, පොරොන්දු වූ භාණ්ඩ/සේවාවල ස්වභාවය, ආපසු එවීමේ/ආපසු ගෙවීමේ වගකීම් සහ වගකීම් වර්ග යනාදී විස්තර වැනි පාරිභෝගිකයන් සමඟ ඇති ගිවිසුම්වලට අදාළ කාර්යසාධන බැඳීම් පිළිබඳ තොරතුරු ප්‍රමාණවත් ලෙස අනාවරණය කර නොතිබුණි (යොමුව: SLFRS 15 හි 119 වන ඡේදය).
- බදුකරුගේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහයන් මත කල්බදු මගින් ඇති කළ හැකි බලපෑම තක්සේරු කිරීමට ප්‍රමාණවත් ලෙස තොරතුරු අනාවරණය නොකිරීම (යොමුව; SLFRS 16 හී 51 වන ඡේදය)
- මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ පදනම සහ මිනුම් පදනම්වලින් සමන්විත වන විශේෂිත ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ/හෝ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා අදාළ වන අනෙකුත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදු කර නොමැති වීම (යොමුව: LKAS 1 හි 112 සහ 117 වන ඡේද).
- බදු වියදම් සහ ගිණුම්කරණ ලාභය අතර සම්බන්ධතාව ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කර නොමැතිවීම සහ බදු පාඩු හේතුවෙන් පැන නගින විලම්බිත බදු වත්කම් හඳුනා ගැනීමට සහාය වන සාක්ෂි ලබා දී නොමැති වීම. (යොමුව: LKAS 12 හි 81 වන ඡේදය)
- භාවිතයට නොගත් බදු අලාභයන් ප්‍රයෝජනයට ගැනීම සඳහා ලබා ගත හැකි අනාගත බදු අය කළ හැකි ලාභ ප්‍රමාණය කුමක් වුවත්, කල් දැමූ බදු වගකීම් හඳුනාගැනීමේදී හෝ කල් දැමූ බදු වත්කම් හඳුනාගැනීමේදී බදු අය කළ හැකි සියලුම තාවකාලික වෙනස්කම් සැලකිල්ලට නොගැනීම (යොමුව; LKAS 12 හි 15, 24, 34 සහ 48 වන ඡේද).
- දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ සියලු තොරතුරු අනාවරණය කර නොමැතිවීම. (යොමුව; LKAS 16 හි 77 වන ඡේදය)
- වත්කමක ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ දී සමාලෝචනය කර නොමැති වීම. (යොමුව; LKAS 16 හි 51 වන ඡේදය).
- සම්බන්ධිත පාර්ශ්ව සබඳතාවල ස්වභාවය මෙන්ම සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගනුදෙනු පිළිබඳ තොරතුරුවලට අදාළව ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් සිදු කර නොමැත. (යොමුව - ශ්‍රී.ලං.ගි.ප්‍ර. 24 හි 18 වන ඡේදය)

# 2023 වර්ෂය තුළදී ලබා ගත් එකඟතා සහ නෛතික උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කරන ලද කරුණු

## ආ). ලබා ගත් එකඟතා

### 1. දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF)

දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය SLFRS 9 - මූල්‍ය උපකරණවල අවශ්‍යතාවන් අදාළ කරගෙන නොතිබුණු අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය SLFRS 7- මූල්‍ය උපකරණ: හෙළිදරව් කිරීම්වල අවශ්‍යතාවයට අනුව හෙළිදරව් කිරීම්ද සිදු කර නොතිබුණි.

විගණකවරුන් මෙම ගැටලුව මත ඔවුන්ගේ මතය තත්ත්වාගණනය කර නොතිබුණි.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් කරන ලද විමසීම්වලින් පසුව, SLFRS 9 සහ SLFRS 7 හි අවශ්‍යතා අදාළ කර ගැනීමට සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත LKAS 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු, වෙනස්කම් හා වැරදි හි අවශ්‍යතාවට අනුකූලව SLFRS 9 අදාළ කර ගැනීම, සම්බන්ධ සංසන්දනාත්මක තොරතුරු 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ගැළපීම් කිරීමට ද දේශීය ණය සහ සංවර්ධන අරමුදල කටයුතු කරන ලදී.

### 2 නවලෝක හොස්පිට්ල්ස් පීඑල්සී (NHP)

කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කර ඇති සමාගමක් වන නවලෝක හොස්පිට්ල්ස් පීඑල්සී සමාගම නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන යාමට සහ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනතේ 6 (1) වැනි වගන්තියෙන් නියම කර ඇති පරිදි 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සඳහා විගණකවරයාට අවශ්‍ය තොරතුරු සැපයීමට අපොහොසත් වී තිබුණි.

විගණකවරයා විසින් එකී මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යවනය කළ මතයක් ප්‍රකාශ කර ඇත.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් කරන ලද විමසීම්වලින් පසුව, නවලෝක හොස්පිට්ල්ස් පීඑල්සී සමාගම විසින් විගණක වාර්තාවේ ව්‍යවනය කළ මතය සඳහා පදනම කොටසේ සඳහන් කර ඇති සියලුම කරුණු නිවැරදි කිරීමටත්, ප්‍රතිඵලයක් ලෙස ඇති වන අවශ්‍ය සියලුම ගැළපුම් සමඟ අදාළ හෙළිදරව් කිරීම් ඇතුළත් කිරීමට සහ ඒවා 2023 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹු කිරීමටත් කටයුතු කරන ලදී.

## ආ) නීති උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කර ඇති කරුණු

### බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී

කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කරන ලද, මූල්‍ය සේවා සැපයීමේ නියැලී සිටින සමාගමක් වන බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී සමාගම 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ අංක 6 (1) වගන්තියේ අවශ්‍යතාවන්ට අනුකූලව 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට අපොහොසත් වී ඇත.

විගණකවරයා විසින් එකී මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යවනය කළ මතයක් ප්‍රකාශ කර ඇත.

සමාගම, එහි මූල්‍ය ප්‍රකාශනවල අසම්පූර්ණ සහ සාවද්‍ය තොරතුරු පළ කර ඇති බව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව, 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ මතයක් ඉදිරිපත් කිරීමට සමාගම අපොහොසත් වී තිබුණි.

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් කරන ලද විමසීම්වලින් පසුව, බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී හි අධ්‍යක්ෂවරුන් දන්වා සිටියේ 2022 මාර්තු 31 සහ 2023 මාර්තු 31න් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන අවසන් කර නොමැති බවත් සමාගමට විගණකවරයෙකු පත් කිරීමට නොහැකි වූ බවත්ය.

මේ හේතුවෙන් 2021 මාර්තු 31 න් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ මතයක් ලබා දෙමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඉදිරිපත් කිරීමට සමාගම අපොහොසත් වීම සම්බන්ධයෙන් සමාගමට සහ/හෝ සමාගමේ අධ්‍යක්ෂවරුන්ට එරෙහිව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. නීතිපතිවරයාගෙන් උපදෙස් ඉල්ලා තිබේ.

# 2023 වර්ෂයේදී විගණන පරීක්ෂණවල සොයාගැනීම්

### 1. දළ විශ්ලේෂණය

ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.) විසින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි (SBEs) මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේ දී, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි (SBEs) විගණකවරුන් විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති (SLAuS) වලට අනුකූල වීම පිළිබඳව අධීක්ෂණය කිරීමේ කාර්යය අඛණ්ඩව සිදු කරන ලදී. දිවයින තුළ විගණනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ සමස්ත අරමුණින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි (SBEs) විගණන පරීක්ෂණ සිදු කරනු ලබයි. එසේ කිරීමේදී, අවදානම් මත පදනම් වූ ප්‍රවේශයක් මගින් මෙන්ම අහඹු තේරීම් ප්‍රවේශයක් මගින් පරීක්ෂා කිරීම සඳහා විගණන තෝරා ගනු ලැබේ.

2022-2023 කාලය තුළ සැලකිය යුතු අවිනිශ්චිතතාවන්ට මුහුණ දුන් ශ්‍රී ලංකා ආර්ථිකය මන්දගාමී සහ ස්ථාවර අන්දමින් ප්‍රකෘතිමත්භාවයට පත් වීම මධ්‍යයේ දිවයිනේ එකම විගණන නියාමකයා වශයෙන් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම., ව්‍යාපාරවලට බලපෑ අවිනිශ්චිතතාවයන් සහ නිවැරදි විනිශ්චයන් සහ ඇස්තමේන්තු ලබා දීමේ දී එම ව්‍යාපාරවලට මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා සම්බන්ධව සැලකිලිමත් විය. මෙම අවිනිශ්චිතතාවයන් ගිණුම්කරණ ඇස්තමේන්තු විගණනය කිරීමේ අවදානම වැඩි කරන අතර විගණකවරුන් ඔවුන්ගේ ප්‍රවේශයන් සම්බන්ධයෙන් වඩාත් සැක සහිත වීම අවශ්‍ය වන අතර, විගණන සිදු කිරීමේදී සැලකිය යුතු වෘත්තීය විනිශ්චයන් ක්‍රියාත්මක කිරීම සහ සදාචාරාත්මක වගකීම් කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

ඒ අනුව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් වසර තුළදී පරීක්ෂා කිරීම සඳහා විගණන තෝරා ගැනීමේ දී, අවදානම් මත පදනම් වූ ප්‍රවේශය අහඹු නියැදි ප්‍රවේශයක් සමඟ ඒකාබද්ධ කළ මිශ්‍ර ආකෘතියක් මත පදනම්ව කටයුතු කරන ලදී.

පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් විගණන පරීක්ෂණ සිදු කරන ලදී.

- ණය සහ බැංකු අත්තිකාරම්වල හානිකරණය පිළිබඳ පුද්ගල තක්සේරුවට අදාළ ගිණුම්කරණ ඇස්තමේන්තු
- අස්තිත්වය සහ එහි පරිසරය සහ තක්සේරු කළ අවදානම්වලට ප්‍රතිචාර දැක්වීම තුළින් ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් පිළිබඳ අවදානම හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම
- ලැයිස්තුගත සමාගම්වල ආයෝජන දේපළ තක්සේරු කිරීම සම්බන්ධයෙන් ගිණුම්කරණ ඇස්තමේන්තු
- වාරික ආදායම සහ රක්ෂණ සමාගම්වල රක්ෂණ ගිවිසුම් වගකීම්වලට අදාළව විශේෂඥයින් භාවිතා කිරීම අවධානය යොමු කරන ලද ඉහත කී විගණන පරීක්ෂණ ක්ෂේත්‍රවලට අමතරව, මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේදී විගණකවරුන් විසින් ක්‍රියාත්මක කරන ලද වෘත්තීය විනිශ්චය සහ සැකමුසුබව පිළිබඳව තක්සේරු කිරීම සඳහා ද ඇතැම් විගණන පරීක්ෂණ සිදු කරන ලදී.

### 2. අඛණ්ඩ විගණන පරීක්ෂණ

ඉකුත් වර්ෂය තුළදී පරීක්ෂා කරන ලද විගණන ආයතන 9ක් විසින් සිදු කරන ලද විගණන 33 සමඟ සැසඳීමේදී, වසර තුළදී, විගණන ආයතන 6ක් විසින් සිදු කරන ලද විගණන 16ක් පරීක්ෂාවට ලක් කරන ලදී. වසර තුළදී ඉල්ලා අස්වීම හේතුවෙන් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.යේ පරීක්ෂණ කාර්ය මණ්ඩලය අඩුවීම, මෙම පරීක්ෂණ සංඛ්‍යාව අඩුවීමට හේතු විය. වර්ෂය තුළ පරීක්ෂා කරන ලද විගණනවලින් 15ක් ජාත්‍යන්තර ජාලවල සාමාජිකයන් වූ ආයතන 5ක් විසින් සිදු කරන ලදී.

පරීක්ෂණ සොයාගැනීම් අතරින්, විගණන 13ක් පරීක්ෂණවලදී අවධානය යොමු කරන ලද ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති (SLAuSs) සමඟ අනුකූල විය. ඉතිරි පරීක්ෂණ 3 හි සොයාගැනීම් සම්බන්ධයෙන් ව්‍යවස්ථාව යටතේ වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය නොවූ අතර එම සොයාගැනීම් නිරීක්ෂණ ලිපි මගින් අදාළ විගණකවරුන් වෙත දැනුම් දෙන ලදී.

### 3. බලාත්මක කිරීම

#### 3.1. බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ දළ විශ්ලේෂණය

විගණන පරීක්ෂා කිරීම්වලදී සිදු කරන ලද නිරීක්ෂණවල ප්‍රබලතාව මත පදනම්ව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම.ය, ශ්‍රී ලංකාවේ විගණන වල ගුණාත්මක පරිසරය වැඩිදියුණු කිරීමේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා විගණන පරීක්ෂණ වල සොයා ගැනීම් වල ප්‍රබලතාවය මත පදනම්ව විගණනවරුන් විගණන තමා විසින්ම වැඩි දියුණු කර ගැනීමට සුදුසු අකාරයේ විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරයි. නිත්‍ය විගණන පරීක්ෂණවලදී ව්‍යවස්ථාව යටතේ වැඩිදුර ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය නොවන, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති (SLAuSs) සමඟ අනුකූල නොවීම් නිරීක්ෂණය වූ අවස්ථාවල දී, එවැනි අඩුපාඩු "නිරීක්ෂණ ලිපි" වශයෙන් හඳුන්වන සහාය ලිපියක් මගින් විගණන ආයතන වෙත දැනුම් දෙනු ලැබේ. විගණනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා වැඩිදියුණු කිරීම් සිදු කිරීම අවශ්‍ය වූ අවස්ථාවල දී, එවැනි වැඩිදියුණු කිරීම් "වැඩිදියුණු කිරීම සඳහා යෝජනා" ලෙස සන්නිවේදනය කෙරේ.

මීට අමතරව, නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයක (SBEs) විගණනයක් පැවැත්වීමේදී, මූලික සදාචාරාත්මක මූලධර්ම ක්‍රියාත්මක කිරීමට විගණකවරයා අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය වූ අවස්ථාවල දී, එම විගණන ආයතනයේදී මූල්‍ය ප්‍රකාශන විගණන සිදු කරන විට, අදාළ විගණන ප්‍රමිතිවල අවශ්‍යතාවලට අනුකූලව අනලස්ව කටයුතු කළ යුතු බවට නියම කරමින් මණ්ඩලයේ අනුමැතිය සහිතව අදාළ විගණන ආයතනයට අනතුරු ඇඟවීමේ ලිපියක් (Letter of Warning) නිකුත් කරනු ලැබේ. තවද, ගැටළුවල වැදගත්කම මත පදනම්ව, අවශ්‍ය අවස්ථාවලදී, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් නිරීක්ෂණය කරන ලද විගණන ප්‍රමිති අපගමනය වීම් සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා එම කරුණු නීතිපතිවරයා වෙත යොමු කරන අතර, විගණනයේ ගුණාත්මකභාවයේ අඩුපාඩු පවතින විට, එවැනි කරුණු විගණකවරුන්ගේ බලපත්කරණ අධිකාරිය වන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය වෙත සහ අදාළ වන පරිදි විගණනය කරනු ලබන ආයතනය පාලනය කරන වෙනත් ඕනෑම නියාමකයෙකුට යොමු කරනු ලැබේ.

#### 3.2. වර්ෂය තුළ ගන්නා ලද බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග

##### 3.2.1. සහායක ලිපිය

2022 වර්ෂය තුලදී විගණන 9ක දුර්වලතා සන්නිවේදනය කරමින් ආයතන 5කට නිරීක්ෂණ ලිපි නිකුත් කිරීම හා සැසඳීමේ දී, වර්ෂය තුළ, විගණන සිදු කිරීමේදී නිරීක්ෂණය කරන ලද, ව්‍යවස්ථාව යටතේ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය නොවූ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs)

# 2023 වර්ෂයේදී විගණන පරීක්ෂණවල සොයාගැනීම්

අනුකූල නොවීම් පිළිබඳව "නිරීක්ෂණ ලිපි" නම් වූ ආධාර ලිපි විගණන කටයුතු 3ක් සම්බන්ධයෙන් ආයතන 3ක් වෙත නිකුත් කරන ලදී.

## 4. වැදගත් සොයාගැනීම්

වර්ෂය තුළ විගණකවරුන් වෙත සන්නිවේදනය කරන ලද වැදගත් සොයාගැනීම් පහත දක්වා ඇත.

### 4.1. අවදානම් තක්සේරුව

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයේ තක්සේරු කරන ලද අවදානම් සඳහා ප්‍රතිචාර සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පදනමක් සැපයීමට විගණකවරයාට හැකි වන පරිදි විගණකවරයා විසින් ආයතනයේ අභ්‍යන්තර පාලන ඇතුළුව, ආයතනය සහ එහි පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම තුළින් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශවල අවදානම හඳුනා ගැනීමට සහ තක්සේරු කිරීමට අවදානම් තක්සේරු ක්‍රියා පටිපාටි සිදු කිරීම අවශ්‍ය වේ.

එවැනි අවදානම් තක්සේරු ක්‍රියා පටිපාටි සිදු කිරීම සම්බන්ධයෙන් සන්නිවේදනය කරන ලද අඩුපාඩුවලට පහත සඳහන් දෑ ඇතුළත් විය.

- ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයේ අවදානම් පිළිබඳ සවිස්තරාත්මක හඳුනාගැනීමක් සහ තක්සේරුවක් සිදුකිරීමට ආයතනය සහ එහි පරිසරය පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ලබාගෙන නොතිබුණි.
- සවිස්තරාත්මක අවදානම් තක්සේරුවක් සිදු කර නොතිබුණි.
- වංචනික ක්‍රියාවන් හේතුවෙන් ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනවල අවදානම හඳුනා ගැනීම සඳහා ප්‍රමාණවත් විගණන ක්‍රියා පටිපාටි සිදු කර නොතිබුණි.

### 4.2. තක්සේරු කළ අවදානම් සඳහා විගණකගේ ප්‍රතිචාර

විගණකවරයා විසින් ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනවල තක්සේරු අවදානම විසඳීම සඳහා සුදුසු ප්‍රතිචාර සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. තක්සේරු කළ අවදානම් සම්බන්ධයෙන් විගණකවරයාගේ ප්‍රතිචාරවලට අදාළව සන්නිවේදනය කරන ලද අඩුපාඩු පහත පරිදි වේ.

- පාලනවල මෙහෙයුම් කාර්යක්ෂමතාව පරීක්ෂා කිරීමේදී පාලනවලින් අපගමනය වීම් අනාවරණය වූ අවස්ථාවල, විගණකවරයා විසින් එවැනි පාලනයන් මත විශ්වාසය තැබීමට පෙර අපගමන සහ ඒවායේ විභව ප්‍රතිවිපාක අවබෝධ කර ගැනීමට ප්‍රමාණවත් විමසීම් කර නොතිබුණි.
- ඇතැම් පාලනයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක නොවන බව දැක්වෙන තොරතුරු විගණකවරයාගේ අවධානයට යොමු වූ අවස්ථාවක, අවදානම් තක්සේරුව සංශෝධනය කිරීමට සහ සැලසුම් කළ ක්‍රියා පටිපාටි වෙනස් කිරීමට අවශ්‍ය බව විගණකවරයා විසින් තහවුරු කර නොතිබුණි.
- විවිධ ආදායම් වර්ග සඳහා උත්පාදනය කරන ලද විවිධ ඉන්වොයිසි මාලාවන් කෙරෙහි අවධානය යොමු කරමින් ආදායම් පිළිබඳ සුදුසු කඩඉම් පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.
- වාර්තා කරන දිනට තොගයේ පැවැත්ම සහ තත්ත්වය සම්බන්ධයෙන් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් විගණන ක්‍රියා පටිපාටි සිදු කර නොතිබුණි.
- සත්‍යාපනය කරන ලද විකුණුම් ඉන්වොයිසිවල නියැදියේ විස්තර විගණන වැඩ ගොනුවේ ලේඛනගත කර නොතිබුණි.
- බැංකු ශේෂ, පොළී සහිත ණය සහ කල්බදු ශේෂ සම්බන්ධයෙන් විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා විගණකවරයා විසින් බාහිර තහවුරු කිරීමේ ක්‍රියා පටිපාටි සිදු කර නොතිබුණි.

### 4.3. විගණන සාක්ෂි

විගණකවරයාගේ මතය පදනම් කර ගැනීම සඳහා සාධාරණ නිගමනවලට එළඹීමට හැකි වන පරිදි ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමට විගණකවරයාට හැකි වන පරිදි විගණකවරයා විසින් විගණන ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

විගණන සාක්ෂි රැස් කිරීමට අදාළව පහත සඳහන් අඩුපාඩු සන්නිවේදනය කරන ලදී.

- විගණකවරයා විසින් පුද්ගලික සමාගමක වෙළඳ ලැබිය යුතු දෑ, මිලදී ගැනීම්, සම්බන්ධිත පාර්ශ්ව ශේෂ සහ පොළී සහිත ණය සහ ණය ගැනීම් සම්බන්ධ විගණන ක්‍රියා පටිපාටි සිදු කිරීම මගින් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබාගෙන නොතිබුණි.

### 4.4. ගිණුම් ඇස්තමේන්තු විගණනය කිරීම

විගණකවරයා විසින් අදාළ වන මූල්‍ය වාර්තාකරණ රාමුවේ සන්දර්භය තුළ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ඇස්තමේන්තු සහ අදාළ හෙළිදරව් කිරීම් සාධාරණද යන්න පිළිබඳව ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම අවශ්‍ය වේ.

ගිණුම්කරණ ඇස්තමේන්තුවලට අදාළ ප්‍රමාණවත් විගණන ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමට විගණකවරයා අසමත් වූ අවස්ථා වන්නේ;

- කළමනාකරණ විශේෂඥතාවයේ නිපුණතාවය, හැකියා සහ අරමුණුගත බව සහ කළමනාකරණ විශේෂඥතාවයේ කාර්යයේ යෝග්‍යතාවය ඇගයීමට ලක් කර නොතිබුණි.
- වත්කම්වල සාධාරණ වටිනාකම් නිගමනය කිරීමේ දී භාවිතා කරන ලද උපකල්පනවල සාධාරණත්වය ඇගයීමට ලක් කර නොතිබුණි.

### 4.5. පාලනය කරන පාර්ශව සමඟ සන්නිවේදනය කිරීම (TCWG)

විගණකවරයා විසින් මූල්‍ය ප්‍රකාශන සහ විගණනය සම්බන්ධයෙන් විගණකවරයාගේ වගකීම් සන්නිවේදනය කිරීම, සැලසුම්ගත විෂය පථය සහ විගණන කාලය පිළිබඳ දළ විශ්ලේෂණයක් සැපයීම සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ වගකීම සම්බන්ධයෙන් වැදගත් සහ අදාළ වන කාලානුරූපී නිරීක්ෂණ සැපයීම සහ විගණකවරයා සහ පාලනය කරන පාර්ශව අතර ඵලදායී ද්වි-මාර්ග සන්නිවේදනයක් ප්‍රවර්ධනය කිරීම අවශ්‍ය වේ.

විගණකවරයා විසින් පාලනය කරන පාර්ශව සමඟ සිදු කරන ලද සන්නිවේදන සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු සන්නිවේදනය කරන ලදී;

# 2023 වර්ෂයේදී විගණන පරීක්ෂණවල සොයාගැනීම්

- අඛණ්ඩ පැවැත්මක් සහිත අස්තිත්වයක් වශයෙන් කටයුතු කිරීමට ආයතනයට ඇති හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති විය හැකි සිදුවීම් හෝ කොන්දේසි හඳුනාගත් අවස්ථාවක අස්තිත්වයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව පාලනය කරන පාර්ශව සමඟ ප්‍රමාණවත් සන්නිවේදනයක් සිදු කර නොතිබුණි.
- විගණකවරයාට පාලනය කරන පාර්ශව සමඟ ඵලදායී ද්වි-මාර්ග සන්නිවේදනයක් සිදු කර ඇති බව විගණන ලේඛනවල පැහැදිලිව දක්නට නොලැබුණි.

## 4.6. අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී කළමනාකරණය විසින් ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම භාවිත කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව විගණකවරයා විසින් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම අවශ්‍ය වන අතර, ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව, ආයතනය අඛණ්ඩ පැවැත්මක් සහිත ආයතනයක් වශයෙන් ඉදිරියට යෑමට ආයතනය සතු හැකියාව සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න නිගමනය කිරීම සහ විගණකගේ වාර්තාව සඳහා සිදු විය හැකි බලපෑම් පිළිබඳව නිශ්චය කිරීම ද අවශ්‍ය වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී කළමනාකරණය විසින් ගිණුම්කරණයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම භාවිත කිරීමේ යෝග්‍යතාවය පිළිබඳව තක්සේරු කිරීමට අදාළව පහත සඳහන් අඩුපාඩු සන්නිවේදනය කරන ලදී.

- ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවල පැවත්මක් නොමැතිව සිදුවීම් හෝ තත්ත්වයන් හඳුනාගෙන ඇති අවස්ථාවක, අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් ආයතනය සතු හැකියාවට අදාළව මූල්‍ය ප්‍රකාශනවල සිදු කරන ලද හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත්භාවය ඇගයීමට අපොහොසත් වීම.

## 5. වැඩිදියුණු කිරීම් සඳහා යෝජනා

විගණනයේ ගුණාත්මකතාව වැඩිදියුණු කිරීමේ අරමුණින්, වසර තුළ විගණන ආයතන තුන (3) ක් මගින් සිදු කරන ලද විගණන කටයුතු තුනකට (3) අදාළව වැඩිදියුණු කිරීම් සඳහා යෝජනා සන්නිවේදනය කර ඇත. විගණකවරයා විසින් අනාගතයේ විගණන කටයුතු සිදු කිරීමේදී මෙම යෝජනා මත පදනම්ව වැඩිදියුණු කිරීම් සිදු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සන්නිවේදනය කරන ලද වැඩිදියුණු කිරීම් සඳහා පහත සඳහන් යෝජනා ඇතුළත් විය;

- සිදු කරන ලද විගණන පටිපාටිවල ස්වභාවය, කාලය සහ ප්‍රමාණය අවබෝධ කර ගැනීම සඳහා විගණන ලේඛන වැඩිදියුණු කිරීම.
- ජර්නල් ඇතුළත් කිරීම් පරීක්ෂා කිරීමේදී, සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලින් බැහැරව සකස් කරන ලද වංචනික ජර්නල් ඇතුළත් කිරීම් හෝ වෙනත් ගැළපීම්වල ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කිරීම.
- විශ්වාසනීය තොරතුරු මූලාශ්‍ර මගින් එවැනි අදාළ සමාගමක මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය ඇගයීම මගින් අඛණ්ඩව මූල්‍ය සහාය සැපයීමට අදාළ සමාගමට ඇති හැකියාව සම්බන්ධයෙන් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම.
- කළමනාකාරිත්වය විසින් පුරෝකථන පිළියෙළ කිරීමේ දී භාවිත කරන පාදක දත්තවල විශ්වසනීයත්වය තක්සේරු කිරීම සහ පුරෝකථනය කරන ලද දත්ත නවතම ප්‍රතිඵල සමඟ සංසන්දනය කිරීම මගින් පුරෝකථනවලට පාදක වන උපකල්පන සඳහා ප්‍රමාණවත් ලෙස සහාය වේද යන්න නිර්ණය කිරීම.
- සමාගමේ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල සන්දර්භය තුළ සමාගම විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය ඇගයීම

## 6. විගණන ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් ගන්නා ලද අනෙකුත් ක්‍රියාමාර්ග

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ මහජන විශ්වාසය ගොඩනැගීමේ ප්‍රධාන සාධකයක් වන්නේ විගණනයේ ගුණාත්මකභාවයයි. ඒ අනුව, දිවයිනේ විගණන ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

### 6.1. විගණන පරීක්ෂණවල සොයාගැනීම් විගණන කමිටු වෙත සන්නිවේදනය කිරීම

විගණන කමිටුව පාලනය කරන පාර්ශවවල කොටසක් නියෝජනය කරනු ලබන අතර, එම කමිටුවට ආයතනයේ උපායමාර්ගික දිශාව සහ ආයතනයේ වගකිවයුතුබව සම්බන්ධ වගකීම් අධීක්ෂණය කිරීමේ වගකීම පැවරී ඇත. ඒ අනුව, සමාගමක මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේ ගුණාත්මක බව සහතික කිරීම සහ විගණකවරයා සමඟ යෝග්‍ය සබඳතා පවත්වා ගැනීම සම්බන්ධයෙන් විගණන කමිටුව සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. මූල්‍ය වාර්තාකරණයේ සහ විගණන පරිසරයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා පාලනය කරන පාර්ශවය වශයෙන් විගණන කමිටුවල දායකත්වය ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් අඛණ්ඩව හඳුනා ගනී. ඒ අනුව, මූල්‍ය වාර්තාකරණයේ ඵලදායී අධීක්ෂණය පෝෂණය කිරීම සඳහා ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් කොළඹ කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කර ඇති සමාගම්වල විගණන පරීක්ෂණ වලදී එම කමිටු සභාපතිවරුන් වෙත එම විගණන පරීක්ෂණවල ප්‍රතිඵල අඛණ්ඩව සන්නිවේදනය කරයි.

### 6.2. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. යේ පාර්ශවකරුවන්ට විගණන පරීක්ෂණවල සොයාගැනීම් පිළිබඳව සන්නිවේදනය කිරීම

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන්නන්, විගණකවරුන්, සම නියාමකයින්, ශ්‍රී ලංකා රජය සහ සාමාන්‍ය ජනතාව එහි පාර්ශවකරුවන් ලෙස හඳුනා ගනී. පාර්ශ්වකරුවන්ගේ දැනුම වැඩි දියුණු කිරීම මගින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. ශ්‍රී ලංකාවේ මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය ඉහළ නැංවීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මඟ පෙන්වයි. ඒ අනුව ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම මෑත වසරවල සිදු කරන ලද විගණන පරීක්ෂණ වලදී පොදු සොයාගැනීම් පිළිබඳ සැසියක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහයෝගිතාවය තුලින් එහි පාර්ශවකරුවන් සමඟ පවත්වන ලදී. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි (SBEs) විගණන සිදුකරන විගණකවරුන් මෙන්ම විගණකවරයා සමඟ ඵලදායී සන්නිවේදනයක් සිදු කරනු ඇතැයි අපේක්ෂිත විගණන කමිටු සාමාජිකයින් දැනුවත් කිරීම සඳහා එහි පාර්ශවකරුවන් සමඟ මෙවැනි සොයාගැනීම් බෙදාගැනීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීමට අපේක්ෂා කරයි.

# 2023 වර්ෂයේදී විගණන පරීක්ෂණවල සොයාගැනීම්

### 6.3. විගණනයේ ගුණාත්මකභාවයට සහාය දැක්වීම සඳහා පවතින ජාත්‍යන්තර අනුබද්ධතා

6.3.1 ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. 2007 වසරේ පවත්වන ලද ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදයේ (IFIAR) පළමු පූර්ණ රැස්වීමේ සිට එහි සාමාජිකයෙකු වීම හේතුවෙන් වසර තුළ අථත්‍ය රැස්වීම් ලෙස පවත්වන ලද IFIAR රැස්වීම්වලට සහභාගී වූ අතර එහි තොරතුරු රැස් කිරීමේ ක්‍රියාකාරකම් සඳහා දායකත්වය ලබා දෙන ලද අතර එහි දෛනික සමීක්ෂණවලට ද සහභාගී විය.

6.3.2. ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. 2007 වර්ෂයේ සිට ජාත්‍යන්තර විගණන සහ සහතික කිරීමේ ප්‍රමිත මණ්ඩලයේ (IAASB) උපදේශක කණ්ඩායම්වල සාමාජිකයෙකු වන අතර 2009 වර්ෂයේ සිට ගණකාධිකාරීවරුන් සඳහා වන ජාත්‍යන්තර ආචාර ධර්ම ප්‍රමිත මණ්ඩලයේ (IESBA) උපදේශක කණ්ඩායමේ සාමාජිකයෙකි. වර්ෂය තුළ, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් විගණනය සහ ආචාර ධර්ම සම්බන්ධ ප්‍රමිතීන් පිළිබඳ සාකච්ඡා සඳහා දුරස්ථව පවත්වන ලද රැස්වීම්වලට දායකත්වය ලබා දී ඇත.

### 6.4. ස්වාධීන විගණන නියාමකයින්ගේ ජාත්‍යන්තර සංසදයෙහි (IFIAR) 25% අඩු කිරීමේ ප්‍රයත්නය සඳහා සහභාගී වීම

IFIAR ගෝලීය පදනමින් විගණනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා කැපවී කටයුතු කරන ආයතනයක් වශයෙන්, සැසඳීම සඳහා 2019 පදනම් වර්ෂය යොදා ගනිමින්, 2019 වර්ෂයේ සමීක්ෂණයේ සොයාගැනීම් සැලකිල්ලට ගනිමින්, වසර හතරක සොයාගැනීම් සමඟ පරීක්ෂා කරන ලද විගණන අනුපාතයේ වෙනස්කම් නිරීක්ෂණය කිරීම සඳහා 25% අඩු කිරීමේ ඉලක්කගත සමාරම්භක වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් බීඩීඕ, ඩිලොයිට්, අර්න්ස්ට් සහ යං, ග්‍රාන්ට් තෝන්ටන්, කේපීඑම්ජී සහ ප්‍රයිස්වෝටර්හවුස්කුපර්ස් ඇතුළත් ගෝලීය මහජන ප්‍රතිපත්ති කමිටුවේ (GPPC) ව්‍යාපාර සමාගම් සොයා ගැනීම් එකක් හෝ කිහිපයක් සහිත ලැයිස්තුගත පොදු සමාගම් (PIE) වලට අදාළ විගණනවල සොයාගැනීම්වල ප්‍රතිඵල මැනීම සම්බන්ධයෙන් IFIAR හා එකඟ වී ඇත. ඒ අනුව, 2019 වසරේ සිට ආරම්භ වී වාර්ෂික පදනමින් ඉහත කී ජාත්‍යන්තර ජාලයන්හි දේශීය සමාගම්වලට අදාළ සමීක්ෂණ කාලසීමාව තුළ අවසන් කරනු ලබන විගණන පරීක්ෂණවල අදාළ සොයාගැනීම් දේශීය මට්ටමින් IFIAR වෙත ඉදිරිපත් කිරීමට ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. මගින් භාරගෙන ඇත.

## ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයෙහි කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා අනුගමනය කළ යුතු කෙටි කාලීන සහ මධ්‍ය කාලීන පියවර

| ආයතනික කාර්යසාධනය සම්බන්ධ ගැටළු | සැලසුම් කරන ලද කෙටි කාලීන පියවර | සැලසුම් කරන ලද මධ්‍ය කාලීන පියවර |
|---|---|---|
| නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය යන නිර්වචනය තුළට ගැනෙන සියලුම ආයතන ආවරණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන ලැබීම පුළුල් කිරීම | • සම-නියාමකයින් විසින් ප්‍රකාශයට පත් කරන ලද ලැයිස්තු පසු විපරම් කිරීම සහ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් හඳුනා ගැනීම<br>• නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි නිර්ණායක සපුරා තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා හඳුනාගත් ආයතන පිළිබඳව පසු විපරම් කිරීම.<br>• මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සම-නියාමකයන්ගේ පාර්ශවකරුවන් තුළ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම<br>• පුවත්පත්වල සහ වෙබ් අඩවියේ නිතිපතා ප්‍රසිද්ධ කිරීම | පැනවීමට නියමිත නව පනත හරහා මේ පිළිබඳව කටයුතු කිරීම |
| ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. හි නව පනත නිකුත් කිරීමත් සමඟ සංවිධානයේ විෂය පථය වැඩි වීම | • නව පනත පැනවීමේ දී, රාජ්‍ය අංශයේ ආයතනවල මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සිදුකිරීමට ආකෘතිපත්‍ර සහ සමාලෝචන ක්‍රමෝපාය පිළියෙළ කිරීම | • නව පනත ක්‍රියාත්මක කිරීමත් සමඟ රාජ්‍ය අංශයේ ආයතනවල සමාලෝචනය සිදු කිරීම.<br>• නව පනත ක්‍රියාත්මක වීමත් සමඟ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය සම්බන්ධයෙන් ගත යුතු බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීමට හැකි වීම.<br>• නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය සහ ඔවුන්ගේ විගණකවරුන් විසින් අනුගමනය කරන ලද තිරසාර ගිණුම්කරණය සහ සහතික කිරීමේ ප්‍රමිතවලට අනුකූල වීම අධීක්ෂණය කිරීම. |
| මූල්‍ය ප්‍රකාශන සමාලෝචන ආවරණය වැඩි කිරීම | • සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය මත පදනම්ව පවතින සියලුම පුරප්පාඩු පිරවීම සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.<br>• මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමේදී තාක්ෂණික කාර්ය මණ්ඩලයට සහාය වීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යාපාර මට්ටමේ සිසුන් සහ මූල්‍ය උපාධි අපේක්ෂකයන් පුහුණුවන්නන් ලෙස යොදවා ගැනීම<br>• අනුමත සේවක සංඛ්‍යාවේ තාක්ෂණික තනතුරු සියල්ල සඳහා බඳවා ගන්නා තෙක් මූල්‍ය ප්‍රකාශනවල මූලික සමාලෝචන කටයුතු සඳහා බාහිර සමාලෝචකයන් වැඩි සංඛ්‍යාවක් යොදවා ගැනීම. | • සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය මත පදනම්ව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම මගින් අනුමත සේවක සංඛ්‍යාවේ (නියෝජ්‍ය අධ්‍යක්ෂ තාක්ෂණික තනතුරු 6) පුරවා නොමැතිව ඉතිරි වී ඇති තනතුරු පිරවීම තුළින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සංඛ්‍යාව වැඩි කිරීම.<br>• MIS ක්‍රියාත්මක කිරීම මගින් ඉතිරි වන කාලය උපයෝගී කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සඳහා වැඩි කාලයක් වෙන් කිරීම. |
| සැලසුම්ගත විගණන පරීක්ෂණ සංඛ්‍යාව සම්පූර්ණ කිරීම | • සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය මත පදනම්ව පවතින සියලුම පුරප්පාඩු පිරවීම සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.<br>• අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර විගණනයේ හඳුනාගත් අධි අවදානම් ක්ෂේත්‍රවලට සීමා කරමින් විගණන පරීක්ෂණ පැවැත්වීම.<br>• අධි අවදානම් ආයතනවල මූල්‍ය ප්‍රකාශන ද ප්‍රමාණවත් පරිදි ආවරණය වන පරිදි, මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණ සමාලෝචන සහ අවධානය යොමු කරන ක්ෂේත්‍ර පිළිබඳ සමාලෝචන අතර නිවැරදි සමතුලිතතාවයක් ඇති කර ගැනීමෙන් ඉතිරි වන කාලය උපයෝගී කර ගනිමින් වැඩිපුර විගණන පරීක්ෂණ පැවැත්වීම සඳහා කාලය වෙන් කිරීමට පහසුකම් සැලසීම. | • සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටි මත පදනම්ව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම මගින් අනුමත සේවක සංඛ්‍යාවේ පුරවා නොමැති ඉතිරි තනතුරු පිරවීමෙන් විගණන පරීක්ෂණ සංඛ්‍යාව වැඩි කිරීම.<br>• MIS ක්‍රියාත්මක කිරීමෙන් ඉතිරි වන කාලය උපයෝජනය කරමින් විගණන පරීක්ෂණ සඳහා වැඩි කාලයක් වෙන් කිරීම. |

## ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයෙහි කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා අනුගමනය කළ යුතු කෙටි කාලීන සහ මධ්‍ය කාලීන පියවර

| ආයතනික කාර්යසාධනය සම්බන්ධ ගැටළු | සැලසුම් කරන ලද කෙටි කාලීන පියවර | සැලසුම් කරන ලද මධ්‍ය කාලීන පියවර |
|---|---|---|
| පාර්ශවකරුවන්ට කාලීන තොරතුරු සැපයීම | • වාර්ෂික ප්‍රකාශනවලට අමතරව, අවධානය යොමු කරන එක් එක් ක්ෂේත්‍රයේ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනවලින් හෙළිදරව් වන සොයාගැනීම් පිළිබඳ සවිස්තර වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම | • ප්‍රකාශයට පත් කිරීමට නියමිත මීළඟ මූල්‍ය ප්‍රකාශන මාලාවේ නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා සමාලෝචනවලින් හෙළිදරව් වන සොයා ගැනීම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙත දැනුම් දීමට හැකි වන පරිදි කෙටිම කාලසීමාව තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචන කාල නියම කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම.<br><br>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා ලබා දිය හැකි කාලසීමාව සඳහන් කරමින් පනත සංශෝධනය කිරීම මගින් මෙම ප්‍රවේශය ක්‍රියාත්මක කිරීමට හැකි වනු ඇත. |
| පළපුරුදු දක්ෂ කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමේ සහ රඳවා තබා ගැනීමේ දුෂ්කරතා. | • වෙළෙඳපොළ පාදක වූ වැටුප් සමඟ වැටුප් පෙළගැස්වීමේ හැකියාව තක්සේරු කිරීම.<br>• වැඩ නිශ්චිත පුහුණුව සහ පුද්ගල සංවර්ධන වැඩසටහන් මගින් දැනුම වැඩි දියුණු කිරීම<br>• වඩාත් නම්‍යශීලී වැඩ විධිවිධාන අනුගමනය කිරීම (පිටස්තර කාර්ය මණ්ඩලය සඳහා නිවසේ සිට වැඩ කිරීම, නම්‍යශීලී කාල විධිවිධාන) | • කාර්ය මණ්ඩලය සඳහා විදේශීය පුහුණු අවස්ථා ලබා ගැනීම<br>• විදේශීය සම නියාමකයින් සමඟ වැඩ කිරීමට කාර්ය මණ්ඩලයට ඇති හැකියාව තක්සේරු කිරීම<br>• කොළඹින් පිටත වාසය කරන කාර්ය මණ්ඩලයට කාර්යාලයට යාමේ පහසුව සඳහා ශාඛා ස්ථාපනය කරන ආකාරයෙන් ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. හි නිලධාරීන් කොළඹින් පිටත ස්ථාපනය කිරීම |
| සමාලෝචන කාර්යය වැඩි දියුණු කිරීම සඳහා නවීන කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS - II වන අදියර) නොමැති වීම | • ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. මගින් මෑතකදී නිම කරන ලද MIS (වැඩ ප්‍රවාහ කළමනාකරණ පද්ධතියට අදාළව) නුදුරේදීම ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර, MIS ව්‍යාපෘතියේ II අදියර සංවර්ධනය සඳහා වෙනත් සැලසුම්ගත කෙටි කාලීන පියවර නොමැත. | • මූල්‍ය ප්‍රකාශන සහ විගණන පරීක්ෂණ සම්බන්ධ සමාලෝචනවල දී අධීක්ෂණ කාර්ය මණ්ඩලයට සහාය වීම සඳහා විශ්ලේෂණාත්මක අංශ කෙරෙහි අවධානය යොමු කරන MIS සංවර්ධන ව්‍යාපෘතියේ II අදියර සංවර්ධනය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම.<br>• MIS ව්‍යාපෘතියේ II අදියර සංවර්ධනය සඳහා සැලැස්ම ** |
| වැඩි වූ කාර්ය මණ්ඩලය සඳහා කාර්යාල ඉඩකඩ පහසුකම් සැලසීම | • මෙම වසරේ ව්‍යාපෘතිය සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කර නොමැතිවීම හේතුවෙන් කෙටි කාලීන ක්‍රියාමාර්ග සැලසුම් කර නොමැත. | • කාර්යාල අවකාශයේ අභ්‍යන්තර සැලසුම් සහ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීම අඛණ්ඩව සිදු කිරීම |
| පනතේ දක්වා ඇති පරිදි සෙස් බද්දක් ක්‍රියාත්මක කිරීම | • ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. හි මෙහෙයුම් සඳහා මුදල් සැපයීමට ප්‍රමාණවත් වන පරිදි අයබදු ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම. | • සෙස් බද්ද ක්‍රියාත්මක නොකරන තත්ත්වයක් තුළ, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. යේ ස්වයං මූල්‍යන කටයුතු සඳහා ආදායම් රැස් කිරීමේ මාර්ග සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම |

** දිගුකාලීන පියවර

# කාර්යසාධන ලකුණු පත

ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. එහි වාර්ෂික කාර්යසාධනය සැලසුම් කිරීම සඳහා කාර්යසාධන ලකුණු පත භාවිතා කරයි. 2023 සඳහා සැලැස්ම, 2023 සඳහා තථ්‍ය කාර්යසාධනය සහ 2024 සඳහා සැලැස්ම පහත දක්වා ඇත;

මූල්‍ය ප්‍රකාශන පරිශීලක දෘෂ්ටිකෝණය - අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා, මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන් අපව දැකිය යුත්තේ කෙසේද?

| ඉලක්ක | ක්‍රියාමාර්ග | 2023 සැලසුම (සංශෝධනය) (සටහන 1) | 2023 තත්‍ය සටහන | | 2024 සැලසුම තාවකාලික (සටහන 2) |
|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | සැලසුමේ % ක් ලෙස | |
| සත්‍ය සහ සාධාරණ මතයක් ඉදිරිපත් කිරීම සඳහා නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්හි මූල්‍ය ප්‍රකාශන | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලද යන්න තීරණය කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම | මූල්‍ය ප්‍රකාශන කට්ටල 252ක් | මූල්‍ය ප්‍රකාශන කට්ටල 261ක් | 103 | 680 |
| | ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලද යන්න තීරණය කිරීම සඳහා විගණන පරීක්ෂා කිරීම | 16 විගණන | 16 විගණන | 100 | 38 |

**නියාමනයට භාජනය වූ අස්ථිත්ව දෘෂ්ටිකෝණය:** අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා, නියාමනයට භාජනය වූ ආයතන අපව දැකිය යුත්තේ කෙසේද?

| ඉලක්ක | ක්‍රියාමාර්ග | 2023 සැලසුම (සංශෝධනය) (සටහන 1) | 2023 තත්‍ය සටහන | | 2024 සැලසුම තාවකාලික (සටහන 3) |
|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | සැලසුමේ % ක් ලෙස | |
| මූල්‍ය ප්‍රකාශන එකතු කිරීම | ලැබුණු මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 1,665 | 1,732 (නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් සංඛ්‍යාව1,566) | 104 | 1,707 |

# කාර්යසාධන ලකුණු පත

**අභ්‍යන්තර ක්‍රියාවලි දෘෂ්ටිකෝණය:** අපගේ පාර්ශවකරුවන් තෘප්තිමත් කිරීම සඳහා අප විශිෂ්ටත්වය දැක්විය යුත්තේ කුමන අභ්‍යන්තර ක්‍රියාවලියක් සම්බන්ධයෙන් ද?

| ඉලක්ක | ක්‍රියාමාර්ග | 2023 සැලසුම (සංශෝධිත) (සටහන 1) | 2023 තත්‍ය සටහන | | 2024 සැලසුම |
|---|---|---|---|---|---|
| | | | සංඛ්‍යාව | සැලසුමේ % ක් ලෙස | |
| සේවක කාර්යසාධනය | වර්ෂය සඳහා ඉලක්කගත කාර්යසාධන අත්කර ගැනීම | 10,058 | 10,141 | 101 | 25,272 |
| දැනුම වැඩි දියුණු කර ගනිමින් වර්තමාන මෙහෙවර ඉලක්කයන් ළඟාකර ගැනීමට ඇති බාධක ඉවත් කිරීම | සතිපතා කෙරෙන ඉගෙනුම් ක්‍රියාකාරකම (අභ්‍යන්තර) | ප්‍රමිතීන් පිළිබඳ ඉදිරිපත් කිරීම් 19ක් | 19 | 100 | 48 |
| කාලානුරූප ප්‍රතිචාර | පැමිණිලි පිළිබඳව කටයුතු කිරීම, ඉල්ලීම් කරන ලද පැහැදිලි කිරීම් සහ ලැබුණු තොරතුරු. | ලැබුණු දිනය සහ ප්‍රතිචාර දක්වන දිනය හැර සාමාන්‍ය දින 5ක් ඇතුළත | ලැබුණු දිනය සහ ප්‍රතිචාර දක්වන දිනය හැර සාමාන්‍ය දින 5ක් ඇතුළත | - | ලැබුණු දිනය හා ප්‍රතිචාර දැක්වූ දිනය හැර සාමාන්‍ය වශයෙන් දින 5 ක් ඇතුළත |

**සටහන 1**

වසර අවසානයේදී මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සහ විගණන පරීක්‍ෂණ පැවැත්වීම සඳහා කාර්ය මණ්ඩලයේ දෙදෙනෙකු පමණක් ඉතිරිව සිටින අතර 2023 වර්ෂයේදී පරීක්ෂක කාර්ය මණ්ඩලයේ සැලකිය යුතු සංඛ්‍යාවක් එනම්, 4 දෙනෙකු ඉල්ලා අස්වීම හේතුවෙන් 2023 සඳහා වූ සැලැස්ම සංශෝධනය කරන ලදී.

**සටහන 2**

2024 අප්‍රේල් මාසය වන විට සැලසුම් කළ සියලුම පරීක්ෂණ කාර්ය මණ්ඩලය බඳවා ගනු ලැබේ යන උපකල්පනය මත පදනම්ව 2024 සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සහ විගණන පරීක්ෂණ මෙන්ම ප්‍රමිති පිළිබඳ ඉදිරිපත් කිරීම් සංඛ්‍යාව තීරණය කර ඇත.

**සටහන 3**

2024 සඳහා සැලසුම්ගත මූල්‍ය ප්‍රකාශන ලැබීම, 2023 දෙසැම්බර් 31 දිනට හඳුනාගත් තථ්‍ය නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් (SBE) සංඛ්‍යාව මත පදනම් වේ.

# 2023 වර්ෂයේ දී සමාලෝචනය කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් (SBE) ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය | මූල්‍ය වර්ෂයේ අවසානය |
|---|---|---|
| 1 | අබාන්ස් ඉලෙක්ට්‍රිකල්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 2 | අබාන්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 3 | ඒසීඑල් ප්ලාස්ටික්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 4 | ඇකියුටි ස්ටොක්බ්‍රෝකර්ස් (පෞද්) සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 5 | ඇග්ස්ටාර් ක්‍රොප්කෙයාර් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 6 | ඇල්ෆා වෙල්ත් ලිමිටඩ් | 2021 දෙසැම්බර් 31 |
| 7 | අමානා ටකෆුල් ලයිෆ් ඉන්ෂුවරන්ස් පොදු සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 8 | ඇන්සෙල් ටෙක්ස්ටයිල්ස් ලංකා (පෞද්) සමාගම | 2022 ජුනි 30 |
| 9 | ආර්පිකෝ අටාරැක්සියා කෑෂ් මැනේජ්මන්ට් ට්‍රස්ට් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 10 | ආර්පිකෝ අටාරැක්සියා ඉකුයුටි ඉන්කම් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 11 | ආර්පිකෝ අටාරැක්සියා ශ්‍රී ලංකා බොන්ඩ් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 12 | ආශා සෙකියුරිටීස් ලිමිටඩ් | 2022 මාර්තු 31 |
| 13 | ඒෂියා සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 14 | ඒෂියා සියක කොමඩිටීස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 15 | ඒෂියන් හොටෙල්ස් ඇන්ඩ් ප්‍රොපර්ටීස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 16 | ඇසෙට්ලයින් කැපිටල් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 17 | ඇසෙට්ලයින් සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 18 | ඇස්ට්‍රා ඇක්ටිව් ඉන්කම් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 19 | ඇස්ට්‍රා ඇල්ෆා ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 20 | එයිට්කන් ස්පෙන්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 21 | බන්සෙයි රෝයල් රිසෝර්ට්ස් හික්කඩුව පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 22 | බාර්ට්ලීට් රෙලිගෙයාර් සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 23 | බොඩිලයින් (පෞද්) සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 24 | බෝගල ග්‍රැෆයිට් ලංකා පොදු සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 25 | බොගවන්තලාව ටී එස්ටේට්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 26 | බ්‍රැන්ඩික්ස් ඇපරල් සොලියුෂන්ස් ලිමිටඩ් | 2022 මාර්තු 31 |
| 27 | බ්‍රීබෑක් රෙසිඩෙන්ෂල් ටවර්ස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 28 | බ්‍රවුන්ස් බීච් හොටෙල්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 29 | සී ටී ප්‍රොපර්ටීස් ලේක්සයිඩ් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 30 | කැම්සෝ ලෝඩ්ස්ටාර් (පෞද්) සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 31 | කැපිටල් අලායන්ස් බැලන්ස්ඩ් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 32 | කැපිටල් අලායන්ස් කෝපරේට් ට්‍රෙෂරි ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 33 | කැපිටල් අලායන්ස් ගිල්ට් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 34 | කැපිටල් අලායන්ස් ගිල්ට් මනි මාර්කට් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 35 | කැපිටල් අලායන්ස් ගිල්ට් ට්‍රේඩින් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 36 | කැපිටල් අලායන්ස් හයි යීල්ඩ් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 37 | කැපිටල් අලායන්ස් මීඩියම් රිස්ක් ඩෙට් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 38 | කැපිටල් අලායන්ස් ඉන්කම් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 39 | කැපිටල් අලායන්ස් ඉන්වෙස්ට්මන්ට් ග්‍රේඩ් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 40 | කැපිටල් අලායන්ස් කොන්ට්‍රට්‍රිව් ඉක්විටි ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 41 | කැපිටල් අලායන්ස් සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 42 | කාර්ගිල්ස් ෆුඩ්ස් කම්පැණි (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 43 | කාර්ගිල්ස් කොලිටි ඩේරිස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 44 | කාගිල්ස් බෑන්ක් ලිමිටඩ් | 2022 දෙසැම්බර් 31 |
| 45 | කාර්ගෝ බෝට් ඩෙවලොප්මන්ට් කම්පැණි පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 46 | කෝස්වේ පේන්ට්ස් ලංකා (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 47 | සීබීසී ෆිනෑන්ස් ලිමිටඩ් | 2022 දෙසැම්බර් 31 |
| 48 | සීබීඑල් ෆුඩ්ස් ඉන්ටර්නැෂනල් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 49 | සෙන්ට්‍රල් ඉන්ඩස්ට්‍රීස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 50 | සීබෑන්ක් සෙන්චරි ග්‍රෝවිත් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 51 | සීබෑන්ක් යුනිට් ට්‍රස්ට් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 52 | සිලෝන් ඇග්‍රෝ ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් | 2021 දෙසැම්බර් 31 |
| 53 | සිලෝන් බෙවරේජ් හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 54 | සිලෝන් ෆිනෑන්ෂල් සෙක්ටර් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 55 | සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් පොදු සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 56 | සිලෝන් ඉන්ඩෙක්ස් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 57 | සිලෝන් ඉන්වෙස්ට්මන්ට් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 58 | සිලෝන් මනි මාර්කට් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 59 | සිලෝන් රියල් එස්ටේට් හෝල්ඩින්ග්ස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 60 | සිලෝන් ටී බ්‍රෝකර්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 61 | සිලෝන් ටුවර්සම් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 62 | කෙමනෙක්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 63 | චෙව්රොන් සිලෝන් ලිමිටඩ් | 2022 දෙසැම්බර් 31 |
| 64 | චෙව්රොන් ලුබ්රිකන්ට්ස් ලංකා පොදු සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 65 | සිටිසන්ස් ඩෙවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 66 | සිට්‍රස් ලෙෂර් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 67 | කලම්බු සිටි හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 68 | කලම්බු ඩොක්යාර්ඩ් පොදු සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 69 | කලම්බු ෆෝට් ඉන්වෙස්ට්මන්ට්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 70 | කලම්බු ඉන්වෙස්ට්මන්ට් ට්‍රස්ට් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 71 | කලම්බු මැරිනා ඩෙවලොප්මන්ට් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 72 | කොළඹ කොටස් වෙළෙඳපොළ | 2021 දෙසැම්බර් 31 |
| 73 | කොමර්ෂල් ඩෙවලොප්මන්ට් කම්පැණි පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 74 | කොම්ට්‍රස්ට් ඉක්විටි ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 75 | කොම්ට්‍රස්ට් ඇසෙට් මැනේජ්මන්ට් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 76 | කොම්ට්‍රස්ට් ගිල්ට් එජ්ඩ් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 77 | කොම්ට්‍රස්ට් මනි මාර්කට් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 78 | සීටී සීඑල්එස්ඒ සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |

# 2023 වර්ෂයේ දී සමාලෝචනය කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් (SBE) ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය | |
|---|---|---|
| 79 | සීටී ලෑන්ඩ් ඩෙවලොප්මන්ට් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 80 | ඩි ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (පෞද්) සමාගම | 2023 මාර්තු 31 |
| 81 | ඩීඑෆ්සීසී බෑන්ක් පොදු සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 82 | ඩයලොග් ඇක්ෂියාටා පොදු සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 83 | ඩයලොග් ෆිනෑන්ස් පොදු සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 84 | ඉචැනලින් පොදු සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 85 | එක්සෙල් ග්ලෝබල් හෝල්ඩින්ග්ස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 86 | එක්ස්පොලංකා ෆ්‍රයිට් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 87 | ෆස්ට් කැපිටල් ඉක්විටීස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 88 | ෆස්ට් ගාර්ඩියන් ඉක්විටි (පෞද්) සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 89 | ගැමා පිට්සාක්‍රාප්ට් ලංකා (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 90 | ගෙස්ටෙට්නර් සිලෝන් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 91 | ගාර්ඩියන් ඇකියුටි ඇසෙට් මැනේජ්මන්ට් ලිමිටඩ් | 2021 දෙසැම්බර් 31 |
| 92 | ගාර්ඩියන් ඇකියුටි ඉක්විටි ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 93 | ගාර්ඩියන් ඇකියුටි ඉන්කම් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 94 | ගාර්ඩියන් ඇකියුටි මනි මාර්කට් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 95 | හැටන් ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 96 | හේකාර්බ් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 97 | හේලීස් ෆැබ්රික් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 98 | හේලීස් ෆයිබර් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 99 | හේමාස් මැනුෆැක්චරින් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 100 | හොරණ ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 101 | අයිකොනික් ට්‍රස්ට් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 102 | ඉන්ටර්නැෂනල් ඩිස්ටිලර්ස් ලිමිටඩ් | 2022 සැප්තැම්බර් 30 |
| 103 | ජේ ජේ මිල්ස් ලංකා (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 104 | ජේබී ෆයිනෑන්ෂල් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 105 | ජේබී වැන්ටේජ් ෂෝර්ට් ටර්ම් ගිල්ට් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 106 | ජේබී වැන්ටේජ් වැලියු ඉක්විටි ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 107 | ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 108 | ජෝන් කීල්ස් හොටෙල්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 109 | ජෝන් කීල්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 110 | ජෝන් කීල්ස් ස්ටොක් බ්‍රෝකර්ස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 111 | කීල්ස් ෆුඩ් ප්‍රොඩක්ට්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 112 | කේගෝල් ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 113 | කැලණි කේබල්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 114 | කැලණි ටයර්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 115 | කැලණි වැලි ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 116 | කොටගල ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 117 | ලංකා ඇලුමිනියම් ඉන්ඩස්ට්‍රීස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 118 | ලංකා සෙරමික් පොදු සමාගම | 2022 මාර්තු 31 |

| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය | මූල්‍ය වර්ෂයේ අවසානය |
|---|---|---|
| 119 | ලංකා රියල්ටි ඉන්වෙස්ට්මන්ට්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 120 | ලංකා ටයිල්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 121 | එල්ඕඑල්සී සිලෝන් හෝල්ඩිංග්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 122 | එල්ඕඑල්සී සෙකියුරිටීස් ලිමිටඩ් | 2022 මාර්තු 31 |
| 123 | ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (පෞද්) සමාගම | 2021 මාර්තු 31 |
| 124 | ඔනලි ගෝල්ඩින් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 125 | ඔරියන් ෆිනෑන්ස් පොදු සමාගම | 2021 මාර්තු 31 |
| 126 | මරිනා හොටෙල් හෝල්ඩිංග්ස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 127 | මාස් ඉන්ටිමේට්ස් (පෞද්) සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 128 | මිලේනියම් ඩෙවලොප්මන්ට් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 129 | මිලේනියම් අයිටී සොෆ්ට්වෙයාර් (පෞද්) සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 130 | නාමල් බෑන්ක් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 131 | නාමල් ග්‍රෝවිත් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 132 | නාමල් හයි යීල්ඩ් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 133 | නාමල් ඉන්කම් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 134 | නැෂනල් ඉක්විටි ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 135 | එන්ඩීබී සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 136 | එන්ඩීබී වෙල්ත් ගිල්ට් එජ් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 137 | එන්ඩීබී වෙල්ත් ග්‍රොවිත් ඇන්ඩ් ඉන්කම් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 138 | එන්ඩීබී වෙල්ත් ග්‍රොවිත් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 139 | එන්ඩීබී වෙල්ත් ඉන්කම් ප්ලස් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 140 | එන්ඩීබී වෙල්ත් ඉස්ලාමික් මනි ප්ලස් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 141 | එන්ඩීබී වෙල්ත් මනි ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 142 | එන්ඩීබී වෙල්ත් මනි ප්ලස් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 143 | නෙස්ටර් ස්ටොක් බ්‍රෝකර්ස් (පෞද්) සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 144 | නිල්කමල් ඊස්වරන් ප්ලාස්ටික්ස් (පෞද්) සමාගම | 2023 මාර්තු 31 |
| 145 | ඔමේගා ලයින් ලිමිටඩ් | 2021 දෙසැම්බර් 31 |
| 146 | ඔරියන්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් | 2022 දෙසැම්බර් 31 |
| 147 | ඔරිට් ට්‍රේඩින් ලංකා (පෞද්) සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 148 | ඕවර්සීස් රියැල්ටි (සිලෝන්) පොදු සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 149 | පියෙස්ට්‍රා පර්නිචර් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 150 | ප්‍රිමියර් වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ් | 2022 මාර්තු 31 |
| 151 | ප්‍රිමියර් ග්‍රොවිත් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 152 | ප්‍රිමියර් මනි මාර්කට් ෆන්ඩ් | 2022 මාර්තු 31 |
| 153 | පුස්සැල්ල මීට් ප්‍රොඩියුසර්ස් (පෞද්) සමාගම | 2021 මාර්තු 31 |
| 154 | රෙකිට් බෙන්කිසර් ලංකා ලිමිටඩ් | 2021 දෙසැම්බර් 31 |
| 155 | රේණුකා ඇග්‍රි ෆුඩ්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 156 | රිචඩ් පීරිස් එක්ස්පෝට්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 157 | සැම්සන් රබර් ඉන්ඩස්ට්‍රීස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 158 | සන්ෆින් ෂාරියා ඉන්කම් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |

# 2023 වර්ෂයේ දී සමාලෝචනය කරන ලද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායන් (SBE) ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය | මූල්‍ය වර්ෂයේ අවසානය |
|---|---|---|
| 159 | එස්සී සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 160 | සෙන්ෆින් ඇසට් මැනේජ්මන්ට් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 161 | සෙන්ෆින් ඩිවිඩන්ඩ් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 162 | සෙන්ෆින් ඩයිනමික් ඉන්කම් ෆන්ඩ් | 2022 දෙසැම්බර් 31 |
| 163 | සෙන්ෆින් ග්‍රොව්ත් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 164 | සෙන්ෆින් සෙකියුරිටීස් ලිමිටඩ් | 2022 මාර්තු 31 |
| 165 | සෙන්ෆින් ෂාරියා බැලන්ස්ඩ් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 166 | සෙරන්ඩිබ් ලෑන්ඩ් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 167 | එල්එස්ඊජී බිස්නස් සර්විසස් කළම්බු (පෞද්) සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 168 | මඩුල්සිම ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 169 | මහවැලි මැරීන් සිමෙන්ට් (පෞද්) සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 170 | සොප්ට්ලොජික් ස්ටොක්බ්‍රෝකර්ස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 171 | සෝලර් යුනිවර්ස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 172 | සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල්ස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 173 | සීමාසහිත ලංකා නැව් සමාගම | 2023 මාර්තු 31 |
| 174 | ස්ටැෆර්ඩ් මෝටර් කම්පැණි (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 175 | ස්ටාර් පැෂන් ක්ලෝදින් (පෞද්) සමාගම | 2023 මාර්තු 31 |
| 176 | ස්ට්‍රෙච්ලයින් (පෞද්) සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 177 | සන්ෂයින් හෝල්ඩිංග්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 178 | ටීවීඑල් ලංකා හොටෙල්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 179 | තලවාකැලේ ටී එස්ටේට්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 180 | ටැප්‍රොබේන් සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 181 | ටී ටැන්ග් (පෞද්) සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 182 | ද ෆෝට්‍රසේ රිසෝර්ට් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 183 | ද කිංග්ස්බරි පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 184 | ටෝයෝ කුෂන් ලංකා (පෞද්) සමාගම | 2023 මාර්තු 31 |
| 185 | ටොයොටා ලංකා (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 186 | ට්‍රාන්ස් ඒෂියා හොටෙල් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 187 | ට්‍රිශෙල් ෆැබ්රික් (පෞද්) සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 188 | අල්ට්‍රාටෙක් සිමෙන්ට් ලංකා (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 189 | යුනිචෙලා (පෞද්) සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 190 | යුනිලිවර් ලංකා සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 191 | වර්චුසා (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 192 | වොල්කර්ස් ටුවර් සමාගම | 2023 මාර්තු 31 |

# 2023 වර්ෂයේ දී සමාලෝචනය කරන ලද, ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිරීක්ෂණ ලිපි නිකුත් කල නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් (SBE) ලැයිස්තුව

| | නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසාය | මූල්‍ය වර්ෂයේ අවසානය |
|---|---|---|
| 1 | සිලෝන් ඩොලර් ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 2 | ඊසීඑල් කේබල්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 3 | ඇලුමෙක්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 4 | ඒෂියා කැපිටල් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 5 | ඒෂියා කැපිටල් ස්ටොක් බ්‍රෝකර්ස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 6 | ඇසෙට් ට්‍රස්ට් මැනේජ්මන්ට් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 7 | ඇසෙට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් | 2023 මාර්තු 31 |
| 8 | ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැණි පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 9 | බීපීපීඑල් හෝල්ඩින්ග්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 10 | සී.ඩබ්ලිව්. මැකී පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 11 | කැපිටල් අලායන්ස් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | 2022 මාර්තු 31 |
| 12 | කැපිටල් ට්‍රස්ට් සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 13 | සිලෝන් හොස්පිටල්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 14 | සිලෝන් අයිපීඕ ෆන්ඩ් | 2021 දෙසැම්බර් 31 |
| 15 | සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් | 2020 මාර්තු 31 |
| 16 | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 2020 මාර්තු 31 |
| 17 | කෝට්ස් ත්‍රෙඩ් එක්ස්පෝර්ට්ස් (පෞද්) සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 18 | ඩාර්ලි බට්ලර් ඇන්ඩ් කම්පැණි ලිමිටඩ් | 2022 මාර්තු 31 |
| 19 | ඩෙල්මේජ් ෆෝර්සයිත් ඇන්ඩ් කම්පැණි ලිමිටඩ් | 2022 මාර්තු 31 |
| 20 | ඩයනා ට්‍රේඩින් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 21 | ඩිල්මා සිලෝන් ටී කම්පැණි පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 22 | ඩිප්ඩ් ප්‍රොඩක්ට්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 23 | ඊඑම්ජේඒවයි ඉන්ටර්නැෂනල් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 24 | එන්ටර්ප්‍රයිස් සිලෝන් කැපිටල් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 25 | එක්ස්පෝලංකා හෝල්ඩිංග්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 26 | ෆින්ට්‍රකේස් ෆිනෑන්ස් ලිමිටඩ් | 2023 මාර්තු 31 |
| 27 | හේලීස් ඇග්‍රිකල්චර් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් | 2022 මාර්තු 31 |
| 28 | ශ්‍රී ලංකා එච්ඩීඑෆ්සී බෑන්ක් | 2022 දෙසැම්බර් 31 |
| 29 | හෙල්ත්ගාර්ඩ් ෆාර්මසි ලිමිටඩ් | 2022 මාර්තු 31 |
| 30 | හිරුජනනි (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 31 | එච්ජේඑස් කොන්ඩිමන්ට්ස් ලිමිටඩ් | 2023 මාර්තු 31 |
| 32 | හච්සන් ටෙලිකමියුනිකේෂන් ලංකා (පෞද්) සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 33 | ජේ.බී. සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 34 | ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 35 | කප්රුක හෝල්ඩිංග්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 36 | ලංකා කෝල් කම්පැණි (පෞද්) සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 37 | ලංකා සෙකියුරිටීස් (පෞද්) සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 38 | ලංකෙම් ඩෙවලොප්මන්ට්ස් පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 39 | ලාෆ්ස් පෙට්‍රෝලියම් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 40 | එල්බී ෆිනෑන්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 41 | මර්කන්ටයිල් ෂිපින් කම්පැණි පොදු සමාගම | 2022 මාර්තු 31 |
| 42 | මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පොදු සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 43 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 2021 දෙසැම්බර් 31 |
| 44 | නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පොදු සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 45 | එන්ඩීබී වෙල්ත් මැනේජ්මන්ට් ලිමිටඩ් | 2021 දෙසැම්බර් 31 |
| 46 | ඔරියන්ට් ෆිනෑන්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 47 | ඔරිට් ඇපරල්ස් ලංකා (පෞද්) සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 48 | පිරමිඩ් ලංකා (පෞද්) සමාගම | 2021 දෙසැම්බර් 31 |
| 49 | ආර් අයි එල් ප්‍රොපර්ටි පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 50 | සන්කෙන් කන්ස්ට්‍රක්ෂන් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 51 | සන්සුන් බුටික් හොටෙල්ස් ලිමිටඩ් | 2022 මාර්තු 31 |
| 52 | සෙලාන් බෑන්ක් පොදු සමාගම | 2022 දෙසැම්බර් 31 |
| 53 | සියරා පිලින් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 54 | සියරා රෙඩිමික්ස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 55 | ස්කයි සෝලර් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 56 | සමර්විල් ස්ටොක් බ්‍රෝකර්ස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 57 | ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය | 2020 මාර්තු 31 |
| 58 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 2021 දෙසැම්බර් 31 |
| 59 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 2020 මාර්තු 31 |
| 60 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 2020 මාර්තු 31 |
| 61 | ටීජේ ලංකා ප්‍රින්ට්ස් (පෞද්) සමාගම | 2023 මාර්තු 31 |
| 62 | ටෝකියෝ සිමෙන්ට් කම්පැණි (ලංකා) පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 63 | තුඩාවේ බ්‍රදර්ස් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 64 | විද්‍යතමුනායි වින්ඩ් පවර් (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |
| 65 | වටවල ප්ලාන්ටේෂන්ස් පොදු සමාගම | 2023 මාර්තු 31 |
| 66 | වයිකේකේ ලංකා (පෞද්) සමාගම | 2022 මාර්තු 31 |

# 2023 දෙසැම්බර් 31 දිනට විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ ලැයිස්තුගත සමාගම් සහ රාජ්‍ය අංශයේ ආයතන

**2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ ලැයිස්තුගත සමාගම්**

- අනිලානා හොටෙල්ස් ඇන්ඩ් ප්‍රොපටීස් පීඑල්සී*
- බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී*
- සිලෝන් ප්‍රින්ටර්ස් පීඑල්සී**
- සිටි හවුසින් ඇන්ඩ් රියල් එස්ටේට් කම්පැණි පීඑල්සී*
- ඔෆිස් ඉක්විප්මන්ට් පීඑල්සී*
- පැරගන් සිලෝන් පීඑල්සී*
- සොෆ්ට්ලොජික් හෝල්ඩින්ස් පීඑල්සී*
- මැක්වුඩ්ස් එනර්ජි පීඑල්සී***
- කෙල්සි ඩෙවලොප්මන්ට්ස් පීඑල්සී*
- සෙරෙන්ඩිබ් ඉංජිනියරින් ගෲප් පීඑල්සී*
- නවලෝක හොස්පිටල්ස් පීඑල්සී*
- සෙරෙන්ඩිබ් ලෑන්ඩ් පීඑල්සී***
- නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී**

**2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ රාජ්‍ය අංශයේ ආයතන:**

- සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව
- ලංකා ධීවර සංස්ථාව
- ලංකා විදුලිබල මණ්ඩලය***
- ජනතා වතු සංවර්ධන මණ්ඩලය
- ජාතික චිත්‍රපට සංස්ථාව***
- ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය
- ජාතික රක්ෂණ භාරකාර අරමුදල
- වී අලෙවි මණ්ඩලය
- ශ්‍රී ලංකා කජු සංස්ථාව
- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
- ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව
- ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
- සමූපකාර තොග වෙළඳ සංස්ථාව
- නාගරික සංවර්ධන අධිකාරිය
- දේශීය ණය සහ සංවර්ධන අරමුදල***
- රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව
- සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය***
- ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

**2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ රාජ්‍ය අංශයේ ආයතන:**

- සීමාසහිත ජාතික කඩදාසි සමාගම
- සීමාසහිත ලංකා නැව් සංස්ථාව
- සීමාසහිත ලංකා පොහොර සමාගම***

* කොළඹ කොටස් හුවමාරුවේ (CSE) ගනුදෙනු තහනම් කර ඇත.

** වොච් ලිස්ට්

*** ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. වෙත පසුව මූල්‍ය ප්‍රකාශන ලැබී තිබේ.

# 2023 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් සිදු කරන ලද ප්‍රමිත සකස් කිරීම හා බැඳුනු ක්‍රියාකාරකම්

මුදල් අමාත්‍යාංශය සමඟ ඇති කර ගත් අතීත විධිවිධානවලට අනුව, වසර තුළ ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට අඛණ්ඩව ප්‍රදානයක් ලබා දීමට කටයුතු කරන ලදී. කෙසේ වුවද, ඉකුත් වර්ෂවල ප්‍රදානය වූ රු. මිලියන 40 සාපේක්ෂව, ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් මුහුණ දුන් අයවැය බාධාවන් හේතුවෙන් 2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට රු. මිලියන 2 ක ප්‍රදානයක් ලබා දෙන ලදී. ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ සහ විගණන ප්‍රමිති කමිටුවේ කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා මෙන්ම ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සම්මත කර ගැනීම සහ එවැනි ප්‍රකාශයන් සිංහල සහ දෙමළ භාෂාවලට පරිවර්තනය කිරීම සහ අදාළ ගැසට් කිරීම සඳහා වන පිරිවැයෙන් කොටසක් පියවා ගැනීම සඳහා මෙම ප්‍රදානය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය වෙත ලබා දෙනු ලැබේ. ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත කමිටු මසකට වරක් ඔවුන්ගේ රැස්වීම් පවත්වයි. අදාළ ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතවල වර්ධනයන් පිළිබඳව දැනුවත් වීමට තාක්ෂණික ප්‍රකාශයන් සහ පහසුකම් ලබා ගැනීමට මහජනතාව වෙත  ප්‍රවේශය ලබා දීම සඳහා ගිණුම්කරණ ප්‍රමිත කමිටුව සහ විගණන ප්‍රමිත කමිටුව සඳහා විශේෂිත වෙබ් අඩවියක් ලබා දී තිබේ.

මෙම වසරේ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කරන්නන්ගේ සහ විගණකවරුන්ගේ මූල්‍ය වාර්තාකරණය වැඩිදියුණු කිරීම සඳහා ඔවුන්ව දැනුවත් කිරීමේ අරමුණින් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. විසින් හඳුනා ගන්නා ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ විගණන ප්‍රමිතීන්ට අනුකූල නොවීම් පිළිබඳව දැනුවත් කිරීමේ සැසියක් ශ්‍රී.ල.ගි.වි.ප්‍ර.ස.ම. සමඟ සහයෝගයෙන් පවත්වන ලදී.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන්ට අදාළව වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

### ගිණුම්කරණ ප්‍රමිති

- 2023 ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) බන්ධිත වෙළුම ප්‍රකාශයට පත් කරන ලදී.
- IFRS පදනම විසින් නිකුත් කරන ලද නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් (SBE) සඳහා IFRS හි නිරාවරණ කෙටුම්පත සඳහා අදහස් දැක්වීම් ඉදිරිපත් කරන ලදී.
- නිතර අසන ප්‍රශ්න පිළිබඳ නිකුත් කිරීම (FAQs).
- බදු අනුපාත වෙනස් කිරීම් සඳහා ගිණුම්කරණ ප්‍රතිකාර සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය LKAS -12 ආදායම් බදු
- රජයේ ගෘහස්ථ ණය ප්‍රශස්තකරණ (DDO) වැඩසටහන යටතේ නිකුත් කරන ලද මූල්‍ය උපකරණ සඳහා ගිණුම්කරණ ප්‍රතිකාරය.
- රජයේ ගෘහස්ථ ණය ප්‍රශස්තකරණ (DDO) වැඩසටහන හේතුවෙන් බලපෑමට ලක් වූ විශ්‍රාම අරමුදල් සඳහා ගිණුම්කරණ ප්‍රතිකාරය.
- අවිනිශ්චිත ආර්ථික තත්ත්වයන් යටතේ වට්ටම් අනුපාත භාවිතය.
- කලාපීය රටවල IFRS 17, රක්ෂණ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීමෙන් පසු SLFRS 17, රක්ෂණ ගිවිසුම් බලපැවැත්වෙන දිනය 2026 ජනවාරි 1 දක්වා වෙනස් කරන ලදී. IFRS 17 ක්‍රියාත්මක කිරීම සඳහා කර්මාන්ත මාර්ග සිතියම නිරීක්ෂණය කිරීම පිණිස ගිණුම්කරණ ප්‍රමිති කමිටුවේ මගපෙන්වීම යටතේ අනුකමිටුවක් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් පත් කරන ලදී.
- ශ්‍රී ලංකා මහ බැංකුවට (CBSL) මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය මගපෙන්වීම් ලබා දීම මගින් රජයේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සහාය වීම.
- ලැයිස්තුගත සමාගම් සඳහා විස්තීරණ ව්‍යාපාර වාර්තාකරණ භාෂාව (XBRL) ක්‍රියාත්මක කිරීම පිළිබඳ අදාළ වන ගිණුම්කරණ ප්‍රමිති සමාලෝචනය කිරීම මගින් ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (SEC) වෙත වාර්තා ආකෘතියක් ඉදිරිපත් කරන ලදී.

  පවත්නා සහ සංශෝධිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ වැඩමුළු, දැනුවත් කිරීමේ සැසි, සම්මන්ත්‍රණ සහ වෙබිනාර් වසර පුරා පවත්වන ලදී.
- IFRS තිරසාර වාර්තාකරණ ප්‍රමිති S1- තිරසාරභාවයට අදාළ මූල්‍ය තොරතුරු හෙළිදරව් කිරීම සඳහා වන සාමාන්‍ය අවශ්‍යතා සහ S2 - දේශගුණය ආශ්‍රිත හෙළිදරව් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක් සංවිධානය කරන ලදී.

### විගණන ප්‍රමිති

- ISA 570" Going Concern සහ ISSA 5009, ජාත්‍යන්තර විගණන සහ සහතික කිරීමේ ප්‍රමිති මණ්ඩලයේ තිරසාරභාවය සහතික කිරීමේ කටයුතු සඳහා වන සාමාන්‍ය අවශ්‍යතා පිළිබඳ නිරාවරණ කෙටුම්පත් සඳහා අදහස් දැක්වීම් ඉදිරිපත් කරන ලදී.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය සමාගම් සඳහා සංශෝධනය කොට නිකුත් කරන ලද ආයතනික පාලන නියෝග මත පදනම් ව, මූල්‍ය සමාගම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන ලද ආයතනික පාලන නියෝග යන්ට අනුකූලවීම පිළිබඳව වාර්තා කිරීම සඳහා වන  ශ්‍රී ලංකා ආශ්‍රිත සේවා ප්‍රායෝගික ප්‍රකාශය (SLRSPS - 4752), සංශෝධනය කර ප්‍රකාශනය කිරීම.
- තාක්ෂණයට අදාළ බලය නොලත් ආධාරක ද්‍රව්‍යයක් (ATT) භාවිතා කිරීමේ දී ව්‍යතිරේක සහ කාර්යසාධනවල වැදගත්කම අදාළ වන ආකාරය විමර්ශනය කිරීම සම්බන්ධයෙන් නිතර අසනු ලැබිය හැකි ප්‍රශ්න වෘත්තිකයන්ට නිකුත් කිරීම.
- කුඩා හා මධ්‍යම පරිමාණ වෘත්තිකයන් සඳහා ස්වයංක්‍රීය විගණන මෙවලම් කට්ටලයක් අඛණ්ඩව සංවර්ධනය කිරීම.
- 2023 ආචාර ධර්ම සංග්‍රහය සංස්කරණය ආරම්භ කරන ලදී (ස්වාධීන ප්‍රමිතීන් ඇතුළත් ගණකාධිකාරීවරුන් සඳහා වන ජාත්‍යන්තර ආචාර ධර්ම ප්‍රමිත මණ්ඩලය (IESBA) විසින් නිකුත් කරන ලද සංග්‍රහයේ 2021 සංස්කරණය සම්මත කිරීමෙන්).

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීපීඩී/ඒ/එස්එල්ඒඒඑස්එම්බී/එෆ්ඒ/2023/07 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 අගෝස්තු 29

**සභාපති**

**ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය**

**ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රීලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මණ්ඩලයේ 2022 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත්, මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන, තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේ දී, අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේ දී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්වයන්ගේ වලකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුය ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය ස කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (සසස) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කරන ලද මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (IV) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද සියලුම නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2023 වර්ෂය තුළදී, නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය (SBEs) 261කට අදාළ මූල්‍ය ප්‍රකාශන කට්ටල 252 ක් සමාලෝචනය කිරීමට මණ්ඩලය සැලසුම් කර තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමේ සැලැස්ම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 51කින් අඩු වී ඇති බව නිරීක්ෂණය විය.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

මණ්ඩලයේ කාර්යාල පරිශ්‍රයේ අභ්‍යන්තර කටයුතු නිර්මාණය සහ අධීක්ෂණය කිරීම වෙනුවෙන් උපදේශන සේවා සඳහා සමස්ථ ඉදිකිරීම් පිරිවැයෙන් සියයට 7 ක පිරිවැයකට මණ්ඩලය විසින් 2019 ජනවාරි 30 දින ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ඉදිකිරීම් සංවර්ධන අදියර අවසන් කරන ලද අතර 2021 ඔක්තෝබර් 27 දින උපදේශක බිල්පත් වටිනාකමින් සියයට 65 ක් අය කරන ලදී. කෙසේ වුවද, උපදේශකවරයාගේ ඉතිරි වැඩ අදියර හෝ පරිශ්‍රයේ යෝජිත වැඩිදියුණු කිරීම් විගණිත දිනය වූ 2024 මැයි 31 දින වන විට ද අවසන් කර නොතිබුණි.

## 2.3 වෙනත් කරුණු

### 2.3.1 මානව සම්පත් කළමනාකරණය

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත පරිදි විය.

| කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | 2023.12.31 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 23 | 05 | 18 |
| තෘතීයික | 04 | 02 | 02 |
| ද්විතීයික | 02 | 02 | 00 |
| ප්‍රාථමික | 04 | 01 | 03 |
| | ---- | ---- | ---- |
| | 33 | 10 | 23 |

(I) 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ පුරප්පාඩු 23 ක් නිරීක්ෂණය විය. එයින් පුරප්පාඩු 20 ක් මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන්ට බලපෑමක් සිදුවන විධායක මට්ටමේ පුරප්පාඩු විය. තවද, පුරප්පාඩු වශයෙන් පැවති තනතුරු 20 ක් අතරින්, නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර මණ්ඩලය ආරම්භයේ සිටම පුරප්පාඩුව පැවතුණු අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ අධීක්ෂණ සහ සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ තනතුරු 6 ක් සඳහා ස්ථිර පදනම මත බඳවාගැනීම් සිදු කර නොතිබුණි.

(II) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය, පරිපාලන සහ තොරතුරු තාක්ෂණ අංශ ප්‍රධානී තනතුරුද පුරප්පාඩු වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# විගණකාධිපති වාර්තාවේ සඳහන් කර ඇති ගැටළු සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය

| විගණන වාර්තාවේ නිරීක්ෂණය | කළමනාකාරිත්වය විසින් ලබා දෙන ලද පිළිතුරු |
|---|---|
| 2. 2.2.3 (අ) වගන්තිය | |
| අ) 2023 වර්ෂය තුළදී, නිශ්චිත ව්‍යාපාර ව්‍යවසාය (SBEs) 261කට අදාළ මූල්‍ය ප්‍රකාශන කට්ටල 252ක් සමාලෝචනය කිරීමට මණ්ඩලය සැලසුම් කර තිබුණි . ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීමේ සැලැස්ම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 51කින් අඩ වී ඇති බව නිරීක්ෂණය විය. | සමාලෝචනවල නිරත වූ කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව 8 ක් වශයෙන් පැවති අවස්ථාවේ දී ඉකුත් වර්ෂයේ සැලැස්ම (2022) පිළියෙළ කර අවසන් කර තිබුණි. කෙසේ වුවද, 2023 වර්ෂය සඳහා වැඩ සැලැස්ම පිළියෙළ කිරීමේදී මූල්‍ය සමාලෝචනවල නිරතව සිටි කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව 4 ක් දක්වා අඩු වී තිබුණි. ඒ අනුව, සැලසුම් කරන අවස්ථාවේ සෘජුවම සමාලෝචන කටයුතුවල නිරතව සිටි අඩු කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව සැලකිල්ලට ගනිමින්, එකල සමාලෝචන කටයුතුවල නිරතව සිටි කාර්ය මණ්ඩල සාමාජිකයින් 4 දෙනා විසින් මූල්‍ය ප්‍රකාශන කට්ටල 285ක් සමාලෝචනය කිරීමට තීරණය කර අනුමත කරන ලදී. වසරේ දෙවන භාගයේදී තවත් කාර්ය මණ්ඩල සාමාජිකයෝ දෙදෙනෙක් ඉල්ලා අස් වූහ. එබැවින් මූල්‍ය සමාලෝචන අඩු සංඛ්‍යාවක් ආවරණය කිරීමට සිදු වීමේ තත්ත්වය මඟහරවා ගැනීමේ පියවරක් වශයෙන්, නව කාර්ය මණ්ඩල සාමාජිකයින් 4 දෙනෙකු බඳවා ගැනීමේ අපේක්ෂාවෙන් සහ මූල්‍ය සමාලෝචන ආවරණය ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට මණ්ඩලය කටයුතු කරන ලදී. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් බොහෝ ප්‍රයත්නයන් දැරුවද, ප්‍රධාන වශයෙන් පිරිනමනු ලබන වැටුප්වල අඩු ආකර්ෂණීය බව හේතුවෙන් 2023 වර්ෂයේදී ද තාක්ෂණික කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීමට ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. ට නොහැකි විය. ඒ අනුව, 2022 වර්ෂයට සාපේක්ෂව, 2023 වර්ෂය සඳහා සැලසුම් කර ඇති සැලකිය යුතු මට්ටමේ අඩු සමාලෝචන සංඛ්‍යාව (285) සහ සාක්ෂාත් කර ගන්නා ලද සමාලෝචන සංඛ්‍යාව (261) එවැනි සමාලෝචන සිදු කිරීමේ නිරතව සිටින කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව අතර සෘජු බලපෑමක් පවතී. |
| 2.2.2. 2.2.4 වගන්තිය | |
| අ) මණ්ඩලයේ කාර්යාල පරිශ්‍රයේ සැලසුම් හා අභ්‍යන්තර කටයුතු සඳහා උපදේශන සේවා සඳහා සම්පූර්ණ ඉදිකිරීම් පිරිවැයෙන් සියයට 7 ක මුදලක් වැය කරමින් මණ්ඩලය 2019 ජනවාරි 30 වැනි දින ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ඉදිකිරීම් සංවර්ධන අදියර අවසන් කරන ලද අතර 2021 ඔක්තෝබර් 27 දින උපදේශන බිල්පතෙන් සියයට 65ක් අය කරන ලදී. කෙසේ වුවද, උපදේශකවරයාගේ ඉතිරි වැඩ අදියර හෝ පරිශ්‍රයේ යෝජිත වැඩිදියුණු කිරීම් විගණිත දිනය වූ 2024 මැයි 31 දින වන විට ද අවසන් කර නොතිබුණි. | ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම.  විසින් සැලසුම් කර ඇති පරිදි කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සඳහා ඉඩකඩ පහසුකම් ලබා දීම සඳහා ලංකා බයිබල් සංගම් ගොඩනැගිල්ලේ 1 වන මහල බදු පදනමට ගන්නා ලද අතර 1 වන මහලේ අවශ්‍ය අභ්‍යන්තර බෙදා වෙන් කිරීම් කටයුතු සහ 3 වන මහලේ කාර්යාල පරිශ්‍රය වසර 20 කට වඩා පැරණි බැවින් 3 වන මහල නැවත සකස් කිරීමේ කටයුතු ද සිදු කරන ලදී.<br>රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) විසින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව අභ්‍යන්තර ඉදිකිරීම් කටයුතු සැලසුම් කිරීම සහ අධීක්ෂණය සඳහා උපදේශන සේවා සපයන්නා ලෙස කටයුතු කරන ලදී.<br>ගිවිසුමට අනුව, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) විසින් වැඩ අදියර හයක් සම්පූර්ණ කළ යුතු වූ අතර, එක් එක් අදියර සම්පූර්ණ කිරීම මත පදනම්ව ගෙවිය යුතු ගාස්තු (7%) ප්‍රතිශතයකට ද එකඟ වී තිබුණි.<br>කෙසේ වුවද, ප්‍රාග්ධන වියදම් සඳහා අරමුදල් අනුමත කිරීමේදී සහ ඉදිකිරීම් සහ නැවත සකස් කිරීමේ වියදම් සම්බන්ධයෙන් රජය විසින් 2019 වර්ෂයේ දී අනුගමනය කරන ලද දැඩි ප්‍රතිපත්ති හේතුවෙන් ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. ට ව්‍යාපෘතිය අඛණ්ඩව කරගෙන යාමට නොහැකි විය. එම කාර්යයන් ක්‍රියාත්මක කිරීමට ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. ට බෙහෙවින් අවශ්‍ය වුවද, ලංසු ඇගැයීමේ අවස්ථාවේදී එවකට ක්‍රියාත්මක වූ රජයේ එවැනි සීමා කිරීම් හේතුවෙන් කාර්යාල පරිශ්‍රයේ සැලසුම් සහ අභ්‍යන්තර කටයුතු 2019 වර්ෂයේ දී තාවකාලිකව නවතා දමන ලදී. නැවත වරක් 2021 වර්ෂයේ දී ඉහත සීමාවන් හේතුවෙන් මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීමට නොහැකි විය. කෙසේ වුවද, ගිවිසුමට අනුව, ඉටු කරන ලද කාර්යයේ ප්‍රමාණය අනුව උපදේශන ගාස්තු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) වෙත ගෙවන ලදී.<br>රාජ්‍ය ව්‍යවසායන්හි වියදම් කළමනාකරණය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව (PED) මගින් 2024 පෙබරවාරි 28 දින නිකුත් කරන ලද අංක 1/2024 දරන චක්‍රලේඛයට අනුව, මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සඳහා කිසිදු සීමාවක් නොතිබුණද, . 2024 වර්ෂය සඳහා ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම.යේ  අයවැය වෙන් කිරීම්වල පැවති අපහසුතා හේතුවෙන් ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. ට නැවත වැඩ කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය. |

# 2022 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවේ සඳහන් කර ඇති නිරීක්ෂණ පිළිබඳ වත්මන් තත්ත්වය

| | |
|---|---|
| | කෙසේ වුවද, කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේදී, එම ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි වුවහොත් බඳවා ගැනීමට සැලසුම් කර ඇති සියලුම කාර්ය මණ්ඩලය සාමාජිකයන් සඳහා ඉඩකඩ පහසුකම් සැපයීම ගැටලුවක් වන බැවින්, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් 2025 අයවැය ඇස්තමේන්තුව තුළ කාර්යාල පරිශ්‍රයේ සැලසුම් සහ අභ්‍යන්තර කටයුතු සඳහා අරමුදල් ඉල්ලා තිබුණි.<br>තවද, කාර්යාල පරිශ්‍රය සඳහා සැලසුම් සහ අභ්‍යන්තර කටයුතු නැවත ආරම්භ කිරීමේදී, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) උපදේශකයින් ලෙස අඛණ්ඩව කටයුතු කරනු ලබන අතර, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) විසින් ව්‍යාපෘතියේ නඩත්තු අදියර අවසන් වන තුරු ව්‍යාපෘතිය සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) විසින් කටයුතු කර ඇති බැවින්, ඔවුන් විසින් මේ දක්වා කරන ලද කාර්යයන් ව්‍යාපෘතිය සඳහා උපයෝගී කර ගනු ඇත. |
| 2.3 වෙනත් කරුණු | |
| මානව සම්පත් කළමනාකරණය | |
| 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දක්වා ඇති පරිදි විය. | |

| සේවක කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | 2023.12.31 දිනට තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 23 | 5 | 18 |
| තෘතීයක | 4 | 2 | 2 |
| ද්විතියික | 2 | 2 | 0 |
| ප්‍රාථමික | 4 | 1 | 3 |
| | 33 | 10 | 23 |

| | |
|---|---|
| (i) 2023 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ පුරප්පාඩු 23 ක් නිරීක්ෂණය කරන ලදී. එයින් පුරප්පාඩු 20 ක් මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් බලපෑමක් සිදු කළ හැකි විධායක මට්ටමේ පුරප්පාඩු විය. පුරප්පාඩු වශයෙන් පැවති තනතුරු 20 අතරින්, නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර මණ්ඩලය ආරම්භයේ සිටම පුරප්පාඩුව පැවතුණි. නියෝජ්‍ය අධ්‍යක්ෂ අධීක්ෂණ සහ සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ තනතුරු 6 ක් සඳහා ස්ථිර පදනම මත බඳවාගැනීම් සිදු කර නොතිබුණි. | කාර්ය මණ්ඩල අර්බුදයේ බරපතලකම සැලකිල්ලට ගනිමින්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව (PED) විසින් 2023 අගෝස්තු 11 දිනැති ලිපිය මගින් 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 සමඟ නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව (PED) විසින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතෙහි ඇමුණුම ඒ හි ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. ඇතුළත් කිරීමට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා දී ඇති බව දැනුම් දී තිබුණි. ඒ අනුව, මෙහෙයුම් අත්පොතෙහි 3.2 වගන්තියට අනුව, මානව සම්පත් පිළිබඳ පරිච්ඡේදයේ විධිවිධානවලින් නිදහස් කර ඇති එම රාජ්‍ය ව්‍යවසායවල මණ්ඩලවලට ව්‍යාපාර තිරසාරභාවය සහ කර්මාන්ත ප්‍රමිතීන් සැලකිල්ලට ගනිමින් නියමිත ක්‍රියාවලියක් අනුගමනය කර සේවක සංඛ්‍යාවේ ප්‍රමාණය, බඳවා ගැනීමේ පටිපාටිය (SoR) සහ වැටුප් ව්‍යුහයන් ඇතුළත්ව මානව සම්පත් කළමනාකරණයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් සුදුසු පරිදි තීරණය කළ හැකිය.<br><br>ඒ අනුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් එම ලිපියෙන් ලබා දී ඇති උපදෙස්වලට අනුකූලව, නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ දැනට සිටින කාර්ය මණ්ඩලය රඳවා ගැනීමේ අරමුණින් ගනු ලබන මූලික පියවරක් වශයෙන්, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද 2021 වර්ෂයේ වැටුප් ව්‍යුහය 2023 සැප්තැම්බර් 1 වන දින සිට ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය තීරණය කරන ලදී.<br><br>2021 වර්ෂයේ සංශෝධිත වැටුප් ව්‍යුහය 2023 වර්ෂයේ දී අනුගමනය කළද, 2023 වර්ෂයේ අවස්ථා කිහිපයකදී සහ ඉන් පසුව පුරප්පාඩු ප්‍රචාරණය කිරීමෙන් පසුව පවා සුදුසු අයදුම්කරුවන් බඳවා ගැනීමට ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. ට නොහැකි විය.<br><br>එබැවින්, අවශ්‍ය පරිදි සමාලෝචන ආවරණය වැඩි දියුණු කිරීම සඳහා නව කාර්ය |

# 2022 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවේ සඳහන් කර ඇති නිරීක්ෂණ පිළිබඳ වත්මන් තත්ත්වය

| | |
|---|---|
| | මණ්ඩලයක් බඳවා ගැනීමේ අවශ්‍යතාවය හේතුවෙන්, අධ්‍යක්ෂ අධීක්ෂණ සහ සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ යන තනතුරු දෙකම සඳහා අවශ්‍ය වන පළපුරුද්දට අදාළ වර්ෂ සංඛ්‍යාව පහත පරිදි අඩු කිරීමට මණ්ඩලය තීරණය කරන ලදී.<br><br>■ අධ්‍යක්ෂ අධීක්ෂණ: වසර 10ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දේ සිට වසර 8 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද දක්වා.<br><br>■ සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී විභාගවලදී උසස් ව්‍යාපාර වාර්තාකරණය (ABR) සමත් වූ අවසන් වසරේ සිසුන් ඇතුළත් කිරීම<br><br>ඉහත සංශෝධනය සිදු කිරීමෙන් පසුව, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් 2024 මාර්තු මාසයේදී අධ්‍යක්ෂ අධීක්ෂණ තනතුර සඳහා එක් නිලධාරියකු බඳවා ගන්නා ලද අතර 2024 අප්‍රේල් මාසයේදී සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ - 2 ශ්‍රේණිය තනතුර සඳහා නිලධාරීන් තිදෙනෙකු බඳවා ගන්නා ලදී. තවද, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. හි වසර 10කට අධික කාලයක් අධ්‍යක්ෂ අධීක්ෂණ තනතුරේ සේවය කළ එක් නිලධාරියෙකු 2024 මැයි මාසයේදී ඉල්ලා අස්විය. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සහ විගණන පරීක්ෂණ වැනි එහි මූලික ක්‍රියාකාරකම්වල ක්‍රියාකාරිත්වයට දැඩි ලෙස බලපාන සම්පත් සීමාවීම්වලට අඛණ්ඩව මුහුණ පෑමට ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. ට සිදු වේ.<br><br>වර්තමානයේදී, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචන සිදු කිරීමට අවශ්‍ය සම්පත් වැඩි කිරීමේ මාර්ග පිළිබඳව අඛණ්ඩව ගවේෂණය කරමින් සිටින අතර, සේවක අර්ධ කාලීන සමාලෝචකයින් සේවයේ නිරත කරවීමට ද, දුරස්ථ වැඩ විධිවිධාන සකස් කිරීමට ද, ඒ අතරම සේවකයින් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා තබා ගැනීමට උපාය මාර්ග සකස් කිරීම ද සිදු කරයි.<br><br>තවද, අධ්‍යක්ෂ අධීක්ෂණ සහ සහකාර අධ්‍යක්ෂ අධීක්ෂණ තනතුරුවල සියලුම පුරප්පාඩු පිරවීමෙන් අනතුරුව සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර සඳහා බඳවා ගැනීමේ කටයුතු ඉදිරියට කරගෙන යාමට ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. අදහස් කරයි. |
| (ii) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය, පරිපාලන සහ තොරතුරු තාක්ෂණ අංශ ප්‍රධානී තනතුරුද පුරප්පාඩු වී තිබුණි. | මූල්‍ය හා පරිපාලන (ADFA) තනතුරු සහ තොරතුරු තාක්ෂණ පරිපාලක තනතුරු අනුපිළිවෙලින් 2023 ජූලි සහ 2023 අප්‍රේල් මාසයේ සිට පුරප්පාඩු වී ඇත.<br><br>සහකාර අධ්‍යක්ෂ මූල්‍ය හා පරිපාලන (ADFA) තනතුර ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. හි ප්‍රධාන තනතුරක් වන බැවින්, එහි පුරප්පාඩුව ඇති වීමෙන් අනතුරුව, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් පහත සඳහන් පරිදි පුරප්පාඩුව පිරවීමට පියවර කිහිපයක් ගන්නා ලදී.<br>■ පුවත්පත් සහ ඉහළ මට්ටමේ රැකියා දැන්වීම් පළ කරනු ලබන ද්වාරවල පුරප්පාඩු දැන්වීම් පළ කිරීම.<br><br>■ ද්විතීයනය කිරීමේ පදනම මත මුදල් අමාත්‍යාංශයෙන් අනුයුක්ත කිරීමේ හැකියාව සොයා බලන ලදී.<br><br>■ බාහිර සමාගමක් වෙතින් මෙම කාර්යභාරය බැහැරින් ඉටු කරවා ගැනීම සම්බන්ධයෙන් සලකා බලන ලදී.<br><br>මෙම ප්‍රයත්නයන් මධ්‍යයේ වුවද, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. ට 2023 වර්ෂයේ දී සුදුසු අපේක්ෂකයෙකු බඳවා ගැනීමට නොහැකි වූ අතර අලුතින් බඳවා ගත් නිලධාරියෙක් පත්වීම ලබා දින තුනක් ඇතුළත ඉල්ලා අස්විය.<br><br>ඉන් අනතුරුව, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් පුරප්පාඩු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ දැන්වීමක් ප්‍රකාශයට පත් කළ අතර එමඟින් සුදුසු අපේක්ෂකයෙකු තෝරා ගත හැකි වූ අතර එම නිලධාරියා 2024 ජූලි 29 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩ භාර ගන්නා ලදී. |

# 2022 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවේ සඳහන් කර ඇති නිරීක්ෂණ පිළිබඳ වත්මන් තත්ත්වය

| | |
|---|---|
| | තොරතුරු තාක්ෂණ පරිපාලක තනතුරට අදාළව, MIS පද්ධතියේ කටයුතු අවසන් වෙමින් පවතින බැවින්, සේවාවල හදිසි අවශ්‍යතාවය මත පදනම්ව, ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. විසින් 2023 නොවැම්බර් මාසයේ සිට තාවකාලිකව බාහිර උපදේශන සමාගමක් වෙතින් තොරතුරු තාක්ෂණ කටයුතු බැහැරින් ඉටු කරවා ගැනීමට කටයුතු කර ඇත. මෙම තනතුරු පුරප්පාඩුව පිරවීමේ දුෂ්කරතාව හේතුවෙන් සහ තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවේ නිර්දේශ මත පදනම්ව, කොන්ත්‍රාත් පදනම මත වැඩි වැටුපක් ලබා දෙමින් තොරතුරු තාක්ෂණ පරිපාලකයෙකු (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරියෙකු යන තනතුරු නාමයෙන්) බඳවා ගැනීම මණ්ඩලය විසින් අනුමත කරන ලදී. ආකර්ෂණීය වැටුපක් නියම කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, 2024 අප්‍රේල් මස සිට බලපැවැත්වෙන පරිදි සුදුසුකම් ලත් ICT නිලධාරියෙකු බඳවා ගැනීමට ශ්‍රී.ලං.ගි.වි.ප්‍ර.ස.ම. ට හැකි විය. |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන | 2023 දෙසැම්බර් 31 දිනට රු. | 2022 දෙසැම්බර් 31 දිනට රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 3 | **25,781,785** | 29,969,068 |
| අස්පෘශ්‍ය වත්කම් | 4 | **33,718,500** | 20,158,000 |
| තැන්පතු | 5 | **6,979,736** | 6,979,736 |
| නිශ්චිත ප්‍රතිලාභ වත්කම් | 10 | **6,333,836** | 8,893,601 |
| | | **72,813,857** | 66,000,405 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 6 | **728,079** | 806,108 |
| ලැබිය යුතු ගිණුම් | 7 | **3,136,467** | 3,075,783 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 8 | **3,327,422** | 3,265,940 |
| | | **7,191,968** | 7,147,831 |
| **මුළු වත්කම්** | | **80,005,825** | 73,148,236 |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්භිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන | 9 | **72,813,857** | 66,000,405 |
| | | **72,813,857** | 66,000,405 |
| **ජංගම වගකීම්** | | | |
| විලම්භිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන | 11 | **5,318,539** | 3,076,338 |
| ගෙවිය යුතු ගිණුම් | 12 | **1,873,429** | 4,071,493 |
| | | **7,191,968** | 7,147,831 |
| **මුළු වගකීම්** | | **80,005,825** | 73,148,236 |

48 වන පිටුවේ සිට 54 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනීත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ වගකීමක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඒ වෙනුවෙන් අත්සන් කරන ලද්දේ

සභාපති

සාමාජික

අධ්‍යක්ෂ ජනරාල්

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය හා පරිපාලන)

2024 පෙබරවාරි 12

# මූල්‍ය කාර්යසාධනය හා අනෙකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| රාජ්‍ය ප්‍රදාන | 13 | **73,544,975** | 81,015,260 |
| අඩුකලා: ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට නිදහස් කළ ප්‍රදාන | | **2,000,000** | 4,000,000 |
| | | **71,544,975** | 77,015,260 |
| **මෙහෙයුම් වියදම්** | | | |
| මණ්ඩලයේ සාමාජිකයන්ගේ දීමනා | | **(1,690,300)** | (1,031,732) |
| විගණකවරුන්ගේ පාරිශ්‍රමික | 14 | **(353,030)** | (151,700) |
| කාර්ය මණ්ඩල පිරිවැය | 15 | **(35,050,482)** | (39,456,582) |
| ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය | | **(144,720)** | (183,350) |
| පුවත්පත් නිවේදන | | **(1,281,482)** | (198,134) |
| කුලී හා ගොඩනැගිලි සේවා ගාස්තු | | **(13,963,891)** | (13,450,704) |
| ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම් | 3 | **(5,468,883)** | (5,528,087) |
| විදුලිය | | **(2,006,648)** | (988,018) |
| සමාලෝචකයින් සඳහා වූ වෘත්තීය ගාස්තු | | **(188,000)** | (661,500) |
| අන්තර්ජාතික සාමාජිකත්වයන් | | **(2,467,303)** | (1,797,493) |
| පොත් හා වාර සඟරා | | **(996,410)** | (890,488) |
| පුහුණුව හා සංවර්ධනය | | **(58,992)** | (1,202,492) |
| බලපත්‍ර හා රක්ෂණ | | **(1,120,870)** | (928,494) |
| ලිපිද්‍රව්‍ය | | **(699,324)** | (1,302,366) |
| වෙනත් පරිපාලන වියදම් | 16 | **(6,054,640)** | (9,244,120) |
| - | | **-** | - |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් වූ ලාභය / (පාඩුව) | | **(6,812,305)** | 4,769,117 |
| නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ප්‍රත්‍යාගණනය කිරීමට අදාළ රජයේ ප්‍රදාන | | **6,812,305** | (4,769,117) |
| | | **-** | - |
| **වර්ෂයේ ශුද්ධ අතිරික්තය / (හිඟය)** | | **-** | - |

48 වන පිටුවේ සිට 54 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.

# ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

| | සමුච්චිත අරමුදල (රු) |
|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය | - |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය / (හිඟය) | - |
| 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය | - |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය / (හිඟය) | - |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - |

48 වන පිටුවේ සිට 54 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනිත කොටසකි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය / (හිඟය) | | - | - |
| ගැළපීම්: | | | |
| වර්ෂය තුළ ලද රාජ්‍ය ප්‍රදාන | | 89,412,934 | 82,680,000 |
| මුළු විස්තීර්ණ ආදායම් වලට මාරුකළ විලම්භිත රාජ්‍ය ප්‍රදාන | 13 | (80,357,280) | (76,246,143) |
| ක්ෂය වීම් | 3 | 5,468,883 | 5,528,087 |
| පාරිතෝෂික අරමුදල් ආයෝජනයෙන් ලද පොළිය | | (1,047,684) | (744,113) |
| නිශ්චිත ප්‍රතිලාභ (වත්කම්) (වගකීම්) | 15.1 | 6,509,764 | (4,221,255) |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර වියදමට වඩා ආදායමේ / (ආදායමට වඩා වියදමේ) අතිරික්තය | | 19,986,617 | 6,996,576 |
| තොග අඩුවීම / (වැඩිවීම) | | 78,029 | (31,472) |
| ලැබිය යුතු ගිණුම් අඩුවීම / (වැඩිවීම) | | (60,684) | (609,268) |
| ගෙවිය යුතු ගිණුම් (වැඩිවීම) / අඩුවීම | | (2,198,064) | 681,939 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ | | 17,805,898 | 7,037,775 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම | | (1,281,600) | (646,857) |
| මෘදුකාංග සංවර්ධනය සඳහා කරන ලද ගෙවීම් | | (13,560,500) | (15,072,000) |
| පාරිතෝෂික අරමුදලේ ආයෝජනය | | (3,950,000) | (2,250,000) |
| පාරිතෝෂික අරමුදල් / ආරක්ෂිත සේප්පුව සම්බන්ධ ආයෝජනවලින් ලද පොළිය | | 1,047,684 | 744,113 |
| ශුද්ධ මුදල් ප්‍රවාහ | | 61,482 | (10,186,969) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ** | | - | - |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | | 61,482 | (10,186,969) |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන දෑ | | 3,265,940 | 13,452,909 |
| **වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන දෑ** | 8 | 3,327,422 | 3,265,940 |

48 වන පිටුවේ සිට 54 පිටුව දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි සංකලනීත කොටසකි.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

## 01 ආයතනික තොරතුරු

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2024 පෙබරවාරි 12 වන දින එහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතයක් මගින් නිකුත් කිරීම සඳහා අවසර දෙන ලදී. ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

මණ්ඩලයේ කාර්යය වන්නේ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ විධිවිධාන යටතේ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායවල මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම, ඉදිරිපත් කිරීම සහ විගණනය කිරීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූල වීම සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමයි.

මණ්ඩලය විසින් 2023 දෙසැම්බර් 31 දිනට ස්ථිර සේවකයන් 10 දෙනෙකු සේවයේ යොදවා තිබුණි. (2022 දෙසැම්බර් 31 දිනට ස්ථිර සේවකයන් 13 දෙනෙකු, කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 2 දෙනෙකු සහ 1 තාවකාලික සේවකයකු සේවයේ යොදවා තිබුණි.)

## 02 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### පිළියෙළ කිරීමේ පදනම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ පිළියෙළ කර ඇත.

මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම මත සකස්කර ඇති අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති කාලසීමාව පුරාවට අඛණ්ඩව යොදාගෙන ඇත.

### වාර්තා කිරීමේ දිනට පසු සිදුවීම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට පසුව සිදුවන සියලුම වැදගත් සිදුවීම් සලකා බලනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැළපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

### දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂයකිරීම් අඩු කර පිරිවැයට දක්වනු ලැබේ. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාලය පුරා සරල මාර්ග පදනම මත පහත දක්වා ඇති පරිදි ක්ෂය කිරීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වනු ලැබේ.

| වත්කම | ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාලය |
|---|---|
| මෝටර් වාහන | අවුරුදු 15 යි |
| කාර්යාල උපකරණ | අවුරුදු 4-25 |
| ගෘහභාණ්ඩ, සවිකෘත සහ උපාංග | අවුරුදු 6-25 |
| පොත් හා ප්‍රකාශන | අවුරුදු 3 යි |

භාවිතා කරන කාලසීමාව මත පදනම්ව මිලදී ගත් වර්ෂයේ සහ විකුණුම් වර්ෂයේ ක්ෂයකිරීම් සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ. මිලදී ගත් මාසයේ සම්පූර්ණ ක්ෂයකිරීම් සඳහා ප්‍රතිපාදන සලසනු ලබන අතර විකුණුම් මාසයේ කිසිදු ක්ෂයකිරීමක් සඳහා ප්‍රතිපාදන සලසනු නොලැබේ.

පිරිවැය රු.25,000/- නොඉක්මවන මුදලකට මිල දී ගත් පොත් සහ ප්‍රකාශන හැර අනෙකුත් අයිතම, සියලුම ගිණුම් ප්‍රමිති සහ විගණන ප්‍රමිති සහ පිරිවැය රු.10,000/- නොඉක්මවන අනෙකුත් ප්‍රකාශන මිල දී ගත් වර්ෂයේ වියදම් ලෙස දක්වනු ලැබේ.

### අස්පෘශ්‍ය වත්කම්

ආයතනයට අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමට හැකි නම් සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති SLPSAS 20 අස්පෘශ්‍ය වත්කම්වලට අනුකූලව වත්කම්වල පිරිවැය විශ්වසනීයව මැනිය හැකි වේ නම් අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලැබේ. සීමිත ප්‍රයෝජනවත් ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ පාඩු අඩු කර පිරිවැයට මනිනු ලැබේ.

### තොග

තොග පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් අතරින් අඩු වටිනාකමට තක්සේරු කරනු ලැබේ. භාණ්ඩ ලේඛනවල පිරිවැය පළමු ගැනුම්, පළමු නිකුතු (FIFO) පදනම භාවිතා කිරීමෙන් මනිනු ලැබේ.

### ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් උපලබ්ධි වීමට ඇස්තමේන්තු කර ඇති මුදල් ප්‍රමාණයට දක්වා ඇති අතර අවශ්‍ය අවස්ථාවල දී බොල් සහ අඩමාණ ණය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

### මුදල් සහ මුදල් හා සමාන දෑ

අතැති මුදල් සහ බැංකුවල ඇති මුදල් සහ කෙටි කාලීන තැන්පතු පිරිවැයට ගණනය කරනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් සහ මුදල් සමාන දෑ අතැති මුදල් සහ බැංකු තැන්පතු, හිඟහිටි බැංකු අයිරාවල ශුද්ධ වටිනාකමින් සමන්විත වේ.

### ගෙවිය යුතු ගිණුම්

ගෙවිය යුතු ගිණුම් සඳහා වන වගකීම් ගෙවීමට අපේක්ෂිත මුදල් හා මුදල් සමාන දෑ ප්‍රමාණය අනුව ගණනය කෙරේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

## 02 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### නිශ්චිත ප්‍රතිලාභ පිරිවැය

1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීමේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාමික පාරිතෝෂික සඳහා වන නිශ්චිත ප්‍රතිලාභ බැඳීම, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති අතර, නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම නියෝජනය කරයි. මූල්‍ය කාර්ය සාධන හා අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ සියලුම ආයුගණක ලාභ සහ අලාභ වහාම හඳුනා ගැනේ.

### රාජ්‍ය ප්‍රදාන

ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රදාන අදාළ වියදම් හඳුනාගෙන ඇති කාලසීමාව තුළ ආදායම ලෙස හඳුනා ගැනේ.

පසුකාලීනව වියදම් කරනු ලබන වත්කම් අත්පත් කර ගැනීම සඳහා භාවිත කරන රජයේ ප්‍රදාන විලම්භිත ආදායමක් ලෙස හඳුනාගැනේ. මුදල් සහ මුදල් සමාන දෑ ඇතුළු අනෙකුත් වත්කම්වලින් වගකීම් අඩු කර නියෝජනය වන රජයේ ප්‍රදාන (ලැබෙන ප්‍රදාන නිසා ඇතිවන වගකීම් හැර) වගකීම් ලෙස හඳුනා ගැනේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

## 3. දේපළ, පිරියත සහ උපකරණ

| | මෝටර් වාහන | | කාර්යාල උපකරණ | | ලී බඩු, හා සවිකිරීම් | | පුස්තකාල පොත් | | කෙරීගෙන යන වැඩ | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **දිනට** | **31-දෙසැ-23 රු.** | **31-දෙසැ-22 රු.** | **31-දෙසැ-23 රු.** | **31-දෙසැ-22 රු.** | **31-දෙසැ-23 රු.** | **31-දෙසැ-22 රු.** | **31-දෙසැ-23 රු.** | **31-දෙසැ-22 රු.** | **31-දෙසැ-23 රු.** | **31-දෙසැ-22 රු.** | **31-දෙසැ-23 රු.** | **31-දෙසැ-22 රු.** |
| **පිරිවැය** | | | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | **51,160,000** | 51,160,000 | **12,887,043** | 12,252,537 | **12,710,538** | 12,402,537 | **3,224,599** | 3,223,399 | **1,641,054** | 1,937,904 | **81,623,234** | 80,976,377 |
| එකතු කිරීම් | **-** | - | **1,281,600** | 337,657 | **-** | 308,000 | **-** | 1,200 | **-** | - | **1,281,600** | 646,857 |
| ඉවත් කිරීම් | **-** | - | **-** | - | **-** | - | **-** | - | **-** | - | | |
| මාරු කිරීම් | **-** | - | **-** | 296,850 | **-** | - | **-** | - | **-** | (296,850) | | |
| වර්ෂය අවසානයේ ශේෂය | **51,160,000** | 51,160,000 | **14,168,643** | 12,887,044 | **12,710,538** | 12,710,537 | **3,224,599** | 3,224,599 | **1,641,054** | 1,641,054 | **82,904,834** | 81,623,234 |
| **සමුච්චිත ක්ෂය** | | | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | **28,100,000** | 24,689,333 | **9,691,736** | 8,396,025 | **10,648,367** | 9,835,157 | **3,214,063** | 3,205,564 | **-** | - | **51,654,166** | 46,126,079 |
| වර්ෂය සඳහා ක්ෂයකිරීම් | **3,410,667** | 3,410,667 | **1,236,289** | 1,295,711 | **813,195** | 813,210 | **8,732** | 8,499 | **-** | - | **5,468,883** | 5,528,087 |
| ඉවත් කිරීම් මත ක්ෂය | **-** | - | **-** | - | **-** | - | **-** | - | **-** | - | | |
| මාරු කිරීම් | | | | | | | | | | | | |
| වර්ෂය අවසාන ශේෂය | **31,510,667** | 28,100,000 | **10,928,025** | 9,691,736 | **11,461,562** | 10,648,367 | **3,222,795** | 3,214,063 | **-** | - | **57,123,049** | 51,654,166 |
| වර්ෂය අවසානයේ ලියා අඩු කළ අගය | **19,649,333** | 23,060,000 | **3,240,618** | 3,195,308 | **1,248,976** | 2,062,170 | **1,804** | 10,536 | **1,641,054** | 1,641,054 | **25,781,785** | 29,969,068 |

කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවලට 2019 සහ 2021 කාලය තුළ කාර්යාල අවකාශයට අදාළව සිදු කරන ලද අභ්‍යන්තර ඉදිකිරීම් කටයුතු සඳහා උපදේශක වෙත ගෙවන ලද ගාස්තු ඇතුළත් වේ. රජයේ ප්‍රාග්ධන වියදම් කපා හැරීම හේතුවෙන් එම ව්‍යාපෘතිය කල් දමා ඇති අතර එය 2024 වර්ෂයේ දී නැවත ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

| | දිනට | 2023 දෙසැ 31 රු. | 2022 දෙසැ 31 රු. |
|---|---|---|---|
| 4 | **අස්පෘශ්‍ය වත්කම්** (මෘදුකාංග - කෙරීගෙන යන වැඩ) | | |
| | වර්ෂ ආරම්භයේ ශේෂය | 20,158,000 | 5,086,000 |
| | වර්ෂය තුළ ගෙවීම් | 13,560,500 | 15,072,000 |
| | වර්ෂ අවසානයේ ශේෂය | 33,718,500 | 20,158,000 |
| 5 | **තැන්පතු (ජංගම නොවන)** | | |
| | කුලී තැන්පතු | 6,879,736 | 6,879,736 |
| | ආරක්ෂක සේප්පු තැන්පතු | 100,000 | 100,000 |
| | | 6,979,736 | 6,979,736 |
| 6 | **තොග** | | |
| | ලිපිද්‍රව්‍ය | 728,079 | 806,108 |
| 7 | **ලැබිය යුතු ගිණුම්** | | |
| | ඉදිරියට කළ ගෙවීම් | 3,131,467 | 3.070,783 |
| | තැන්පතු | 5,000 | 5,000 |
| | | 3,136,467 | 3.075,783 |
| 8 | **මුදල් සහ මුදල් හා සමාන දෑ** | | |
| | අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | 3,327,422 | 3,265,940 |
| | | 3,327,422 | 3,265,940 |
| 9 | **විලම්භිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන (ජංගම නොවන)** | | |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | 66,000,405 | 49,338,380 |
| | ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම සඳහා ලැබුණු හා භාවිත කළ ප්‍රදාන | 14,842,100 | 15,718,857 |
| | ලැබුණු ප්‍රදාන සහ පාරිතෝෂික අරමුදලෙහි ආයෝජනය කළ ප්‍රදාන | 3,950,000 | 2,250,000 |
| | වර්ෂය සඳහා ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය වියදම් | (5,468,883) | (5,528,087) |
| | පාරිතෝෂික අරමුදලෙන් ලැබුණු පොළිය | 1,047,684 | 744,113 |
| | වර්ෂය සඳහා නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ගාස්තුව | (7,557,449) | 3,477,142 |
| | වර්ෂය අවසානයේ ශේෂය | 72,813,857 | 66,000,405 |
| | නියෝජනය වන්නේ: | | |
| | දේපළ, පිරියත සහ උපකරණ | 25,781,785 | 29,969,068 |
| | අස්පෘශ්‍ය වත්කම් | 33,718,500 | 20,158,000 |
| | තැන්පතු (ජංගම නොවන) | 6,979,736 | 6,979,736 |
| | පාරිතෝෂික අරමුදලේ අතිරික්තය | 6,333,836 | 8,893,601 |
| | වර්ෂය අවසානයේ ශේෂය | 72,813,858 | 66,000,405 |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

| දිනට | | 2023 දෙසැ 31 රු. | 2022 දෙසැ 31 රු. |
|---|---|---|---|
| 10 | **නිශ්චිත ප්‍රතිලාභ (වත්කම්) / වගකීම්** | | |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | 2,580,610 | 6,874,244 |
| | වර්ෂය සඳහා ප්‍රතිපාදන | 459,937 | 179,380 |
| | වර්ෂය තුළ ලැබුණු පොළිය | 285,206 | 1,112,595 |
| | ආයුගණක (ලාභ) / පාඩු | 6,812.305 | (4,769,117) |
| | | 10,138,059 | 3,397,102 |
| | වර්ෂය තුළ ගෙවීම් | (2.051,255) | (816,492) |
| | | 8,086,804 | 2,580,610 |
| | පාර්තෝෂික අරමුදල (සටහන් 10.1) | (14,420,640) | (11,474,211) |
| | වර්ෂය අවසානයේ ශේෂය | (6,333,836) | (8,893,601) |
| | ප්‍රතිපාදනයේ වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී පහත සඳහන් උපකල්පන භාවිතා කර ඇත | | |
| | අපේක්ෂිත වැටුප් වැඩිවීම | 2% | 2% |
| | වට්ටම් / පොළී අනුපාතය | 13.5% | 18% |
| | පිරිවැටුම් අනුපාතය | 9% | 9% |
| | පාර්තෝෂික සඳහා වගකීම ආංශිකව බාහිර අරමුදල් මගින් සම්පාදනය කර ඇත | | |
| 10.1 | **පාර්තෝෂික අරමුදල** | | |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | 11,474,211 | 9,296,590 |
| | වර්ෂය තුළ සිදු කරන ලද ආයෝජන | 3,950,000 | 2,250,000 |
| | වර්ෂය තුළ ලැබුණු පොළිය | 1,047,684 | 744,113 |
| | වර්ෂය තුළ කරන ලද ගෙවීම් | (2,051,255) | (816,492) |
| | වර්ෂය අවසානයේ ශේෂය | 14,420,640 | 11,474,211 |
| 11 | **විලම්භිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන (ජංගම)** | | |
| | වර්ෂය ආරම්භයේ ශේෂය | 3,076,338 | 13,304,506 |
| | තොග සහ ලැබිය යුතු ගිණුම්වල වැඩිවීම් / (අඩුවීම්) | (17,345) | 640,739 |
| | මුදල් සහ මුදල් හා සමාන දෑ වල වැඩිවීම් / (අඩුවීම්) | 61,482 | (10,186,969) |
| | ගෙවිය යුතු ගිණුම්වල (වැඩිවීම) / අඩුවීම් | 2,198,064 | (681,938) |
| | වර්ෂය අවසානයේ ශේෂය | 5,318,539 | 3,076,338 |
| | නියෝජනය වන්නේ: | | |
| | තොග | 728,079 | 806,108 |
| | ලැබිය යුතු ගිණුම් | 3,136,467 | 3,075,783 |
| | මුදල් සහ මුදල් හා සමාන දෑ | 3,327,422 | 3,265,940 |
| | අඩු කළා: ගෙවිය යුතු ගිණුම් | (1,873,429) | (4,071,493) |
| | වර්ෂය අවසානයේ ශේෂය | 5,318,539 | 3,076,338 |
| 12 | **ගෙවිය යුතු ගිණුම්** | | |
| | විගණකවරුන්ගේ පාරිශ්‍රමික | 300,000 | 214,000 |
| | ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට ගෙවිය යුතු ප්‍රදාන | - | 1,000,000 |
| | සමාලෝචකයින් සඳහා ගෙවිය යුතු වෘත්තීය ගාස්තු | - | 80,000 |
| | ගෙවිය යුතු කාර්ය මණ්ඩල දිරි දීමනා | 34,667 | 624,000 |
| | උපචිත අභ්‍යන්තර විගණන ගාස්තු | 250,000 | 222,525 |
| | උපචිත වාර්ෂික වාර්තා වියදම් | 400,000 | 1,380,703 |
| | ගෙවිය යුතු උපයෝගිතා වියදම් | 354,537 | 199,677 |
| | ගෙවිය යුතු පිටතින් ලබා ගන්නා ලද සේවා | 105,550 | 161,055 |
| | වෙනත් ගෙවිය යුතු මුදල් | 428,675 | 189,533 |
| | | 1,873,429 | 4,071,493 |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

| | දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **13** | **රාජ්‍ය ප්‍රදාන** | | |
| | වර්ෂය තුළ ලැබුණු රජයේ ප්‍රදාන | **89,412,934** | 82,680,000 |
| | ලැබුණු ප්‍රදාන සහ පාර්තෝෂික අරමුදලේ ආයෝජනය කළ ප්‍රදාන | **(3,950,000)** | (2,250,000) |
| | ප්‍රාග්ධන වියදම් සඳහා භාවිත කළ ප්‍රදාන | **(14,842,100)** | (15,718,857) |
| | ශුද්ධ ජංගම වත්කම් මූල්‍යකරණය සඳහා වැය කළ ප්‍රදාන | **(2,242,201)** | 10,228,168 |
| | වර්ෂය සඳහා ක්ෂය වියදම් සහ ක්‍රමක්ෂ වියදම් | **5,468,883** | 5,528,087 |
| | පාර්තෝෂික අරමුදලින් ලැබුණු පොළිය | **(1,047,684)** | (744,113) |
| | වර්ෂය සඳහා නිර්වචිත ප්‍රතිලාභ වගකීම් | **745,143** | 1,291,975 |
| | මූල්‍ය කාර්ය සාධක ප්‍රකාශයේ දැක්වෙන රාජ්‍ය ප්‍රදාන | **73,544,975** | 81,015,260 |
| | මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන ප්‍රදාන වෙනත් විස්තීර්ණ ආදායම් තුල දැක්වෙන නිශ්චිත ප්‍රතිලාභ වගකීම් යලිගණනය කිරීමට අදාළ වූ ප්‍රදාන | **6,812,305** | (4,769,117) |
| | මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇති මුළු විස්තීර්ණ ආදායම් වලට මාරු කරන ලද මුළු ප්‍රදාන | **80,357,280** | 76.246,143 |
| **14** | **විගණකවරුන්ගේ පාරිශ්‍රමික** | | |
| | ප්‍රවර්තන වර්ෂයේ වියදම් | **300,000** | 214,000 |
| | ඉකුත් වර්සයේ (අධි) / ඌන ප්‍රතිපාදන සැලසීම | **53,030** | (62,300) |
| | | **353,030** | 151,700 |
| **15** | **කාර්ය මණ්ඩල පිරිවැය** | | |
| | කාර්ය මණ්ඩල පාරිශ්‍රමික | **23,233,105** | 23,859,170 |
| | සේවක අර්ථසාධක අරමුදල | **2,307,530** | 2,281,697 |
| | සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | **576,883** | 570.424 |
| | නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් (සටහන 15.1) | **(302,541)** | 547,862 |
| | වෙනත් බාහිරින් ලබා ගත් සේවා | **2,066,720** | 1,354,736 |
| | කාර්ය මණ්ඩල දිරි දීමනා | **4,617,167** | 8,180,005 |
| | කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය රක්ෂණය | **750,636** | 488,963 |
| | කාර්ය මණ්ඩල සුබසාධනය | **1,124,294** | 978,692 |
| | වෙනත් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ | **676,688** | 1,195,033 |
| | | **35,050,482** | 39,456,582 |
| **15.1** | **නිශ්චිත ප්‍රතිලාභ වගකීම්** | | |
| | වර්ෂය සඳහා ගාස්තු | **459,937** | 179,380 |
| | වර්ෂය සඳහා ශුද්ධ පොළිය | **(762,478)** | 368,482 |
| | | **(302,541)** | 547,862 |
| | වෙනත් විස්තීර්ණ ආදායම් ලෙස හෙළිදරව් කළ ආයුෂනක ලාභ / අලාභ | **6,812,305** | (4,769,117) |
| | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් කළ නිශ්චිත ප්‍රතිලාභ වගකීම් | **6,509,764** | (4,221,255) |

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

| | දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| 16 | **වෙනත් පරිපාලන වියදම්** | | |
| | පරිගණක නඩත්තු වියදම් | 158,383 | 160,883 |
| | උපකරණ නඩත්තු වියදම් | 850,865 | 657,447 |
| | වාහන නඩත්තු වියදම් | 1,548,125 | 2,299,742 |
| | සන්නිවේදන වියදම් | 1,439,876 | 1,462,275 |
| | වාහන ගාල් කිරීමේ වියදම් | 404,738 | 342,000 |
| | ගෘහ භාණ්ඩ සහ සවි කිරීම් සහ කාර්යාල උපකරණ රක්ෂණය | 159,279 | 140,590 |
| | බැංකු ගාස්තු | 138,454 | 150,584 |
| | ගමන් වියදම් | 138,277 | 58,565 |
| | කාර්යාල වියදම් | 629,154 | 452,468 |
| | වාර්ෂික වාර්තාව | (268,559) | 2,363,027 |
| | නියාමන ප්‍රකාශන | - | 517,669 |
| | නෛතික හා වෘත්තීය ගාස්තු | 359,750 | 175,500 |
| | අභ්‍යන්තර විගණන ගාස්තු | 496,298 | 463,370 |
| | | 6,054,640 | 9,244,120 |

## 17. ප්‍රාග්ධන බැඳීම්

මෘදුකාංග සංවර්ධකයා විසින් කළමනාකරණ තොරතුරු පද්ධති (MIC) යේ සැලසුම සකස් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කරන ලද අතර එය ක්‍රියාත්මක කිරීම 2024 වර්ෂය ආරම්භයේ දී සිදු කිරීමට නියමිතය. 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2.1 ක කොන්ත්‍රාත් මුදලක් ලබා දී තිබුණු අතර සංවර්ධනය කරනු ලබන කළමනාකරණ තොරතුරු පද්ධති (MIC) යේ දත්ත සංක්‍රමණ පිරිවැය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIC) ආශ්‍රිත අනෙකුත් සේවා පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

## 18. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සිදු වී නොතිබුණි.

## 19. අසම්භාව්‍ය වගකීම්

2023 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් නොතිබුණි. (2022 දෙසැම්බර් 31 දිනට - කිසිදු අසම්භාව්‍ය වගකීමක් නොතිබුණි.)

## 20. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල යම් ගැළපීමක් හෝ හෙළිදරව් කිරීමක් සිදු කිරීම අවශ්‍ය වන වැදගත් සිදුවීම් කිසිවක් වාර්තා කළ දිනට පසුව සිදු වී නොතිබුණි.

# කාර්යසාධනයේ දස වසරක සාරාංශය

| | ප්‍රගතිය පිළිබඳ අයිතම | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **ප්‍රධාන/නියාමන ක්‍රියාකාරකම්** | | | | | | | | | | |
| 1 | **හඳුනාගත් නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් සංඛ්‍යාව (කාල පරිච්ඡේදය අවසානයට)** | 1,353 | 1,410 | 1485 | 1559 | 1579 | 1608 | 1657 | 1680 | 1671 | 1707 |
| 2 | **ලැබුණු මූල්‍ය ප්‍රකාශන** | | | | | | | | | | |
| | ප්‍රකාශන සංඛ්‍යාව | 1,371 | 1,430 | 1,536 | 1,643 | 1,567 | 1,635 | 1,232 | 1,830 | 1,738 | 1,732 |
| | නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් සංඛ්‍යාව | 1,289 | 1,345 | 1,412 | 1,479 | 1,457 | 1,521 | 1,194 | 1,517 | 1,564 | 1,566 |
| 3 | **මූල්‍ය ප්‍රකාශන සමාලෝචන** | | | | | | | | | | |
| | සම්පූර්ණ කරන ලද සමාලෝචන සංඛ්‍යාව | 1,200 | 1,122 | 731 | 518 | 638 | 720 | 732 | 552 | 541 | 261 |
| | නිශ්චිත ව්‍යාපාර ව්‍යවසායයන් සංඛ්‍යාව | 1,151 | 1,068 | 678 | 459 | 608 | 699 | 694 | 525 | 534 | 261 |
| 4 | **මූල්‍ය ප්‍රකාශන සමාලෝචනවල සොයා ගැනීම්** | | | | | | | | | | |
| | අනුකූල වූ මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 498 | 553 | 436 | 324 | 430 | 450 | 437 | 312 | 344 | 192 |
| | නිරීක්ෂණ සමඟ අනුකූල වූ මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 697 | 567 | 291 | 185 | 202 | 267 | 293 | 237 | 194 | 66 |
| | අනුකූල නොවූ මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 5 | 2 | 4 | 9 | 6 | 2 | 2 | 3 | 2 | 2 |
| | අනතුරු ඇඟවීම් නිකුත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | - | - | - | - | - | 1 | - | - | 1 | - |
| | නීතිපතිවරයාට යොමු කරන ලද මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | - | - | - | - | - | - | - | - | - | 1 |
| | | 1,200 | 1,122 | 731 | 518 | 638 | 720 | 732 | 552 | 541 | 261 |
| 5 | **විගණන පරීක්ෂණ සොයා ගැනීම්** | | | | | | | | | | |
| | සම්පූර්ණ කරන ලද විධිමත් විගණන පරීක්ෂණ සංඛ්‍යාව | 100 | 91 | 99 | 85 | 31 | 33 | 27 | 34 | 33 | 16 |
| | සම්පූර්ණ කරන ලද තේමාත්මක විගණන පරීක්ෂණ සංඛ්‍යාව | - | - | - | 15 | 19 | 12 | - | - | - | - |
| | ව්‍යාපාර සමාගම් අනුව සම්පූර්ණ කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | - | - | - | - | 2 | - | - | - | - | - |
| | පරීක්ෂණ සම්පූර්ණ කරන ලද විගණන සමාගම් සංඛ්‍යාව | 41 | 29 | 14 | 13 | 10 | 7 | 7 | 17 | 9 | 6 |
| 6 | **විගණන පරීක්ෂණ - විධිමත් පරීක්ෂණවල සොයා ගැනීම්** | | | | | | | | | | |
| | අනුකූල වූ විගණන සංඛ්‍යාව | 32 | 35 | 41 | 40 | 19 | 18 | 23 | 21 | 23 | 13 |
| | නිරීක්ෂණ සමඟ අනුකූල වූ විගණන සංඛ්‍යාව | 68 | 56 | 55 | 42 | 11 | 13 | 3 | 12 | 9 | 3 |
| | අනුකූල නොවූ විගණන සංඛ්‍යාව | - | - | 2 | 2 | - | - | - | - | - | - |
| | අනතුරු ඇඟවීම් නිකුත් කරන ලද විගණන සංඛ්‍යාව | - | - | - | 1 | 1 | 2 | - | 1 | 1 | - |
| | විමර්ශනයට යොමු කරන ලද විගණන සංඛ්‍යාව | - | - | 1 | - | - | - | 1 | - | - | - |
| | | 100 | 91 | 99 | 85 | 31 | 33 | 27 | 34 | 33 | 16 |
| 7 | **අවධානය යොමු කරන ලද මහජන පැමිණිලි සංඛ්‍යාව** | - | - | 1 | 1 | 2 | 2 | 1 | - | - | - |
| 8 | **නිකුත් කරන ලද පැහැදිලි කිරීම් සංඛ්‍යාව** | 1 | 7 | 5 | 6 | 2 | 6 | 4 | 2 | - | 4 |
| | | 1 | 7 | 6 | 7 | 4 | 8 | 5 | 2 | - | 4 |
| | **මෙහෙයුම් කටයුතුවල ක්‍රියාකාරකම්** | | | | | | | | | | |
| 9 | **පැවැත්වූ මණ්ඩල රැස්වීම් සංඛ්‍යාව** | 11 | 8 | 13 | 12 | 12 | 10 | 9 | 14 | 9 | 15 |
| | පැමිණීම 90% -100% | 2 | 4 | 3 | 3 | 1 | 5 | 5 | 4 | 3 | 1 |
| | පැමිණීම 80% -90% | - | 3 | 1 | - | 3 | - | 3 | 3 | 2 | 2 |
| | පැමිණීම 70% -80% | 2 | 1 | 3 | 1 | 1 | 2 | 2 | 2 | 2 | 3 |
| | පැමිණීම 70% කට වඩා අඩු | 5 | 3 | 4 | 7 | 6 | 9 | 3 | 5 | 6 | 7 |
| 10 | **කාර්ය මණ්ඩලයේ දැනුම් වර්ධන ක්‍රියාකාරකම් සංඛ්‍යාව** | 48 | 46 | 13 | 48 | 48 | 41 | 37 | 47 | 33 | 19 |

# කාර්යසාධනයේ දස වසරක සාරාංශය

| | ප්‍රගතිය පිළිබඳ අයිතම | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 11 | ජාත්‍යන්තර සංවිධානවල රැස්වීම් සඳහා පැමිණීම සහ වෙනත් සැසි | 9 | 6 | 19 | 9 | 8 | 8 | - | 4 (virtual) | 2 (virtual) | - |
| 12 | මුළු කාර්ය මණ්ඩලය (කාලපරිච්ඡේදය අවසානයට) | 19 | 20 | 21 | 22 | 21 | 17 | 18 | 17 | 16 | 10 |
| 13 | මුළු තාක්ෂණික කාර්ය මණ්ඩලය (කාලපරිච්ඡේදය අවසානයට) | 14 | 14 | 15 | 15 | 14 | 11 | 11 | 10 | 9 | 5 |
| 14 | මෙහෙයුම් වියදම් රු. 000 වලින් | | | | | | | | | | |
| | - තථ්‍ය | 60,930 | 69,159 | 72,371 | 84,352 | 90,138 | 78,512 | 65,159 | 71,236 | 77,015 | 71,545 |
| | - අයවැයගත | 64,640 | 66,000 | 66,000 | 80,000 | 88,000 | 100,000 | 92,657 | 127,036 | 120,000 | 118,496 |
| | -වැඩිවීම ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී තථ්‍ය පිරිවැයේ % ක් වශයෙන් | 10.5 | 13.5 | 4.6 | 16.6 | 6.9 | -12.9 | -17.0 | 9.3 | 8.1 | -7.1 |
| 15 | කාර්ය මණ්ඩල පිරිවැය රු. 000 වලින් | | | | | | | | | | |
| | - තථ්‍ය | 31,627 | 37,322 | 39,350 | 42,351 | 44,084 | 41,488 | 36,923 | 35,496 | 39,456 | 35,050 |
| | - අයවැයගත | 31,673 | 38,102 | 36,095 | 40,471 | 41,637 | 47,390 | 44,451 | 73,822 | 71,719 | 67,223 |
| | - වැඩිවීම ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී තථ්‍ය පිරිවැයේ % ක් වශයෙන් | 11.2 | 18.0 | 5.4 | 7.6 | 4.1 | -5.9 | -11.0 | -3.9 | 11.2 | -11.2 |
| | - මෙහෙයුම් වියදමේ % වශයෙන් | 51.9 | 54.0 | 54.4 | 50.2 | 48.9 | 52.8 | 56.7 | 49.8 | 51.2 | 49.0 |

# නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්

පනත සහ පනත යටතේ කරනු ලැබූ නියෝග ප්‍රකාර, පහත සඳහන් ආයතන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ලෙස නිර්වචනය කර ඇත.

- බලපත්‍රලාභී බැංකු
- රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යෑම සඳහා බලය පවරන ලද සමාගම්
- කල්බදු ව්‍යාපාර කටයුතුවල නිරත වී සිටින සමාගම්
- ණය නිශ්කාෂණ සමාගම්
- මූල්‍ය සමාගම්
- ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් ලෙස හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් ලෙස ව්‍යාපාර කටයුතු කරගෙන යෑමට බලපත්‍ර ලත් සමාගම්
- ඒකක භාර ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍ර ලත් සමාගම්
- අරමුදල් කළමනාකරණ සමාගම්
- කොටස් හුවමාරුවක් ලෙස ක්‍රියා කිරීමට බලපත්‍ර ලත් සමාගම්
- කොටස් වෙළඳපළේ ලැයිස්තුගත සමාගම්
- වෙනත් සමාගම්
  - (අ) රුපියල් මිලියන 5000ට වැඩි පිරිවැටුමක් සහිත සමාගම්
  - (ආ) පසුගිය මුදල් වර්ෂය අවසානයේ දී කොටස් හිමියන්ගේ ස්කන්ධය රුපියල් මිලියන 1000ට වැඩි සමාගම්
  - (ඇ) පසුගිය මුදල් වර්ෂය අවසානයේ දී මුළු වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 3000ට වැඩි සමාගම්
  - (ඈ) පසුගිය මුදල් වර්ෂය අවසානයේ දී බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවලට රුපියල් මිලියන 1000ට වැඩි බැරකම් ඇති සමාගම්
  - (ඉ) සේවකයින් 1000ට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුතු සමාගම්
- භාණ්ඩ අලෙවියෙහි හෝ සේවා සැලසීමෙහි නියුතු රාජ්‍ය සංස්ථා
- ඉහත සඳහන් කුමන හෝ කාණ්ඩයකට අයත් වන ව්‍යාපාර සමූහයක්. මෙහි දී ව්‍යාපාර සමූහය යන්නෙන් අදහස් වන්නේ සමාගම් පනත යටතේ ගිණුම් ඒකාබද්ධ කළ යුතු එක් පාලක සමාගමක් හා එහි පාලිත සමාගම්ය.

**ආයතනයේ නම**

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

**නෛතික තත්වය**

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත අනුව
සංස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි

**සංස්ථාපිත කරන ලද රට**

ශ්‍රී ලංකාව

**ප්‍රධාන කාර්යාලය**

තෙවන මහල,
293, ගාලු පාර, කොළඹ 03
දුරකථන අංකය: 011 2301210 / ෆැක්ස් අංකය: 011 2301211
විද්‍යුත් තැපෑල - slaasmb@sltnet.lk

**වෙබ් අඩවිය**

www.slaasmb.gov.lk

**විගණකවරුන්**

**ව්‍යවස්ථාපිත විගණකවරුන්**
විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
නො. 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල

**අභ්‍යන්තර විගණකවරුන්**

ඩිලොයිට් රිස්ක් ඇඩ්වයිසරි සර්විසස් (පුද්.) සමාගම
නො. 100, බ්‍රේබෲක් පෙදෙස, කොළඹ 02

**බැංකුකරු**

ලංකා බැංකුව

**නීති උපදේශකවරු**

නීතිපතිතුමා
නීතිපති දෙපාර්තමේන්තුව
කොළඹ 12

**ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය**

3වන මහල, 293, ගාලු පාර, කොළඹ 3, ශ්‍රී ලංකාව.